# ඉතිහාසය

## තුන්වන ශ්‍රේණිය

මූලික පිරිවෙන

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

ප්‍රථම මුද්‍රණය - 2016
දෙවන මුද්‍රණය - 2017
තෙවන මුද්‍රණය - 2018
සිව්වන මුද්‍රණය - 2019
පස්වන මුද්‍රණය - 2020

සියලුම හිමිකම් ඇවිරිණි.

ISBN 978 - 955 - 25 - 0445 - 7

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
නුගේගොඩ, ගංගොඩවිල, උඩහමුල්ල දුම්රියපළ පාර, නො. 44 දරන
ස්ථානයෙහි පිහිටි නියෝ ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදී.

Published by: Educational Publications Department
Printed by: Neo Graphics (Pvt) Ltd

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා

ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා

අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා

පිළිගනු මැන අප භක්ති පූජා

නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා

ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති

ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ

ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ

නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා

ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා

එක මවකගෙ දරු කැල බැවිනා

යමු යමු වී නොපමා

ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දම්නී
රන් මිණි මුතු නොව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

-ආනන්ද සමරකෝන්-

# පෙරවදන

සියවස් ගණනාවක කීර්තිමත් ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදාය වූ කලී සිරිලක අධ්‍යාපනයේ ස්වර්ණමය සලකුණකි. මහින්දාගමනයත් සමඟින් වඩාත් ශිෂ්ට සම්පන්න සංස්කෘතියක් වෙත අප ගමන් කළේ සුවිශේෂ වූ ශාස්ත්‍රීය දියුණුවක් ද අත්පත් කරගනිමිනි. එහිදී භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස වෙතම ප්‍රභාෂ්වර ශාස්ත්‍රාලෝකය දායාද කළ ප්‍රදීපස්තම්භය වූයේ පිරිවෙනයි.

අපේ සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය, ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය වෙනුවෙන් කැපවන සුපසන් යතිපරපුරක් නිර්මාණය කරන අතර සම්භාව්‍ය භාෂා මෙන්ම අනේක ශිල්ප ශාස්ත්‍ර පිරිසිඳ දත් වියතුන් ලොවට දායාද කිරීමෙහිලා මූලික වූ බැව් සිහිපත් කළ යුතු ය. එසේම මෙරට විවිධ උවදුරු පිරි අඳුරු සමයන්හි පිරිහී ගිය පිරිවෙන් අධ්‍යාපනය යළි නඟා සිටුවීමට දිවිහිමියෙන් ඇප කැප වූ, වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමිපාණන්ගේ අපරිමිත සේවාව ද කෘතවේදීත්වයෙන් යුතුව මේ මොහොතේ  සිහිපත් කළ යුතු ය.

අතීත සම්භාවනීය අධ්‍යාපන උරුමය ද එකලෙසින් සුරකිමින් නව ලොවට අනුගත වූ පිරිවෙන් විද්‍යස්ථාන නිර්මාණය කිරීමේ කාර්යය වෙත අපි සැම අවතීර්ණ වී සිටින්නෙමු. විශ්ව ගම්මානයෙහි හුදකලා නොවී වර්තමාන පිරිවෙන් ශිෂ්‍ය ගණයා දැනුම,  කුසලතා හා ආකල්ප වර්ධනය කරගනිමින් අධ්‍යාපන සයුරෙහි කිමිදෙමින් සිටිනු දැකීම සන්තුෂ්ටිය උපදවන්නකි. විවිධ ගැටලු හේතුවෙන් විධිමත් පාසල් පද්ධතියෙන් බැහැර වූ ඇතැම් සිසුන් ද යළි පිරිවෙන් විදුබිම් වෙත පැමිණ ස්වකීය දිවිමඟ යළි එළිය කරගත් අවස්ථා සඳහා නිදසුන් අපමණ බව සඳහන් කළ යුතු ය. සැමට අධ්‍යාපනය ලබාදීමේ උත්කෘෂ්ට කර්තව්‍යය වෙනුවෙන් පිරිවෙන් විද්‍යස්ථාන ද ඇප කැප වී සිටින බවට එය කදිම සාක්ෂ්‍යයකි.

මෙම පොත් මැනවින් පරිශීලනය කරමින් ඒ ඔස්සේ තව තවත් පුළුල් දැනුම් අවකාශ පිරී ඉසව් වෙත පිවිසෙන්නට ද ඔබ සැමට ඇරයුම් කරමි. මනා ඉගෙනුමක් ලැබූ හා ආධ්‍යාත්මික සුවපත් භාවයෙන් පිරිපුන් සුපසන් සිසු පරපුරක් බිහිවනු දැකීම රජයේ ඒකායන අරමුණයි. ඒ සඳහා ඇප කැපවන්නට හැකිවේවායි සියලු දෙනා වෙත ආශීර්වාද කරමි. මේ සත්කාර්යය වෙනුවෙන් නොමසුරු දායකත්වයක් සැපයූ සියලු පිරිවර වෙත ද මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල

**නියාමනය හා අධීක්ෂණය :**

| | |
|---|---|
| පී. එන්. අයිලප්පෙරුම | - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**මෙහෙයවීම :**

| | |
|---|---|
| පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි | - අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ඩබ්ලිව්.ඒ. නිර්මලා පියසීලි | - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**සම්බන්ධීකරණය :-**

| | |
|---|---|
| බී.එම්.ජේ. පුෂ්පකුමාර | - නියෝජ්‍ය කොමසාරිස්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**උපදේශකත්වය :-**

| | |
|---|---|
| ඒ.එච්.එම්.එච්. අබයරත්න | - මහාචාර්ය<br>සමාජීය විද්‍යා පීඨය<br>කැලණිය විශ්වවිද්‍යාලය<br>කැලණිය |

**සංස්කරණය :-**

| | |
|---|---|
| එස්.ඒ.සී. දිසානායක (විශ්‍රාමික) | - නො: 137/ඒ<br>ලක්ෂ්මී පාර<br>ගම්පහ |

**ලේඛක මණ්ඩලය :-**

| | | |
|---|---|---|
| පූජ්‍ය නෙළුවේ නන්ද හිමි | - | පරිවේණාචාර්ය<br>පො/ජයමඟ මහ පිරිවෙණ<br>හිඟුරක්ගොඩ |
| ආර්.එම්. හිශෝෂි රත්නායක | - | පරිවේණාචාර්ය<br>ශ්‍රී ලංකා විද්‍යාලයීය මහ පිරිවෙණ<br>මරදාන |
| ඊ.එම්. සෙනෙවිරත්න බණ්ඩා | - | පරිවේණාචාර්ය (විශ්‍රාමික)<br>වෙස්සගිරිය<br>කු/බුලුවල |
| ජයසේන ගුණවර්ධන | - | සමස්ත ලංකා වෛකල්පික විෂය උපදේශක<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |

**සෝදුපත් කියවීම :-**

| | | |
|---|---|---|
| පූජ්‍ය ඇලදූවේ පඤ්ඤාතිලක හිමි | - | පරිවේණාචාර්ය<br>සුනේත්‍රාදේවි මහ පිරිවෙණ<br>පැපිලියාන |

**පරිගණකගත කිරීම, පිටු නිර්මාණය සහ පිට කවරය :-**

| | | |
|---|---|---|
| ක්‍රිෂ්නි සමුද්ධිකා නාවරත්නගේ | - | පරිගණක අංශය<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

# පටුන


| | | |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකාවේ ඉතිහාසය | 01 - 48 |
| 02 | ශ්‍රී ලංකාවේ පිරිවෙන් ඉතිහාසය | 49 - 63 |
| 03 | ශ්‍රී ලංකාවේ පිරිවෙන්වල නව ප්‍රවනතා | 64 - 74 |
| 04 | ශ්‍රී ලංකාවේ අනන්‍යතාව අගයමු | 75 - 90 |
| 05 | ලෝක ශිෂ්ටාචාරවල ආරම්භය හා වර්ධනය | 91 - 146 |

# 01 ශ්‍රී ලංකාවේ ඉතිහාසය

## 1.1 දේශාභිමානී ජාතික හැඟීම් පුබුදුවාලමු

මෙම පාඩම් ඒකකයෙන්, ඉතිහාසය යනු කුමක් ද? ඉතිහාසය විෂය විග්‍රහ කරගත හැකි නිර්වචන සහ ඉතිහාසය විෂය හැදෑරීමෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ව විස්තර වෙයි.

### ඉතිහාසය යනු කුමක් ද?

ඉතිහාසය යනු මානව ශිෂ්ටාචාරයේ ආරම්භය, විකාශය හා සංවර්ධනය විස්තර වෙන කථා පුවතකි. එය ප්‍රබන්ධ කතාවක් නොවේ. ඈත අතීතයේ සිට මිනිසා පරිසර ගැටලුවලට මුහුණ දුන් ආකාරය ඉතිහාසයෙන් හෙළි වේ. කිසියම් රටක වර්තමානය හා අනාගතය ගොඩනගා ගැනීමට උපකාරී වන්නේ එම රටේ ඉතිහාසයයි. ඉතිහාසයේ සිදු වූ කිසියම් සංසිද්ධියක් වර්තමානයේ දී ඒ ආකාරයෙන් ම සිදු නොවූවත් එය අපට ආදර්ශ කර ගත හැකි ය. ඒ තුළින් වර්තමානය හා අනාගතය සැලසුම් කර ගැනීමට ද හැකි වේ.

යම් රටක ආදි මුතුන් මිත්තන්ගේ ජීවන අත්දැකීම්, ජයග්‍රහණ, අපේක්ෂා, ගති පැවතුම් හා පුද්ගලාන්තර සම්බන්ධතා ආදි තොරතුරු ඉතිහාසයේ වාර්තා වී තිබේ. මෙවැනි තොරතුරු අධ්‍යයනය කිරීම ඉතිහාසය විෂයයෙහි අභිමතාර්ථයකි.

### ඉතිහාසය විෂය විග්‍රහ කර ගැනීමට අදාළ කරගත හැකි නිර්වචන

ඉතිහාසය විෂය සම්බන්ධ ව ඉතිහාසඥයන් හා විචාරකයින් ඉදිරිපත් කර තිබෙන නිර්වචන අතුරින් වඩාත් ජනප්‍රිය නිර්වචන කිහිපයක් පහත දැක්වේ.

| අනු අංක | ඉතිහාසඥයා | ඉදිරිපත් කළ නිර්වචනය | විග්‍රහය |
|---|---|---|---|
| 01 | ජී.එම් ට්‍රෙවිලියන් | ඉතිහාසය එක් විෂයයක් නොව විෂයයන් සියල්ල අන්තර්ගත ගෘහයයි. | සියලු විෂයයන් සමඟ ඉතිහාසය විෂයය ඉතා සමීප සම්බන්ධතාවක් ඇති බව. |
| 02 | E.H. කර් | වර්තමානය තේරුම් ගැනීමට යතුර වශයෙන් ඉතිහාසය තේරුම් ගත යුතු ය. | ඉතිහාසය, අතීතය හා වර්තමානය අතර සංවාදයක් බව |
| 03. | ඩියඩෝරස් | වර්තමානය අරබයා අත්හද බැලීම් කරනවාට වඩා අතීතයේ ජයග්‍රහණ අනුගමනය කරන්නට ලැබීම භාග්‍යයකි. | අතීතයෙන් පාඩම් ඉගෙනීමෙන් වර්තමාන ගැටලුවලට විසඳුම් ලබා ගත හැකි බව. |
| 04. | පොලිබියස් | අතීත සිද්ධීන් පිළිබඳ දැනුම වනාහි මනුෂ්‍ය ස්වභාවය නිවැරදි කිරීම සඳහා ප්‍රබලතම උපකරණය වෙයි. | ඉතිහාසය මිනිසුන් පිළිබඳ කෙරෙන අධ්‍යයනයක් බව. |
| 05. | ශ්‍රී ජවහර්ලාල් නේරු | වර්තමානය හා අනාගතය අනිවාර්යයෙන් ම ඉතිහාසයෙන් ගොඩනැගෙන අතර එම මුද්‍රාව එහි දක්නට ලැබෙනු ඇත. එය අමතක කිරීම අත්තිවාරමක් නොමැතිව කරන ඉදි කිරීමක් වැනි ය. | අතීතය තුළින් වර්තමානය හා අනාගතය හඳුනා ගත හැකි බව. |

ඉහතින් සඳහන් කළ නිර්වචන ඔබ ඉතා හොඳින් අධ්‍යයනය කරන්න. එය ඉතිහාස අධ්‍යයනය කිරීමට ඔබට මඟපෙන්වීමක් වනු ඇත.

## ඉතිහාසය හැදෑරීමේ ප්‍රයෝජන

ඕනෑම රටක භාෂාව, සාහිත්‍ය, සදාචාරාත්මක ගුණ ධර්මයන් හා සෞන්දර්යය වැනි සංස්කෘතිකාංග එම රටේ අතීත ශ්‍රී විභූතිය හා සෞභාග්‍ය විදහා පාන සාධක ය. මෙම සාධක ශ්‍රී ලංකාවේ අතීතයේ පැවති ආකාරය හඳුනා ගැනීමට අප විසින් ඉතිහාස විෂය ඉතා මැනවින් අධ්‍යයනය කළ යුතු ය.

අපේ රටේ අතීතයේ පැවති කෘෂිකාර්මික හා කාර්මික දියුණුව හඳුනා ගෙන වර්තමානයේ එම අංශවල සංවර්ධනයක් ඇතිකර ගැනීමට එයින් පූර්වාදර්ශ ලබා ගැනීම සුදුසු ය.

ශ්‍රී ලාංකිකයන්ට ජාතිකානුරාගය ඇති කරලීමට වඩාත් ම සුදුසු විෂය ඉතිහාසයයි. අතීතයේ දී ශ්‍රී ලංකාව පෙරදිග හා අපරදිග රටවල් සමඟ දේශපාලනික, ආර්ථික, සාමාජික හා ආගමික වශයෙන් ඇති කරගෙන තිබුණු සම්බන්ධතා පිළිබඳ ව නිවැරැදි අවබෝධයක් ලබා ගැනීමට ඉතිහාසය විෂය හැදෑරීම බෙහෙවින් ම ප්‍රයෝජනවත් ය.

ඉතිහාසය හැදෑරීමෙන් පුද්ගල පෞරුෂ ලක්ෂණ සංවර්ධනය වේ. අන් මතවලට ගරු කිරීමට, අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට, බහු සංස්කෘතික සමාජයක ගැටුම්වලින් තොර ව ජීවත් වීමට ශික්ෂණයක් ලැබේ.

ඉතිහාස විෂය හැදෑරීමෙන් පුද්ගලයාගේ විමර්ශනාත්මක, ගවේෂණාත්මක, විවේචනාත්මක හා නිර්මාණාත්මක චින්තනය විකසිත වෙයි. යමක් පැහැදිලි ව සාක්ෂි සහිත ව විස්තර කරලීමේ කුසලතාව ඇති වේ. තර්කානුකූල චින්තනය දියුණු වේ.

කාලය හා අවකාශය පිළිබඳ ව පෘථුල අවබෝධයක් ඇතිකර ගැනීමට හැකි වීම ඉතිහාසය විෂය හැදෑරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජනයකි. ඓතිහාසික කාලවකවානු දක්වෙන්නේ ක්‍රිස්තු පූර්ව, ක්‍රිස්තු වර්ෂ, බුද්ධ වර්ෂ, ශක වර්ෂ වැනි කාල නියමයන්ට අනුව ය. මෙම කාල නියමයන් අප ඉතා මැනවින් හඳුනාගෙන තිබිය යුතු ය.

අවකාශය යනු භෞතික පරිසරයයි. ඓතිහාසික කාලවකවානු හා අවකාශය අතර ඉතා කිට්ටු සම්බන්ධයක් ඇත. මේ රටට ජාතික වීරයන් අවශ්‍ය යුගයක දී මහාවංසය රචනා විය. තත්කාලීන සමාජීය බලපෑම මත දුටුගැමුණු චරිතය මහාවංසයේ දී වීර චරිතයක් ලෙස විස්තර කිරීමට මහානාම මාහිමි ට සිදු විය. සංග්‍රාමීය උපක්‍රමවලට යෝග්‍ය වන පරිදි පොළොන්නරුව ලක්දිව දෙවැනි රාජධානිය ලෙස පිහිටුවා ගෙන තිබේ. යුරෝපීය ජාතිකයන් ශ්‍රී ලංකාවේ කන්ද උඩරට රාජධානිය අල්ලා ගැනීමට සටන් ගණනාවක් ම කළත්, ඒවා කිසිවක් සාර්ථක නොවී ය. එයට හේතුව භූගෝලීය පරිසරයෙන් ස්වභාවික රැකවරණය ලැබුණු නිසා ය. මෙසේ ඓතිහාසික සංසිද්ධීන් නිවැරදි ව හඳුනා ගැනීමට අවකාශය පිළිබඳ දැනුම ඉතිහාසය විෂය හැදෑරීමේ දී ප්‍රයෝජනවත් වේ.

**ඉතිහාසය හැදෑරීමේ ප්‍රයෝජන මෙසේ ගොනු කරමු.**

* අතීතය හඳුනා ගැනීමට
* අතීතයෙන් පාඩම් උගෙනීමට
* වර්තමානය හා අනාගතය සකසා ගැනීමට
* තමා ජීවත් වන අවට පරිසරය හඳුනා ගැනීමට
* ජාත්‍යන්තරයේ ගෞරවණීය ස්ථානයක් ලබා ගැනීමට
* ජාතික සමගිය ගොඩනගා ගැනීමට
* දේශානුරාගය හා ජාතිකාභිමානී හැඟීම් පුබුදුවා ගැනීමට
* අන්‍ය මතවලට ගරු කිරීමට
* අන්‍ය සංස්කෘති අගය කිරීමට
* කාලය හා අවකාශය අධ්‍යයනය කිරීමට
* පෞරුෂ ගති ලක්ෂණ වර්ධනය කර ගැනීමට

ක්‍රියාකාරකම 01

01. ඉතිහාස විෂය හැදෑරීමෙන් ලැබෙන ප්‍රයෝජන යන තේමාව යටතේ ලිපියක් සකස් කරන්න.

සාරාංශය


- ඉතිහාසය අතීතය හා වර්තමානය අතර සංවාදයකි.
- ඉතිහාසය මිනිසුන් සම්බන්ධ අධ්‍යයනයකි.
- ඉතිහාසය පුනරාවර්තනය නොවූවත් අතීත සාධනීය ප්‍රතිඵල වර්තමාන හා අනාගත සැලසුම්වලට පාදක වෙයි.
- ජාතික චින්තනය හා දේශාභිමානී හැඟීම් පුබුදුවාලීමට ඉතිහාස විෂය ඉවහල් වේ.
- බහු සංස්කෘතික සමාජයේ ජීවත් වීමට ඉතිහාස අධ්‍යයනයෙන් ශික්ෂණය ලැබේ.
- විවේචනාත්මක, විමර්ශනාත්මක, නිර්මාණාත්මක හා විශ්ලේෂණාත්මක කුසලතා ඉතිහාසය හැදෑරීමෙන් වැඩි දියුණු වේ.

## 1.2 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධ ව ලේඛනගත මූලාශ්‍රය කිසිවක් නැත. පුරා විද්‍යාත්මක කැණීම්වලින් ලැබුණු සාධකවලට අනුව ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධ ව තොරතුරු හෙළි වේ. අපේ රටේ ලේඛනගත තොරතුරු වාර්තා වන්නේ ක්‍රි.පූ. 6 වන සියවසෙන් පසුව ය.

## ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ස්ථාන

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ජනාවාස පැතිරී තිබුණු ප්‍රදේශ රාශියක් පුරාවිද්‍යාත්මක කැණීම්වලින් හඳුනාගෙන තිබේ.




**දැනට සොයා ගෙන තිබෙන ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික ස්ථානවල ව්‍යාප්තිය දක්වෙන සිතියම**

- රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ආසන්නයේ බටදොඹලෙන
- කෑගල්ල දිස්ත්‍රික්කයේ අත්තනගොඩ පිහිටි අළුලෙන, කිතුල්ගල බෙලිලෙන
- නුවරඑළිය දිස්ත්‍රික්කයේ හෝර්ටන් තැන්න හා රාවණා ඇල්ල
- බලංගොඩ ප්‍රදේශයේ බෙල්ලන්බැඳිපැලැස්ස
- කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ප්‍රදේශයේ පාහියන්ගල ලෙන
- උතුරු ප්‍රදේශයේ මාන්තුලම්, පොම්පරිප්පු, ඉරණමඩුව

ඉහතින් දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ජනාවාස පැතිරී තිබූ ස්ථාන කිහිපයකි. දැනට ශ්‍රී ලංකාවේ හමු වී ඇති පැරණිම මානව සාධක වසර 125000ක් පමණ පැරණි බවට කාලනිර්ණය කර ඇත. ඒ අනුව මෙරට මානව වාසය ඉතාම පැරණි බව පෙනේ.

## කැණීම්වලින් ලැබී ඇති පුරා විද්‍යාත්මක සාධක



**පාහියන්ගල ලෙන ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මිනිසුන්ගේ ජීවිතය පිළිබඳ වැදගත් තොරතුරු අනාවරණය කර තිබේ.**

රත්නපුර ප්‍රදේශයේ කැණීම්වලින් අඩි තිහක් පමණ ගණකමින් යුත් දියළු පස් නිධියක් ඉස්මතු කර ගන්නට හැකි විය. මෙම පස් නිධිය තුළින් දූනට වඳවී ගිය අලි විශේෂයකට අයත් පාෂාණීභූත අස්ථි කොටස් හමු වී තිබේ. එසේම වානර මානවයකුගේ යැයි සිතිය හැකි සත්ත්වයකුගේ දත්, තිරුවානා සහ කහඳ පාෂාණවලින් නිපදවා ඇති ගල් මෙවලම්, අත්පොරෝ, ඇඹරුම් ගල්, දගල්, මෝල්ගස්, වංගෙඩි වැනි උපකරණ ද හමු වී ඇත. උපකරණ සාදා ගැනීම සඳහා වඳුරන්ගේ උල් දත්, වලිකුකුළන්ගේ පාද, පොරකටු වැනි සත්ත්ව අවශේෂ ද යොදා ගත් බව පෙනේ.

බලංගොඩ - බෙල්ලන් බැඳි පැළැස්ස නම් ස්ථානයේ කැණීම්වලින් මිනිස් ඇට කැබලි සොයා ගෙන ඇත. මෙම බලංගොඩ මානවයා ඔස්ට්‍රොලොයිඩ් නම් මානව වර්ගයාට අයත් වූවන් ලෙසින් සැලකිය හැකි බව මානව විද්‍යාඥයෝ පවසති. මෙසේ සොයාගෙන ඇති සත්ත්ව වර්ගයාගේ සාමාන්‍ය වැඩුණු පිරිමියෙක් මීටර 1.74 තරම් උසකින් ද ගැහැණියක් මීටර 1.65 ක් තරම් උසකින් ද යුක්ත වන්නට ඇතැයි පවසේ. බුලත්සිංහල ප්‍රදේශයට යාබද ව පිහිටි පාහියන්ගල ලෙන ආශ්‍රිත ව කළ කැණීම්වලින් හමු වූ මිනිස් ඇටසැකිලි අදින් වසර 31000ක් තරම් පැරණි ලෙස සැලකේ. බටදොඹලෙන ආශ්‍රිත ව කළ කැණීම්වලින් වසර 28000කට පෙර විසූ මිනිසකු ගේ හකු ඇටයක් හමු වී තිබේ. පාහියන්ගල කැණීම්වලින් හමු වූ මිනිස් ඇට සැකිල්ලේ ගුරු ගල් ආලේප කර තිබුණු අතර බණ්ඩාරවෙලට නුදුරු රාවණා ඇල්ල ගුහාවෙන් හමු වූ මිනිස් හිස් කබල දෙකට බෙදා හිල් විද එහි ගුරුගල් ආලේප කර තිබුණි.

## ආදි මානවයාගේ ජීවන රටාව


එකල විසූ මානවයාගේ වාසස්ථාන, ඔවුන්ගේ ආහාරපාන, භාවිත කළ මෙවලම්, අවමංගල්‍ය චාරිත්‍ර විධි වැනි තොරතුරු කැණීම්වලින් ලැබුණු සාධකවලින් හඳුනාගත හැකි ය. එහෙත් ඔවුන්ගේ ජීවන රටාව පිළිබඳ පරිපූර්ණ චිත්‍රයක් ගොඩනඟා ගැනීමට තරම් ප්‍රමාණවත් සාධක ලැබී නැත.

මේ මානවයන් ඉතා සරල ජීවන රටාවකට හුරු පුරුදු වූ දඩයම් කිරීම ප්‍රධාන ජීවනෝපාය ලෙස පවත්වා ගෙන ගිය ප්‍රාථමික මනුෂ්‍ය කණ්ඩායමකි.

ඔවුන්ගේ වාසස්ථාන

සාමාන්‍යයෙන් ආදි මානවයාගේ වාසස්ථාන ලෙස ස්වභාවික ගල් ගුහා භාවිත විය. කිතුල්ගල කැණීම්වලින් කුඩා ලිප් හමු වී තිබේ. මේ ගල් ගුහාවල කුඩා පවුල් එකක් හෝ දෙකක් ජීවත් වන්නට ඇතැයි සැලකේ.

භාවිතයට ගත් මෙවලම්



ආදි මානවයාගේ තාක්ෂණික දැනුම සරල ගල් මෙවලම් නිපදවා ගැනීමට සීමා විය. දෛනික ආහාරපාන සපයා ගැනීමටත්, ආහාර පිළියෙල කර ගැනීමටත් මේ උපකරණ යොදගෙන ඇත. එසේ ම වන සතුන්ගෙන් ආරක්ෂාව ලබා ගැනීමටත්, මේවා භාවිත කළ බව සිතිය හැකි ය. බලංගොඩ මානවයා භාවිත කළ ගල් මෙවලම් කැණීම්වලින් හමු වී ඇත. මේවා ප්‍රමාණයෙන් සෙ.මී. 2ක්, සෙ.මී. 4.5 ක් තරම් ය. තිරුවානා ගල්වලින් සාදගත් පොරොව, ඇඹරුම් ගල්, දගල්, වංගෙඩි ආදිය ද කැණීම්වලින් හමුවිය.


ආහාරපාන



ඔවුන් වාසය කළ පරිසර පද්ධතියට අනුකූල ව ආහාරදමය සැකසුණි. වෙරළබඩ ප්‍රදේශවල විසූ මානවයා මුහුදු ඌරා, හක්බෙල්ලා සහ වෙනත් බෙල්ලන් වර්ග ආහාරයට ගෙන තිබේ.

රට අභ්‍යන්තරයේ ප්‍රාග්ඓතිහාසික මානවයා ඉත්තෑවුන්, ලේනුන්, හාවුන් වැනි කුඩා සතුන් මෙන් ම විශාල සතුන් ද ආහාර පිණිස යොදාගෙන ඇත. ගස් බෙල්ලන් ආහාරයට ගැනීම ඉතා ජනප්‍රිය විය. වල් කෙසෙල්, කැකුණ ඇට හා ගෝනල වැනි අල වර්ග ද ප්‍රයෝජනයට ගෙන ඇති බව පෙනේ. ආදි මානවයා දියලුණු භාවිත කළ බව බෙලිලෙන කැණීම් සාධකවලින් හෙළි වේ.

අවමංගල්‍ය චාරිත්‍ර විධි



**තම පවුලේ සාමාජිකයකු හෝ එකට ජීවත් වූ ඥාතියකු මියගිය පසු වාසය කළ ගල් ගුහාව තුළ ම වැළලීම ප්‍රාග් ඓතිහාසික ජනයාගේ සිරිතක් ව තිබිණි. පසු කලෙක ඇට සැකිලි ගොඩට ගෙන ඒවායේ රතු පැහැති ගුරුගල් ආලේප කර කිසි යම් යාතුකර්මයක් කළ බවට සාක්ෂි හමුවී තිබේ.**

ප්‍රාග්ඓතිහාසික යුගයට අයත් සුසාන භූමි 30කට ආසන්න සංඛ්‍යාවක් පොම්පරිප්පු, ඉබ්බන්කටුව වැනි ප්‍රදේශවලින් සොයාගෙන තිබේ. එම සුසාන භූමි පිළිබඳ පර්යේෂණ කිරීමෙන් එකල මානවයා අනුගමනය කල අවමංගල්‍ය චාරිත්‍ර පිළිබඳ අනාවරණය වී ඇත.

යමෙකු මියගිය විට මළ සිරුර පිටතට දමා, පසුව ඇටකටු ගෙනවිත් නොගැඹුරු වලවල් හාරා තැන්පත් කළ බව පෙනේ. හිස්කබල්වල ගුරුගල් අලේප කර තිබුණි. ඉබ්බන්කටුව සුසාන භූමියෙන් ගොඩ ගන්නා ලද මැටි භාණ්ඩ නිර්මාණාත්මක අගයක් ඇති ඒවා ලෙස සැලකේ.

ඉහතින් සඳහන් කළ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ශාරීරික ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ බොහෝ දුරට ලක්දිව වර්තමානයේ ජීවත් වන වැදි ජනතාව සමඟ සැසඳිය හැකි බව මානව විද්‍යාඥයෝ පවසති. මේ තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාවේ ජනාවාසකරණයට දිගු ඉතිහාසයක් තිබෙන බව පෙනේ.

**සාරාංශය**

- ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු සාහිත්‍ය ලේඛනවල සඳහන් වී නැති බව
- විවිධ ප්‍රදේශවල ආදි ජනාවාස පැවති බව
- ඔවුන්ගේ ජීවන රටාව ඉතා සරල බව
- ඔවුන් වාසය කළ පරිසර පද්ධතියට අනුකූල ව ආහාරදමය සැකසී තිබුණු බව

## 1.3 ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩ ගැස්වීමට බලපෑ භූගෝලීය පිහිටීම හා භූගෝලීය සාධක

ශ්‍රී ලංකාවේ භූගෝලීය සාධක එහි ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය මෙම පාඩම් ඒකකයෙන් විස්තර කෙරේ.

### ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම


ශ්‍රී ලංකාව මුහුදින් වට වූ කුඩා රමණීය දිවයිනකි. දකුණු ආසියාවේ ඇති විශාල ම දූපත ශ්‍රී ලංකාව ය. මේ රට ඉන්දියානු අර්ධද්වීපයට දකුණින්, එයින් වෙන් ව ඉන්දියානු සාගරයේ කේන්ද්‍රීය ස්ථානයක පිහිටි රටකි. එය ඉන්දියාවෙන් වෙන් වන්නේ කිලෝමීටර් තිස් දෙකක් (සැතපුම් විසි දෙකක්) පමණ වූ පටු මුහුදු තීරයකිනි.

මෙහි භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 65,610 කි. (වර්ග සැතපුම් 25,481) උතුරේ පේදුරු තුඩුවේ සිට දකුණේ දෙවුන්දර තුඩුව අතර දුර ප්‍රමාණය දිගින් කිලෝමීටර් 432කි. කොළඹ සිට සංගමන්කන්ද තුඩුව අතර දුර ප්‍රමාණය කිලෝමීටර් 224කි.

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ කේන්ද්‍රස්ථානයක පිහිටි නිසා එය පෙර අපර දෙදිග නාවික ගමනාගමනයේ මධ්‍යස්ථානය බවට පත්ව තිබුණි. මේ නිසා ලෝකයේ බොහෝ රටවල් සමඟ ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා පවත්වා ගැනීමට හැකිවිය.




**ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම**




රට අභ්‍යන්තරයේ පිහිටි මධ්‍ය කඳුකරය සුවිශේෂී භූගෝලීය ලක්ෂණයකි. මෙම මධ්‍ය කඳුකරය වටා මුහුදු තීරය දක්වා විහිදී යන තැනිතලා ප්‍රදේශ මෙන් ම පිදුරුතලාගල, කිරිගල්පොත්ත, නමුණුකුල, සමනල වැනි කඳුවැටි රැසක් තිබේ. බලන, කඩුගන්නාව වැනි කපොලු පිහිටා තිබෙන්නේ ද මෙම මධ්‍ය කඳුකරය කේන්ද්‍ර කරගෙන ය.

මධ්‍ය කඳුකරයේ සිට කරත්ත රෝදයක ගරාදි මෙන් දිවයිනේ සතර දිසාවට ගලා බසින මහවැලි, කැලණි, වලවේ, දැදුරු, කිරිඳි ආදි ගංගා සහ ඔයවල් මේ රටේ ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රවල ප්‍රබල වෙනස්කම් ඇති කිරීමට උපකාරී විය.

දේශගුණය ඉතා වැදගත් ලක්ෂණයකි. උතුර, වයඹ, නැගෙනහිර හා ගිණිකොණ දිග ප්‍රදේශවල ඇත්තේ වියළි දේශගුණයකි. එබැවින් එම ප්‍රදේශ වියළි කලාපයට අයත් වේ. මෙම ප්‍රදේශවලට වැසි ලැබෙන්නේ ඔක්තෝබර් හා අප්‍රේල් මාස අතර කාලයේ ය. එම වැසි කාලය ඊසාන දිග මෝසම් සුළඟින් ඇති වෙයි. අවුරුද්දේ වැඩි කාලයක් වැසි ලැබෙන්නේ කඳුකර ප්‍රදේශ ආශ්‍රිත නිරිත දිග ප්‍රදේශවලට ය. නිරිතදිග මෝසම් සුළඟින් මෙන් ම ඊසාන දිග මෝසම් සුළඟින් ද මේ ප්‍රදේශවලට වැසි ලැබෙන නිසා මෙම ප්‍රදේශ තෙත් කලාපයට අයත් වේ.

ශ්‍රී ලංකාව ස්වභාවික සම්පත්වලින් පොහොසත් රටකි. ගංගා පද්ධතිය නිසා පස සාරවත් ය. වැසි ලැබෙන නිසා අගනා වන සම්පත් අප සතුව පවතී. මෙම වන සම්පත ලංකාවේ ආර්ථිකයටත්, පරසතුරන්ගෙන් රැකවරණය ලබා ගැනීමටත් ඉවහල් විය. ඛණිජ සම්පත් අපේ ජාතික සම්පතකි. වනාන්තරවල වෙසෙන අලි. ඇතුන්, ගෝනුන්, මුවන්, වළිකුකුළන් වැනි සත්ත්ව ප්‍රජාව මේ රටේ සුන්දරත්වය විදහාපායි.

## ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම

ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම ශීර්ෂ තුනකට බෙදිය හැකි ය. එනම්,

- ඉන්දියාවට ආසන්න ව පිහිටීම
- ඉන්දියාවෙන් වෙන් ව පිහිටීම
- සමුද්‍ර මංසන්ධියක පිහිටීම යනුවෙනි.

## ඉන්දියාවට ආසන්න ව පිහිටීමෙන් ඇති වූ බලපෑම්

විශාල රටක් ආසන්න ව කුඩා රටක් පිහිටා තිබෙන විට දේශපාලනික, සමාජ, ආර්ථික, ආගමික හා සංස්කෘතික සාධක අසල්වැසි කුඩා රාජ්‍යයට බලපෑම වැලැක්විය නොහැකි ය.

## දේශපාලනික බලපෑම

- ඉන්දියාවේ පැවති රාජාණ්ඩු ක්‍රමය ලක්දිව පාලන තන්ත්‍රයට බලපෑම.
- රාජ්‍ය පාලනයේ දී ගාමිණී, පුරෝහිත, සේනාපති, භාණ්ඩාගාරික, නගර පාලනයේ දී නගරගුත්තික වැනි රාජ්‍ය නිලධාරී පිරිසක් බිහිවීම.
- ඉන්දීය සම්ප්‍රදයට අනුව මෙරට රාජාභිෂේකය පැවැත්වීම.
- මෙරටේ අභ්‍යන්තර දේශපාලන තත්ත්වය දුර්වල වූ අවස්ථාවල දී දකුණු ඉන්දියානු ආක්‍රමණ එල්ල වීම.
- මේ රටේ දෙවන සේන, මහා පරාක්‍රමබාහු, හයවන පරාක්‍රමබාහු වැනි පාලකයන් දකුණු ඉන්දියාව ආක්‍රමණය කිරීම.
- ඉලනාග, අභයනාග, පළමුවන මුගලන්, තුන්වන දෙටුතිස් වැනි පාලකයින් දේශීය වශයෙන් ඔවුන්ට එල්ල වූ තර්ජන මැඩ පවත්වා ගැනීමට දකුණු ඉන්දියානු කුළී හමුදාවල සහාය ලබා ගැනීම.
- මානවම්ම, පල්ලව රජුගේ යුදමය ආධාර ලබා ගැනීම.
- සීතාවක මායාදුන්නේ රජතුමා පෘතුගීසීන්ට විරුද්ධ ව සටන් කිරීමට දකුණු ඉන්දීය සැමෝරින් නම් මුස්ලිම් රජුගේ යුදමය ආධාර ලබා ගැනීම.
- දෙවන පාණ්ඩ්‍ය වංශික වරගුණවර්මන් දෙවන සේන රජතුමාගේ සහාය ලබා ගැනීම, පරාක්‍රම පාණ්ඩ්‍ය, මහා පරාක්‍රමබාහු රජුගේ සහාය ලබා ගැනීම.
- දෙරටේ රාජ්‍ය වංස අතර ආවාහ විවාහ සබඳතා ඇතිකර ගැනීම.

  නිදසුන්: * විජය ඇතුළු පිරිසට භාර්යාවරුන් දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගැනීම.

  * මහ පැරකුම් රජුගේ කළ්‍යාණවතී බිසව පාණ්ඩ්‍ය වංශික කාන්තාවකි.

මෙසේ ශ්‍රී ලංකාව දකුණු ඉන්දියාවට ආසන්න ව පිහිටා තිබීම නිසා දේශපාලනික වශයෙන් විශාල බලපෑමක් ඇති වූ බව පෙනේ.

## සමාජමය බලපෑම

ඉන්දියාවේ පැවති කුල ක්‍රමය, සමාජ සිරිත් විරිත්, නීති රීති, ආගමික ඇදහිලි හා විශ්වාස මේ රටේ ජන සමාජයට බද්ධ විය.

## ආර්ථික බලපෑම

කෘෂිකර්මය, සත්ත්ව පාලනය, වෙළෙඳාම හා විවිධ ශිල්ප කර්මාන්ත වැනි ආර්ථික ව්‍යූහය කෙරෙහි ඉන්දියානු බලපෑම ඇති වූ බව සාහිත්‍යමය මූලාශ්‍රය මඟින් සනාථ වේ.


## ආගමික හා සංස්කෘතික බලපෑම

- බුද්ධාගම හා හින්දු ආගම අපට ලැබීම.
- මෙම ආගම් කේන්ද්‍ර කරගෙන චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ වැනි ශිල්පීය අංග ලැබීම.
- බෝධි වන්දනා, ස්තූප වන්දනා, ප්‍රතිමා වන්දනා වැනි ආගමික හා සංස්කෘතික උත්සව මේ රටේ ව්‍යාප්ත වීම.

## ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් ව පිහිටීම නිසා ඇතිවූ බලපෑම

| දේශපාලනික බලපෑම | සමාජමය බලපෑම | ආගමික හා සංස්කෘතික බලපෑම |
|---|---|---|
| • රාජාණ්ඩු පාලන ක්‍රමය දේශීය පරිසරයට අනුව සකස් වීම.<br><br>• රජුට උපදෙස් දුන් පුරෝහිත බ්‍රාහ්මණයා වෙනුවට රාජ්‍ය පාලනයේ දී භික්ෂූන් වහන්සේලා රජුට උපදෙස් දීම.<br><br>• රාජ්‍ය උරුමය පියාගෙන් පුතාට මෙන් ම සහෝදරයාගෙන් සහෝදරයාට උරුම වීම. | • කුලය පුද්ගලයාගේ වෘත්තිය මත තීරණය වීම.<br><br>• ලක්දිව ශුද්‍ර නමින් කුලයක් නොතිබීම.<br><br>• කාන්තාවන්ට බුදුදහම නිසා සම අයිතිවාසිකම් ලැබීම.<br><br>• සමාජ සිරිත් විරිත් දේශානුරූපව වෙනස් වීම. | • බුද්ධාගම මේ රටේ ප්‍රධාන ආගම බවට පත්වීම.<br><br>• කලා නිර්මාණවලට පූර්වාදර්ශය ඉන්දියාවෙන් ලැබුණත් දේශීය ක්‍රමයට ඒවා සකස් වීම.<br><br>• සීගිරිය වැනි උසස් දේශීය කලා මධ්‍යස්ථාන බිහිවීම. |

## 1.4 ශ්‍රී ලංකාව සමුද්‍ර මංසන්ධියක පිහිටීම නිසා ඇති වූ බලපෑම



ශ්‍රී ලංකාවේ පිහිටීම

### දේශපාලනික බලපෑම

- විදේශීය ආක්‍රමණවලට ශ්‍රී ලංකාව ගොදුරු වීම.
- දහසය වන සියවසේ දී යුරෝපීය ජාතිකයන් මේ රට යටත් කර ගැනීම.

### ආර්ථික බලපෑම

- ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා නිසා විදේශීය වාණිජ ප්‍රජාවෙන් මේ රටට තීරු බදු වශයෙන් විශාල ආදායමක් ලැබීම.
- විදේශීය වෙළෙඳාම නිසා විදේශීය කාසි භාවිත වීමත්, අභ්‍යන්තර වෙළෙඳාම දියුණු වීමත් සිදුවීම.
- වෙළෙඳාම නිසා මුස්ලිම් ජාතිකයන් මන්නාරම, බේරුවල, පුත්තලම වැනි ප්‍රදේශවල වෙළෙඳ බලය තහවුරු කර ගැනීම.

## ආගමික, සංස්කෘතික හා සමාජමය බලපෑම

- හින්දු කෝවිල්, මුස්ලිම් හා ක්‍රිස්තියානි පල්ලි මේ රට තුළ ඉදිකර ඔවුන්ගේ ආගම් ප්‍රචාරය කිරීම.
- ශ්‍රී ලංකාව බහු ආගමික, බහු භාෂීය, බහු වාර්ගික රටක් වීම.
- බර්ගර් නමින් නව ජන වර්ගයක් මේ රට තුළ ස්ථාපිත වීම.

## අභ්‍යන්තර භූගෝලීය ලක්ෂණ ශ්‍රී ලංකාවේ ඉතිහාසයට කළ බලපෑම

| | |
|---|---|
| ගංගා පද්ධතිය | දේශපාලනික හා ආර්ථික වශයෙන් විශාල බලපෑමක් කර තිබේ. මෙම ගංගා පද්ධතිය ආර්ය ජනාවාස පිහිටුවා ගැනීමට, සිංහල රාජධානි පිහිටුවා ගැනීමට, ආරක්ෂක කටයුතුවලට, ගමනාගමන හා පරිවහන කටයුතුවලට, වැව් අමුණුවලට ඇළ මාර්ගවලින් ජලය ලබා ගැනීමට හා ජල කළමනාකරණයට බෙහෙවින් ම ඉවහල් වී ඇති බව සාහිත්‍යමය මූලාශ්‍රය මඟින් හෙළි වෙයි. |
| දේශගුණය | ජනාවාස ව්‍යාප්තියට, ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් බිහිකර ගැනීමට හා සුවදායක ජීවිතයක් ගොඩනඟා ගැනීමට ඉවහල් විය. |
| කුඩා දිවයිනක් වීම | මුළු රට පුරාම ඒකීය පාලන ක්‍රමයක්, ඒකීය සංස්කෘතියක් ගොඩ නඟා ගැනීමට ඉවහල් විය. පාලකයන්ට විරුද්ධ ව සිවිල් කැරලි ඇති නොවීමටත්, සමෘද්ධිමත් ආර්ථිකයක් ගොඩනඟා ගැනීමටත් ඉවහල් වූ බව පෙනේ. |

**ක්‍රියාකාරකම 02**

01. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර භූගෝලීය ලක්ෂණ ලැයිස්තුගත කරන්න.
02. ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක ගංගා 05ක් ඇඳ නම් කරන්න. ඔබ නම් කළ ගංගාවල පැරණි යුගයේ භාවිත කළ නම් වෙන වෙන ම ලියන්න.

**සාරාංශය**

- ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර හා බාහිර භූගෝලීය පිහිටීම.
- භූගෝලීය සාධක එහි ඉතිහාසයට විවිධ බලපෑම් සහ වෙනස්කම් ඇතිකරලීමට හේතු සාධක විය.

## 1.5 භාරතීය ජන සංක්‍රමණ හා ජනාවාස ව්‍යාප්තිය

ලක්දිවට පැමිණි ජන කණ්ඩායම් ක්‍රමයෙන් ජනපද ව්‍යාප්ත කරගත් ආකාරය හා ඔවුන්ගේ භාරතීය ජීවන තොරතුරු මෙම පාඩමෙන් විස්තර වේ.

### ආර්‍ය ජනතාවගේ මුල් භූමිය

ආර්‍යයන්ගේ මුල්භූමිය පිළිබඳ ව විවිධ මත පළවී තිබේ. එකී මත විමසා බලන විට ආර්‍යයන්ගේ මුල්භූමිය ආසියාවේ ස්ටෙප්ස් තණබිම් නිජබිම කරගත් දකුණු රුසියාව හා ඊට සමීප ප්‍රදේශ බව සැලකිය හැකි ය.

ක්‍රි.පූ. 2000 දී පමණ එහි සිටි ආර්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදී බටහිරට හා දකුණට සංක්‍රමණය විය.

එක කොටසක් යුරෝපය දෙසට ගියේ ය. මේ අය ඉන්දු යුරෝපීය ආර්‍යයන් ලෙස හැඳින්විණි.

තව කොටසක් ඉරානය හා ඉන්දියාව දෙසට සංක්‍රමණය විය. ඔවුන් ඉන්දු ඉරාන ආර්‍යයන් ලෙසින් හැඳින්විණි. ක්‍රි.පූ. 1500 දී මොවුන් ඉන්දියාවේ වයඹ දිග පිහිටි දුර්ග මාර්ග ඔස්සේ ඉන්දියාවට සංක්‍රමණය විය. මේ අය ඉන්දු ආර්‍යයන් ලෙසින් හැඳින්වේ. ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූයේ, මෙම ඉන්දු ආර්‍යයන් ය. ක්‍රි.පූ 6 වන සියවසේ දී පමණ ඔවුන් ලක්දිවට පැමිණ ඇත.

### ලක්දිවට පැමිණි භාරතීය ජන සංක්‍රමණ පිළිබඳ තොරතුරු දැක්වෙන දේශීය හා විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර

| | |
|---|---|
| • මහාවංසය | • හියුන්සාං වාර්තාව |
| • දීපවංසය | • ෆාහියන් වාර්තාව |
| • සමන්තපාසාදිකාව | • වලාහස්ස ජාතකය |

## ලක්දිවට පැමිණි ප්‍රධාන භාරතීය ජන කණ්ඩායම්

- විජය ඇතුළු පිරිස
- විජය ඇතුළු පිරිස කැඳවා ගත් භාර්යාවන්
- පඬුවස්දෙව් ඇතුළු පිරිස
- භද්දකච්චානා ඇතුළු පිරිස
- භද්දකච්චානාගේ සොහොයුරන් පිරිස

මෙම භාරතීය ජන කණ්ඩායම් ලංකාවේ වයඹ දිග සහ නැගෙනහිර වෙරළේ පිහිටි තොටුපළවලට ගොඩබැස පදිංචිය සඳහා වියළි කලාපයේ ගංගා ආශ්‍රිත ප්‍රදේශ තෝරාගෙන තිබේ.

## ගංගා ආශ්‍රිත ප්‍රදේශ තෝරා ගැනීමට බලපෑ සාධක

| | |
|---|---|
| • භෞතික සාධක | * තැනිතලා බිම්<br>* සරු පස<br>* ජල පහසුව<br>* ගොවිතැනට හිතකර දේශගුණය<br>* වාර්ෂික වර්ෂාපතන අගය |

ආයඪයන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තයයි. ඉහත සඳහන් කර ඇති භෞතික ලක්ෂණ කෘෂිකර්මාන්තය සඳහා බෙහෙවින් ම හිතකර සාධක ය.

## ආර්ය ජනාවාස ව්‍යාප්තිය

**විජය ඇතුළු පිරිස පිහිටුවාගත් ජනපද**

- අනුරාධ ගාම - මල්වතු ඔය අසල
- උරුවේල ගාම - කලා ඔය අසල
- උපතිස්ස ගාම - කනාදරා ඔය අසල
- විජිත ගාම - කලාඔය ආසන්නයේ හෝ මහවැලි ගංගා නිම්නය අසල
- තම්බපණ්ණි ගාම, උදේනි ගාම - (පිහිටි ස්ථාන නිශ්චිත නැත)

හද්දකච්චානාගේ සොහොයුරන් පිහිටුවාගත් ජනපද

- රාම ගෝණ - මහවැලි ගං මෝය අසල
- දීඝායු ගාම - වර්තමාන ගල්ඔය අසල
- විජිත ගාම - මහවැලි ගංමෝය අසල

(මෙම ජනපද ලංකාවේ නැගෙනහිර හා ගිණිකොණ දෙසට වන සේ පිහිටුවා ගෙන ඇත).

කල්යෑමේ දී බටහිර පෙදෙසෙහි කල්‍යාණි නදිය අසල කල්‍යාණි ජනපදය ද කප්පකන්දර නදී (මැණික් ගඟ) අසල කාචර ගාම ජනපදය ද පිහිටුවා ගෙන තිබේ. චන්දන ගාම ජනපදය ද ගිණිකොණ දිග ප්‍රදේශයට අයත් වේ.

ඉහත දක්වෙන ආකාරයට ආර්ය ජනාවාස ලක්දිව වියළි කලාපයේ උතුරු දිග හා ගිණිකොණ දිග තැනිතලා ප්‍රදේශවලත්, තෙත් කලාපීය ප්‍රදේශවලත් ව්‍යාප්ත වී ගිය බව පෙනේ.

## භාරතීය ජන සංක්‍රමණවල ජීවන තොරතුරු

| | |
|---|---|
| • දේශපාලන රටාව | මෙරට පිහිටුවාගත් මුල් ජනාවාස ''ගාම'' ලෙස හැඳින්විණි. ජනපද පිහිටි ප්‍රදේශවල පාලකයා ''ගාමිණී'' නමින් හැඳින්වීය. කල්යෑමේ දී ගාමිණීවරුන් අතුරෙන් බලවත් වූ පාලකයා ''රජ'' නමින් හැඳින්විණි. |
| • ආර්ථික රටාව | ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තයයි. ගොවිතැනට හිතකර ප්‍රදේශවල ජනපද පිහිටුවා ගත්හ. ගොවිතැනට අමතර ව සත්ත්ව පාලනය, වෙළෙඳාම වැනි ආර්ථික කටයුතුවල නියැළුණු බව පෙනේ. |
| • ආගමික තොරතුරු | එකල බ්‍රාහ්මණ ආගමට මුල් තැනක් ලැබුණි, ඉන්ද්‍ර, සූර්ය වැනි දේව වන්දනා මෙන් ම ජෛන ආගම ද පැවති බව සිතිය හැකි ය. බුද්ධාගම පිළිබඳ ව ද ඔවුන් දැන සිටින්නට ඇතැයි අනුමාන කළ හැකි ය. |

ක්‍රියාකාරකම 03

01. ලංකාවේ ආකෘති සිතියමක මුල් ජනාවාස ලකුණු කර නම් කරන්න.

සාරාංශය

- ඉන්දීය ජන කණ්ඩායම් ඉන්දියාවේ සිට වරින්වර මේ රටට සංක්‍රමණය විය.
- ජලාශ්‍රිත ප්‍රදේශවල ජනපද පිහිටුවාගෙන තිබේ.
- ජනාවාස ව්‍යාප්තිය භෞතික ලක්ෂණ මත සිදුවිය.
- මුල්කාලීන ජනතාවගේ ජීවන රටාව ඉතා සරල විය.

## 1.6 අනුරාධපුර රාජධානි සමයේ දේශපාලනික ආර්ථික හා සංස්කෘතික වශයෙන් වැදගත් තොරතුරු හඳුනා ගනිමු.

අනුරාධපුර රජ සමයෙහි ශ්‍රේෂ්ඨ පාලකයන් වශයෙන් සැලකෙන පණ්ඩුකාභය, දේවානම් පියතිස්ස, දුටුගැමුණු, වළගම්බා, වසභ, සහ ධාතුසේන යන රජවරුන්ගේ දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික කාර්යයන්හි සාර්ථකත්වයට බලපෑ හේතු සාධක කවරේ දැයි මෙම පාඩම් ඒකකයෙන් සොයා බැලේ.

### පණ්ඩුකාභය රජ සමයේ ඓතිහාසික වැදගත්කම

දීපවංසයේ හා සමන්තපාසාදිකාවේ පණ්ඩුකාභය රජතුමා ගැන සඳහන් වන්නේ කෙටි සටහනකි. මහාවංසයේ පරිච්ඡේද දෙකකින් ඉතා දිගු විස්තරයක් ඔහු පිළිබඳ ව දක්වෙයි. මහාවංස කතුවරයා පණ්ඩුකාභය චරිතය අද්භූත ජනක සිදුවීම්වලින් සරසා තිබේ.

මෙම රාජ්‍ය කාලයේ ඇති වැදගත්කම පහත දැක්වෙන ශීර්ෂ ඔස්සේ විස්තර කළ හැකි ය.

- පණ්ඩුකාභය කුමරුගේ ළමා කාලය
- ප්‍රථම රාජධානිය පිහිටුවා ගැනීම හා නාගරික සංවර්ධනය
- ආගමික ප්‍රතිපත්තිය

## පණ්ඩුකාභය කුමරුගේ ළමා කාලය

පණ්ඩුකාභය කුමරුගේ මව උන්මාද චිත්‍රා කුමරියයි. පියා දීඝ ගාමිණී ය. ඔහු භද්දකච්චානාගේ සොහොයුරකු වූ දීඝායුගේ පුතා ය. කුඩා කාලයේ දී ම පණ්ඩුකාභය කුමරු ඔහුගේ මාමාවරුන් විසින් මරා දැමීමට සූදානම් වී ඇති බව දැනගත් උන්මාද චිත්‍රා කුමරිය තම පුතු රැක ගැනීමට උපක්‍රමශීලී ව දොරමඬලා ගමට යැවීය. විවිධ උපක්‍රම මඟින් පණ්ඩුකාභය කුමරු ඝාතනය කිරීමට මාමාවරු සූදානම් වූහ. එහෙත් මාමාවරුන්ට කුමරු මරා දැමීමට නොහැකි විය.

පණ්ඩුල බ්‍රාහ්මණයා වේද ශාස්ත්‍රයේ පරතෙරට පත් බමුණෙකි. ඔහු වෙතට පැමිණි පණ්ඩුකාභය කුමාරයා අනාගතයේ රජ වෙන බව දැනගත් පණ්ඩුල බමුණා පණ්ඩුකාභය කුමරුට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වී ය. හෙතෙම ඉතා ඉක්මණින් ම ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගත්තේ ය.

පණ්ඩුල බමුණාගේ සහායෙන් ධන සම්පත් හා මිනිස් සම්පත් ලැබ, සේනා සංවිධානය කරගෙන මාමාවරුන් සමඟ සටන් කර ජයගෙන අනුරාධ ගාමයේ සිය රාජධානිය පිහිටුවා ගත්තේ ය.

ඉහතින් සඳහන් කර තිබෙන සංක්ෂිප්ත පණ්ඩුකාභය පුරාවෘත්තයෙහි ඇති ඓතිහාසික වටිනාකම වන්නේ, ශ්‍රී ලංකාවේ ගිණිකොණ ප්‍රදේශයේ හා වයඹ දිග ප්‍රදේශයේ ජීවත් වූ ජන කණ්ඩායම් දෙක එක් කළ පාලකයා පණ්ඩුකාභය රජතුමා බවයි.

පළමු වරට උතුරුමැද ප්‍රදේශයේ ප්‍රථම සිංහල රාජධානිය පිහිටුවා ගත්තේ පණ්ඩුකාභය රජතුමා ය. ඔහුගේ රාජ්‍ය උපදේශකවරයා වූයේ පණ්ඩුල බමුණාගේ පුත් චන්ද්‍ර කුමාරයා ය. අනුරාධපුරය සිය රාජධානියේ අගනුවර ලෙස තෝරා ගෙන තිබුණි. පැවති දේශීය සම්ප්‍රදායට අනුව පණ්ඩුකාභය අභිෂේක විය. ස්වර්ණපාලි කුමරිය සිය අග මෙහෙසිය බවට පත්කර ගත්තේ ය. ඔහුට උදව් උපකාර කළ අයට සුදුසු තනතුරු පිරිනැමී ය. සිය මාමා කෙනකු වූ අභයට අනුරාධපුර නගරය ආරක්ෂා කිරීමට ''නගර ගුත්තික'' තනතුර පිරිනැමී ය. ඔහුගේ ගිරිකණ්ඩසිව මාමාට ගිරිකණ්ඩසිව ප්‍රදේශයේ පාලන බලය පවරා දුණි. අභිෂේකය සඳහා ජලය ලබාගත් වැව ගැඹුරට හාරා එයට ජයවාපී හෙවත් ජය වැව යන නම තැබී ය. මොහුගේ දසවන රාජ්‍ය වර්ෂයේ දී ග්‍රාම සීමා නියම කළ බව මහාවංසයෙහි සඳහන් වෙයි.

## නාගරික සංවර්ධනය

අනුරාධපුර නගරයට බටහිර දෙසින් මහා සුසාන භූමිය සහ වධක ස්ථානය පිහිටුවී ය. නගරය පිරිසිදු කිරීමට සැඩොලුන් පන්සියයක් යෙදවී ය. මළමිණී ඉවත් කිරීම සඳහා තවත් සැඩොලුන් එකසිය පනහක් පත් කර ඇත. සුසාන පාලකයන් වශයෙන් තවත් බොහෝ සැඩොලුන් පත් කළේ ය. මහා සුසාන භූමියට වයඹ දෙසින් චණ්ඩාලයන් සඳහා ගම්බිම් පිහිටුවී ය. සැඩොල් ගමට ඊසාන දෙසින් නීච සුසාන භූමියක් ද පිහිටුවා තිබුණි.

අනුරාධපුර නගරය සියලු නගරාංගයන්ගෙන් පරිපූර්ණ නගරයක් බවට ද පත් කළේ ය. එහි සනීපාරක්ෂක කටයුතු කෙරෙහි ද අවධානය යොමු කෙරිණි. නගරයේ අපවිත්‍ර ජලය බැස යාමට කාණු ඉදි කර වූ බව ද මහා වංසයෙහි සඳහන් වෙයි. පණ්ඩුකාභය රජතුමා මෙරට ක්‍රමවත් පාලනයක් පවත්වා ගෙන යාමට සමත් වූ පාලකයෙකි.

## ආගමික ප්‍රතිපත්තිය

ඔහුගේ ආගමික ප්‍රතිපත්තිය සහනදායක විය. කාළවේල හා චිත්තරාජ බලවත් යකුන් දෙපළකි. කාළවේල යක්ෂයා නගරයේ නැගෙනහිර දිසාවේ වාසය කරවන ලද අතර චිත්තරාජ අභය වැව පහළ ප්‍රදේශයේ නැවැත්වී ය. ඔවුන් දෙපළ වෙනුවෙන් වාසස්ථාන පිහිටුවී ය. වෙළඹ වෙස්ගෙන සිටි චේතියා නමැති යක්ෂණිය රජ ගෙවුයන ඇතුළත නවත්වා ගත්තේ ය. තමාට කුඩා කල උදව් කළ දසිය නගරයේ දකුණු දොරටුව අසල වාසය කරවී ය. රජවාසල ඇතුළත වලවාමුඛී යකින්න නවත්වා ගත්තේ ය. මේ අය උදෙසා වාර්ෂික ව බිලිබිලි දෙන ලදී. සැණකෙළි සමයෙහි පණ්ඩුකාභය රජතුමා ඔවුන් හා සම අසුන්හි හිඳ විනෝද විය.

වෙස්සවණ දෙවියන් උදෙසා නුග ගසක් වෙන් කළ අතර ව්‍යාධදේව උදෙසා තල් ගසක් වෙන් කළේ ය. යවනයන් සඳහා නිවාසයක් ද මහේජගෙය හෙවත් බිලිපූජා කරන ස්ථානයක් ද පිහිටුවී ය. ජෝතිය, ගිරි කුම්භාණ්ඩ යන නිගණ්ඨයන් උදෙසා ද පරිබ්‍රාජක, ආජීවක හා බ්‍රාහ්මණයන් උදෙසා ද නිවාස හා වැඳුම් පිදුම් කරන ස්ථාන පිහිටුවී ය. සිවිකා සාලා, සොත්ථි සාලා නමින් ගොඩනැගිලි විශේෂයක් ඉදිකරවන ලදී. සොත්ථි සාලා බ්‍රාහ්මණයන් උදෙසා ය. සිවිකා ශාලා ශිව ලිංගය පිහිටුවා තිබුණු ස්ථානයකි. එකල පැවති සියලු ආගම්වලට හා මිථ්‍යා ඇදහිලි, විශ්වාසවලට පණ්ඩුකාභය රජුගේ අනුග්‍රහය ලැබුණි.

ඔහු අනුගමනය කළ මධ්‍යස්ථ ආගමික ප්‍රතිපත්තිය ඔහුගේ කාර්ය සංසිද්ධිය සාර්ථක කර ගැනීමටත් සමකාලීන සියලු රට වැසියාගේ සහාය ලබා ගැනීමටත් ඉවහල් වී යැයි සිතිය හැකි ය.

පණ්ඩුකාභය රජතුමා රාජ්‍යත්වයට පත්වූයේ තිස්හත්වෙනි වයසේ දී ය. ඔහු වසර හැත්තෑවක් රජ කළ බව සඳහන් වෙයි. මහාවංසගත පණ්ඩුකාභය පුරා වෘත්තයේ මිථ්‍යා ප්‍රබන්ධ හා ආශ්චර්ය, අද්භූතජනක සිදුවීම් බැහැර කර ඓතිහාසික අගයක් ඇති තොරතුරු ඉස්මතු කර ගත්විට, පණ්ඩුකාභය රජ සමය ශ්‍රී ලංකාවේ ඉතා වැදගත් කාලපරිච්ඡේදයක් ලෙසින් හඳුන්වා දිය හැකි ය.

**ක්‍රියාකාරකම 05**

01. පණ්ඩුකාභය රජතුමාගේ ළමා කාලය පිළිබඳ තොරතුරු රැස්කර කුඩා පොතක් සකස් කරන්න.

**සාරාංශය**

- පණ්ඩුකාභය රජුගේ ළමා කාලය විසිතුරුව මහාවංශයෙහි ගොඩනඟා තිබේ.
- ගිණිකොණ දිග හා වයඹ දිග පැවති ජනාවාස ඒකාබද්ධ කළ ප්‍රථම පාලකයා පණ්ඩුකාභය රජතුමා ය.

## දේවානම්පියතිස්ස රජසමය හා මහින්දගමනය

ශ්‍රී ලංකාවේ ස්වර්ණමය උදවක් සිදුවූයේ දේවානම්පියතිස්ස රජ සමයේ දී ය. එම ස්වර්ණමය උදව ඇති වූයේ කෙසේ දැයි මෙම පාඩමෙන් විස්තර වේ.

මුටසීව රජුගෙන් පසුව අනුරාධපුර රාජ්‍යයෙහි පාලකයා වූයේ තිස්ස කුමරු ය. ඔහු මුටසීව රජුගේ දෙවන පුත්‍රයා ය. ශ්‍රී ලංකා ඉතිහාසයේ විශ්වාසදායී විස්තරාත්මක සාහිත්‍ය ම ය මූලාශ්‍රය ලේඛනගත කිරීමේ කාර්යය ආරම්භ වන්නේ මෙම රජ සමයේ දී ය. එසේ ම ඉන්දිය මෞර්ය අසෝක අධිරාජයා සමඟ සුහද සම්බන්ධතා ගොඩ නඟා ගැනීමෙන් ලංකා ඉතිහාසය නව මඟකට පිවිසෙන්නේ ද මෙම රාජ්‍ය අවධියේ ය. ථෙරවාදී බුදුදහම ලැබීමත් මේ යුගයේ වැදගත්කමට තුඩු දුන් තවත් ඓතිහාසික සිදුවීමකි.

මෙම රාජ්‍ය අවධියේ ඓතිහාසික අගය පහත සඳහන් ශීර්ෂ ඔස්සේ විස්තර කළ හැකි ය.

- ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පැවති සම්බන්ධතා
- තිස්ස රජතුමාගේ පුනරාභිෂේකය
- මහින්දගමනය හා බුදු සසුන පිහිටුවීම
- ආගමික, සාමාජීය හා සංස්කෘතික දියුණුව

## ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පැවති සම්බන්ධතා

තිස්ස රජතුමා සහ අසෝක රජතුමා නුදුටු මිතුරන් දෙදෙනෙකි. ආගමික හා සංස්කෘතික සම්බන්ධතා මගින් මිත්‍රත්වය තහවුරු විය. තිස්ස රජතුමා රාජ්‍යත්වයට පත්වී, නොබෝ දිනකින් ම අසෝක අධිරාජයා වෙත මාහැඟි පුද පඬුරු සමඟ දූත පිරිසක් යැවීය. මහා අරිට්ඨ කුමාරයා මේ දූත පිරිසේ නායකත්වය දැරීය. ඔහු තිස්ස රජතුමාගේ බෑනාණුවන් ය. බමුණෙක්, අමාත්‍යවරයෙක් සහ ගණකාමාත්‍යවරයෙක් ද මේ ගමනට සහභාගි වූහ. ජම්බුකෝලපට්ටනයෙන් නැව් නැගී මේ දූත පිරිස දින හතකට පසුව තාම්‍රලිප්ත වරායට ළඟා වූහ; පාඨලී පුත්‍ර නගරයට පැමිණ අසෝක අධිරාජයා බැහැදැක ගෙනයන ලද පුද පඬුරු එතුමන්ට පිළිගැන්වූහ. සතුටට පත් වූ රජතුමා දූත පිරිසේ ප්‍රධානියාට සේනාපති තනතුර ද, බමුණාට පුරෝහිත තනතුර ද, අමාත්‍යවරයාට දණ්ඩනායක තනතුර ද, ගණකාමාත්‍යවරයාට සිටු තනතුර ද පිරිනැමී ය. මෙම දූත පිරිස පස් මසක් එහි විසූහ. ඉන් පසු දූත පිරිස ආපසු සියරට බලා පටන්වූහ.

ධර්මාසෝක රජතුමා සිය නුදුටු මිතුරාට විධිමත් අභිෂේකයක් කිරීමට අවශ්‍ය රාජ්‍ය කකුධ භාණ්ඩ දූත පිරිස අත එව් ය. ඒ සමඟ ම විශේෂ පණිවිඩයක් ද එවන ලදි.

**''මම තෙරුවන් සරණ ගියෙමි. සම්බුද්ධ සසුනෙහි උපාසකයෙක් වෙමි. රජතුමනි, ඔබත් සිත පහදගෙන තෙරුවන් සරණ යනු මැනවි.''** යනු එම පණිවිඩයයි.

ඉමහත් සතුටට පත් වූ තිස්ස රජතුමා සිය මිතුරා විසින් එවන ලද රාජ්‍ය කකුධ භාණ්ඩ පිළිගෙන මෞර්ය ක්‍රමයට දෙවනවරටත් අභිෂේකයක් පැවැත්වී ය. මෙම අභිෂේකයෙන් පසුව 'දෙවනපිය' විරුදාවලිය සිය නමට එක් කරගන්නා ලදි. ඉන්පසු එතුමා 'දේවානම්පියතිස්ස' නමින් ප්‍රකට විය.

දෙවන වරට ඉන්දියාවට ගිය දූත පිරිසේ නායකත්වය ගත්තේ සුමන සාමණේරයන් වහන්සේ ය. උන්වහන්සේ දඹදිව අශෝක අධිරාජයා වෙතින් බුදුරදුන්ගේ දකුණු අකුධාතූන් වහන්සේ සහ තවත් ධාතූන් වහන්සේලා ලබාගෙන මෙරටට වැඩම කර ථූපාරාම ස්ථූපයෙහි මෙම ධාතූන් වහන්සේලා තැන්පත් කළහ.

තුන්වන වරටත් දූත මෙහෙවරක් සිදුවිය. මෙම දූත මෙහෙවරෙහි නායකත්වයට යළිත් වරක් මහා අරිට්ඨ කුමාරයා තෝරා ගත්තේ ය. මෙහි අරමුණ වූයේ සඟමිත් තෙරණියන් සහ ජයසිරිමහ බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලක්දිවට වැඩම කරවා ගැනීමයි. මෙතෙම අශෝක අධිරාජයා බැහැ දැක, ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ද, සඟමිත් තෙරණිය ඇතුලු භික්ෂුණීන් වහන්සේලා ද සමඟ පෙරළා ලක්දිවට පැමිණියහ. මෙම පිරිස ක්‍රි.පූ.247 උඳුවප්පුර පොහෝදින දඹකොළ පටුනට ගොඩ බැස්සාහ. දේවානම්පියතිස්ස රජතුමා මිහිඳු මහ හිමියන්ගේ උපදෙස් පරිදි එහි ගොස් සඟමිත් තෙරණියන් ඇතුළු පිරිස සහ දක්ෂිණ බෝධි ශාඛාව ගෞරවාදරයෙන් පිළිගෙන පෙරහැරින් අනුරාධපුරයට වැඩම කරවූයේ ය. මහමෙවුනා උයනෙහි දක්ෂිණ බෝධීන් වහන්සේ රෝපණය කෙරිණ. සඟමිත් තෙරණිය විසින් අනුලා බිසව ප්‍රධාන කාන්තාවන් සසුන් ගත කෙරිණි. කාන්තාවන්ගේ සුභ සිද්ධිය උදෙසා භික්ෂුණී ශාසනය ලංකාවේ පිහිටුවීම ඉතා වැදගත් ශාසනික සේවයකි.

## තිස්ස රජතුමාගේ පුනරාභිෂේකය

තිස්ස රජතුමා අශෝක අධිරාජයාගේ අනුග්‍රහයෙන් දෙවන වරට අභිෂේක ලැබී ය. එය මෞර්ය සම්ප්‍රදායට අනුව සිදු කෙරිණි. මේ සම්බන්ධ ව ඉතා පැහැදිලි විස්තරයක් මහාවංශ ටීකාවෙන් හෙළි වේ.

'' න අඤ්ඤං අභිෂේක පරිහාරං නාම අත්ථි කේවලං
නවයට්ඨියා ඒව කිර සෝ රජ්ජං කාරේති ''

ඉහත සඳහන් පාඨයෙන් පෙර ලක්දිව පැවති අභිෂේක ක්‍රමයෙහි ස්වභාවය විස්තර වෙයි. එකල විධිමත් අභිෂේක ක්‍රමයක් නොතිබුණි. මෞර්ය සම්ප්‍රදයට අනුව අභිෂේක ලැබීමට අවශ්‍ය උපකරණ ලංකාවෙන් ගිය දූත පිරිසට අශෝක රජතුමා දී ඇත. ඒවා නම්,

වල් විදුණාව, උෂ්ණිෂ පට්ටය, මඟුල් කඩුව, සේසත, මීරිවැඩි සඟල, ඉස්වෙලුම, කර්ණාභරණ ජෝඩුව, රන්දමය, කෙණ්ඩිය, හරිසඳුන් සෝද පිරිසිදු කිරීමක් වුවමනා නොවන ඇඳුම් රැසක්, අගනා අත්පිස්නා, නාගයන් විසින් ගෙනඑන ලද අඳුන්, අරුණුවන් මැටි, අනෝතත්ත විලේ සහ ගංගා නදියේ ජලය, දකුණු අතට නැවුණු හක් ගෙඩියක්, රන්නැටි ආදි බඳුන්, මා හැඟි සිවිකාවක්, අරළු, නෙල්ලි, මාහැඟි අමා ඔසු ආදියයි.

අශෝක රජතුමා මෙම උපකරණ සමඟ නව යොවුන් කන්‍යාවක් ද ලංකාවට එවී ය. මෙම අභිෂේක උත්සවය පිළිබඳ ව සෙනරත් පරණවිතාන මහතාගේ අදහස මෙහි දී සඳහන් කිරීම සුදුසු ය. අශෝක රජතුමා වැනි ප්‍රතාපවත් අධිරාජයකු සමඟ සබඳතා පැවැත්වීම තිස්ස රජතුමාට තම දේශපාලන බලය ශක්තිමත් කර ගැනීමට බෙහෙවින් ම උපකාරී වී ඇත. තම සහාය ඇතිව ලක්දිව පාලකයකු අභිෂේක කිරීම අශෝක රජතුමා සිය දේශපාලන ආධිපත්‍ය අසල්වැසි ශ්‍රී ලංකාව තුළ යම් පමණකට පතුරුවා හැරීමට ද අපේක්ෂා කරන්නට ඇත යනුවෙන් ඔහු සඳහන් කර ඇත.

## මහින්දගමනය හා ලක්දිව බුදුදහම පිහිටුවීම



දේවානම්පියතිස්ස රජ සමයේ සිදු වූ ඉතාම වැදගත් ඓතිහාසික සිදුවීම මහින්දගමනයයි. මෙහි ඓතිහාසික පසුතලය තුන්වන ධර්ම සංගායනාවයි. මෙම සංගායනාවෙන් පසුව ථෙරවාදී බුදුදහමේ පණිවිඩය රටවල් නවයකට ලැබුණි. ලක්දිවට මහින්ද මහරහතන් වහන්සේ ඇතුළු ධර්මදූත පිරිස පැමිණියහ.

ලක්දිව පාලි වංසකතාවල මෙම ධර්ම දූත සේවය පිළිබඳ ව බොහෝ තොරතුරු විස්තර කර තිබේ. මෙම ධර්ම දූත පිරිස ලක්දිවට පැමිණීම පිළිබඳ ව ශිලාලිපි සාධක මඟින් ද සනාථ වෙයි. ඒ අනුව මෙම ධර්මදූත සේවය පිළිබඳ විශ්වසනීයත්වය තහවුරු කරගත හැකි ය.

මිහිඳු හිමි ඇතුළු ධර්ම දූත පිරිස දේවානම්පියතිස්ස රජතුමාට හමු වූයේ මිස්සක පබ්බතය (මිහින්තලය) අසලදී ය. කහ සිවුරු දරා සිටි භික්ෂූන් වහන්සේලා දුටු රජතුමා බියට පත් විය. ''අපි ධර්මරාජයාණන් වහන්සේගේ ශ්‍රමණ ශ්‍රාවකයෝ වෙමු. ඔබට අනුකම්පා පිණිස දඹදිව සිට පැමිණියෙමු'' යනුවෙන් කළ ප්‍රකාශය අසා රජුගේ බිය දුරුවිය. රජුගේ බුද්ධිය පරීක්ෂා කර බැලීම සඳහා අඹ ප්‍රශ්නය හා ඥාති ප්‍රශ්නය විමසීමෙන් රජුගේ බුද්ධිමත් භාවය හඳුනාගත් මිහිඳු මහ රහතන් වහන්සේ රජතුමන් ඇතුළු පිරිසට ''චූල්ලහත්ථිපදෝපම සූත්‍රයෙන්'' දහම් දෙසූහ. බණ අසා පැහැදුණු රජතුමා තෙරුවන් සරණ ගොස් බුදුදහම වැළඳ ගත්තේ ය. දේවානම්පියතිස්ස රජතුමා ලක්දිව ප්‍රථම බෞද්ධ රජතුමා ය.

### දේවානම්පියතිස්ස රජතුමාගේ අනුග්‍රහය මත මිහිඳු මහ රහතන් වහන්සේ සිදු කළ ආගමික හා ශාසනික සේවා

- භණ්ඩුක උපාසකවරයා මහණ කර ලක්දිවට පැවිද්ද හඳුන්වා දීම.
- මහමෙවුනා උයන පිළිගැනීම.
- මහාවිහාරය පිහිටුවීම සඳහා උපදෙස් දීම.
- නගරවාසීන්ට ධර්ම ශ්‍රවණයට ඉඩ සලසා ඔවුන් තෙරුවන් සරණ ගිය උපාසකයන් බවට පත් කිරීම.
- ප්‍රථම වස් විසීම චේතියගිරියේ දී සිදු කිරීම.
- ථූපාරාම චෛත්‍යය ඉදි කිරීම (ලක්දිව ප්‍රථම ඓතිහාසික චෛත්‍යය)

- මහමෙවුනා උයනෙහි බෝධි රෝපණ උත්සවය පැවැත්වීම.
- අරිට්ඨ කුමරු පැවිදි කිරීම.
- මහා විහාර සීමාව සනිටුහන් කිරීම.



ථූපාරාම චෛත්‍යය

ඉහතින් සඳහන් කළ ආගමික හා ශාසනික සේවා නිසා ශ්‍රී ලාංකික ජනතාව ආගමික වශයෙන් හා ජාතික වශයෙන් ඒකීය භාවයකට පත්විය. මේ අනුව ලාංකිකයාට අර්ථවත් මිනිස් ජීවිතයක් ගත කිරීමට මහින්දගමනය හා ලක්දිව බුද්ධාගම පිහිටුවීම ඍජු ලෙස දයක වූ බව සඳහන් කළ හැකි ය.

ආගමික, සමාජයීය හා සංස්කෘතික දියුණුව

මහින්දගමනයෙන් පසුව මේ රට තුළ ආගමික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් විශාල පරිවර්තනයක් සිදු විය. බුදුදහම මෙරට ජන ජීවිතයට සම්බන්ධ වීමත් සමඟ මෙම ජන සමාජය සිව්වනක් පිරිසෙන් සමන්විත දැහැමි රාජ්‍යයක් බවට පත්විය.

ආගමික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම්

- වෘක්ෂ වන්දනාව - බෝධි වන්දනාව බවට පත්වීම
- පර්වත වන්දනාව - ස්ථූප වන්දනාව බවට පත්වීම
- ගිනි පූජා - පහන් පූජා ලෙස සැකසීම
- මළවුන් පිදීම - ප්‍රාප්ති දානමය පිංකම් ලෙස පරිවර්තනය වීම

ප්‍රාග් බෞද්ධ යුගයේ මෙරට ආගමික අංශයේ ප්‍රධානත්වය ලැබුණේ බමුණන්ට ය. බුදුදහම ලැබීමෙන් පසුව භික්ෂූන් වහන්සේලා රාජ්‍ය අනුශාසකයෝ වූහ. රාජ්‍ය පාලනය බෞද්ධ ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක විය. බුදුදහම හඳුන්වා දීමත් සමඟ මෙරට ජනතාවට සංවිධානය වූ ද ක්‍රමවත් වූ ද ධර්මයක් හඳුනා ගැනීමට අවස්ථාව ලැබුණි.

සමාජයීය පෙරළිය

බුදුදහම මෙරට ජන ජීවිතයට බද්ධ වීමත් සමඟ ධාර්මික ජන සමාජයක් ඇතිවිය. දයාව, කරුණාව, අනුකම්පාව, කළගුණ සැළකීම, ආගන්තුක සත්කාරය වැනි සමාජ ධර්මවලට ජනතාව අනුගත විය. උපතේ සිට මරණය දක්වා ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවක දී ම ලක් වැසියා බුදුදහමේ ආශිර්වාදය ලබා ගත්තේ ය.

සංස්කෘතික දියුණුව

බුද්ධ ධර්මයට අදළ වූ පාලි භාෂාව, සාහිත්‍ය, කලා ශිල්ප, ගෘහ නිර්මාණ ශිල්පය, අක්ෂර කලාව වැනි සංස්කෘතික අංග රැසක් අපට ලැබුණි. චිත්‍ර, මූර්ති, කැටයම් වැනි ශිල්ප කලා හෙලදිව සංස්කෘතියේ විශිෂ්ට සංස්කෘතිකාංග ලෙසින් සංවර්ධනය විය.

වෙහෙර විහාර බිතුසිතුවම්වලින් වර්ණවත් විය. බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට බෝධිඝර නිර්මාණය විය. ස්තූපවල ආරක්ෂාවට චෛත්‍යඝර ද බුද්ධ ප්‍රතිමාවේ ආරක්ෂාවට පටිමාඝර ද, භික්ෂූන් වහන්සේලාට විනය කර්ම සිදු කිරීමට උපෝසථාගාර ද, භාවනා කරන භික්ෂූන් වහන්සේලාට වැඩ සිටීමට පධානඝර ද නිර්මාණය විය.

ඉහත තොරතුරුවලට අනුව දේවානම්පියතිස්ස රජ සමයේ දී දේශපාලනික, සමාජීය, ආගමික හා සංස්කෘතික අංශවල විශාල දියුණුවක් ඇති වූ බව පෙනේ.

ක්‍රියාකාරකම 06

01. මහින්දාගමනයෙන් අපට ලැබුණු දායාද ලැයිස්තුගත කරන්න.

සාරාංශය

- දේවානම්පියතිස්ස රජ සමයේ දේශපාලන, සමාජ, ආගමික හා සංස්කෘතික අංශවල විශාල දියුණුවක් ඇති වීමට බුදුදහම පදනම් විය.

## දුටුගැමුණු මහරජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය (ක්‍රි.පූ.161-137)

ප්‍රථම වරට ලංකාවේ තුන් සිංහලය ම එක්සත් කර ඒකීය රාජ්‍යයක් ගොඩනැගූ පාලකයා දුටුගැමුණු රජතුමා ය. එම ශ්‍රේෂ්ඨ ජයග්‍රහණය පිළිබඳ තොරතුරු විස්තර කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨ නරපතියන් අතර දුටුගැමුණු මහ රජතුමා අග්‍රගණ්‍ය පාලකයකු ලෙස සැලකේ. එතුමා සම්බුදු සසුනේ චිරස්ථිතිය සඳහා සිදු කළ සේවය අදත් ලක්වැසි ජනතාව ගෞරවයෙන් සිහිපත් කරති. එතුමා රෝහණ රාජ්‍යයේ කාවන්තිස්ස රජතුමාගේ වැඩිමහල් පුත් කුමරු ය. රෝහණ රාජ්‍යයේ කාවන්තිස්ස රජතුමා රජ කරන කාලයේ රජරට ප්‍රදේශය පාලනය කළේ එළාර රජතුමා විසිනි. ඔහුගෙන් රජරට ප්‍රදේශය මුදවා ගෙන ඒකීය රාජ්‍යයක් බිහිකර ගැනීමට මහා පසුබිමක් ඇති කර දීම කාවන්තිස්ස රජතුමාගේ අභිලාශය විය.

මහා වංසයේ ප්‍රධාන වීර චරිතයක් ලෙස විස්තර කර ඇත්තේ දුටුගැමුණු රජතුමා පිළිබඳ ව ය. මේ නිසා කාවන්තිස්ස රජතුමාගෙන් සිදු වූ මෙහෙවර ගැන සඳහන් නොවේ. ධාතු වංසය, ථූප වංසය වැනි පාලි වංසකථාවල කාවන්තිස්ස රජතුමාගෙන් සිදු වූ සේවය විස්තර කර තිබේ.

- එක්සත් රෝහණ රාජ්‍යයක් ගොඩනැඟීම.
- මාගම රාජ්‍යයේ දේශ සීමා ආරක්ෂා කිරීම.
- පුතුන් දෙදෙනා එකිනෙකාට විරුද්ධව සටන් නොකරන බවට දිවුරා පොරොන්දු කරවා ගැනීම.
- දසමහා යෝධයන්ගෙන් සමන්විත හමුදාවක් ඇති කිරීම.
- දිගාමඩුල්ල ප්‍රදේශය සහලින් සංවර්ධනය කිරීම.
- අවි ආයුධ රැස්කර ගැනීම.

ඉහත දක්වෙන වැඩපිළිවෙළ දුටුගැමුණු කුමාරයාට රජරට ද්‍රවිඩ ආධිපත්‍යයෙන් මුදා ගැනීමට බෙහෙවින් ම ඉවහල් විය.

දුටුගැමුණු කුමාරයා බුත්තල සිට මහියංගනය හරහා විශාල සේනාවක් පිරිවරාගෙන රජරට බලා පිටත් විය. ද්‍රවිඩ කඳවුරු තිස්දෙකක් සමඟ සටන් කරන්නට සිදුවිය. විජිතපුර බලකොටුව බිඳ දැමීමට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවිය.

කාසපබ්බත නම් ස්ථානයේ විවේක ගැනීමෙන් පසුව ද්‍රවිඩ සතුරාට සාර්ථක ව මුහුණ දීමට දුටුගැමුණු කුමරුට හැකිවිය. දෙසේනාව අනුරාධපුර දකුණු වාසල සමීපයේ දී මුණ ගැසුණි. මෙහිදී එළාර රජතුමාට ද්වන්ද සටනකට පැමිණෙන ලෙස දුටුගැමුණු රජතුමා අභියෝග කළේ ය. ක්ෂත්‍රිය ධර්මයට අනුව අභියෝගය ප්‍රතික්ෂේප කිරීම නුසුදුසු බැවින් අභියෝගය පිළිගැනුණි. සටනින් එළාර රජතුමා මරණයට පත්විය. දුටුගැමුණු රජතුමා එළාර රජුගේ දේහය ආදාහනයෙන් පසු ව භස්මාවශේෂ තැන්පත් කර ස්මාරකයක් තැනවිය; එම ස්ථානයෙන් යන එනවිට සියලු තූර්යනාද නැවැත්විය යුතු ය, යනුවෙන් නියෝගයක් පැනවී ය. මහාවංසය රචනා කළ අවධිය වන විට ද මෙම නියෝගය ක්‍රියාත්මක ව පැවති බව මහා වංසයෙහි සඳහන් වේ.


නැවත වරක් විදේශීය සතුරකුට විරුද්ධ ව දුටුගැමුණු රජතුමාට සටන් කිරීමට සිදු විය. එළාර රජතුමාගේ මරණයෙන් දින හතකට පසුව දීඝජන්තු යෝධයාගේ බෑණා කෙනකු වූ භල්ලුක විශාල හමුදාවක් සමඟ ඉන්දියාවේ සිට පැමිණ 'කෝලම්බහාලක' නම් ස්ථානයේ දී සටන් වැදුණි. භල්ලුක මේ සටනින් පරාජයට පත්විය.

දුටුගැමුණු රජතුමා ලංකාව ම එක්සේසත් කර ආගමික හා සංස්කෘතික අතින් විශාල සේවයක් සිදු කළේ ය. දුටුගැමුණු රජතුමා ථේරවාදී බුදු සසුනට විශේෂ අනුග්‍රහයක් දැක්වූවේ ය.

### එතුමාගේ ශ්‍රේෂ්ඨ නිර්මාණ



**රුවන්මැලි මහා සෑය**



**මිරිසවැටිය**



**ලෝවාමහාපාය**

රුවන්මැලි මහා සෑය අදත් ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වූ ස්තූපයකි. ලෝවාමහාපාය මහල් නවයකින් සමන්විත වූ උපෝසථාගාරයකි. දුටුගැමුණු රජ සමයේ බුදු දහමේ විශාල දියුණුවක් තිබුණු බව අටුවා කථාවල තොරතුරුවලින් සනාථ වෙයි. එතුමා සමාජ සේවා සිදු කළ බව සාහිත්‍ය මූලාශ්‍රයෙහි දැක්වේ. ආගමික ගොඩනැඟිලිවලට අමතරව රෝහල් කිහිපයක් ද දුටුගැමුණු රජතුමා ඉදි කළ බව ථූපවංසයෙහි දැක්වේ.

එතුමා ආර්ථික වශයෙන් සිදු කළ සේවාවන් පිළිබඳ ව මහාවංසයෙහි සඳහන් නොවේ. ''මතු විය හැකි සාගත බියක් පිළිබඳව දැනගත් රජතුමා ඒ ඒ තැන්හි වැව් අමුණු බැඳ ගොවිතැන් වැඩ කරවන සේ රාජ්‍ය නිලධාරීන්ට නියෝග කර තමා ද උදලු, කැති, පොරෝ ආදි උපකරණ ගෙන්වා ගෙන ගොයම් බත් කරවීමෙහි නිරත වූ බව'' පසු කලක දී රචිත සද්ධර්මාලංකාරයෙහි සඳහන් වී ඇත. මහියංගනයේ සොරබොර වැව කරවන ලද්දේ ද දුටුගැමුණු රජතුමන් විසින් යැයි ජනප්‍රවාදයෙහි සඳහන් ව තිබේ.

දුටුගැමුණු රජතුමා අවුරුදු විසිහතරක් රජකම් කළේ ය. මේ කාලය තුළ දී එතුමා වෙසක් උත්සව විසිහතරක් පැවැත්වී ය. මෙම ශ්‍රේෂ්ඨ වීර නරපතියා මරණ මංචකයේ සැතපී සිටි මොහොත මහාවංස කතුවරයා දක්වා ඇත්තේ සැදැහැබර ලක්වාසීන්ගේ හදවත් තුළ කරුණා රසය ජනිත කරවන ආකාරයට ය. එහි දී ථේරපුත්තාභය තෙරුන් අමතා රජතුමා මෙසේ ප්‍රකාශ කළේ ය.

"පෙර මම දසමහා යෝධයන් වූ ඔබ ගෙන යුද්ධ කළෙමි. දැන් මම හුදකලාව ම මරු හා යුද පටන් ගතිමි. මරු සතුරා පරදවන්නට නොහැක්කෙමි"

එතුමා සිදු කළ යහපත් වැඩ සඳහන් කර තිබුණු පින්පොත කියවන විට ඊට සවන්දෙමින් සිටිය දී ම රජතුමා පරලෝ සැපත් විය. එතුමාගේ දේහය මහා විහාර සීමාවෙන් පිටත සාදා තිබුණු මාලකයක දී ආදාහනය කරවන ලද්දේ ය.

සිංහල ජාතියේ ශ්‍රේෂ්ඨ ජාතික වීරයකු ලෙස සැලකෙන දුටුගැමුණු මහ රජතුමාගේ දේශපාලනික, ආගමික හා සංස්කෘතික සේවය ශ්‍රී ලංකාවාසීහු අදත් ඉමහත් ගෞරවයෙන් සිහිපත් කරති.

සාරාංශය

- දුටුගැමුණු රජතුමාට එක්සත් ශ්‍රී ලංකාවක් ගොඩනගා ගැනීමට පසුබිම සකස් කළේ ඔහුගේ පිය රජතුමා ය.
- සටන මෙහෙයවීමට දුටුගැමුණු රජතුමාගේ රණශූරත්වය, යුද්ධෝපක්‍රම, අප්‍රතිහත ධෛර්යය ඉවහල් විය.
- සම්බුදු සසුනේ චිරස්ථිතියට එතුමාගෙන් විශාල මෙහෙවරක් සිදුවිය.

## දුෂ්කරතා රාශියක් ජයගත් වළගම්බා රජතුමා (ක්‍රි.පූ. 89-77)

වළගම්බා රජතුමාගේ රාජ්‍ය කාලයේ දුෂ්කරතා රැසකට මුහුණ දීමට එතුමාට සිදුවිය. එම දුෂ්කරතා ස්වෝත්සාහයෙන් ජය ගෙන ශාසනික වශයෙන් සිදු කළ සේවාවන් මෙම පාඩමෙන් විස්තර වේ.

බල්ලාටනාග රජුගේ බාල ම සොහොයුරු වට්ටගාමිණී අභය හෙවත් වළගම්බා, මහාරත්තක සෙනෙවියා මරා දමා තම පරපුරට හිමි රාජ්‍යය යළි ලබා ගත්තේ ය. එහෙත් වළගම්බා රජතුමාට වික කලක් යනතුරු රට සාමයෙන් පවත්වා ගැනීමට නොහැකි විය. එකල ඇති වූ දේශපාලන ගැටුම්වලට වළගම්බා රජතුමාට මුහුණ දීමට සිදු විය.

### වළගම්බා රජතුමාට මුහුණ දීමට සිදු වූ දේශපාලන ගැටුම්

වළගම්බා රජ වී නොබෝ කලකින් ම රුහුණේ නකුල ගමේ තීය නම් වූ තරුණ බ්‍රාහ්මණයකු විශාල අනුගාමික පිරිසක් සමග කැරැල්ලක් මෙහෙයවී ය. තීය බමුණා කැරලි ගැසීමේ අරමුණ රාජ්‍ය බලය පැහැර ගැනීම ය. වළගම්බා රජතුමා රජකම අවශ්‍ය නම් මහාතිත්ථයට ගොඩබැස සිටින ද්‍රවිඩයන් සමඟ සටන් වැදී ජය ගන්නා ලෙස තීය බමුණාට දන්වී ය. ද්‍රවිඩයන් සමඟ සටනට ගිය තීය බමුණා ඔවුන් අතින් පැරදුණි. මෙසේ උපක්‍රමශීලී ව තීය බමුණාගේ දේශපාලන බලය බිඳ දැමීමට වළගම්බා රජතුමාට හැකි විය.

ක්‍රි.පූ. 103 දී දමිළ ආක්‍රමණිකයෝ හත්දෙනෙක් මහාතිත්ථ වරායෙන් ගොඩබැස වළගම්බා රජු සමඟ සටන් වැදුණි. මෙකල රට තුළ පැවැති අස්ථාවර දේශපාලන වාතාවරණය ඔවුන්ට වාසිදායක විය. බැමිණිතියා සාය නමින් හැඳින්වූ දරුණු සාගතයක් ද ඇතිවී තිබුණි. දමිළ ආක්‍රමණිකයන් ජය ගැනීමට වළගම්බා රජතුමාට නොහැකි විය. රාජ්‍ය බලය අතහැර දැමූ වළගම්බා රජතුමා පළා ගියේ ය. පැරදී පළා යන වළගම්බා රජතුමාට විරුද්ධ ව ගිරි නම් නිගන්ඨයා වහසිබසින් කෑ ගැසී ය. මේ අවධිය වනවිට බෞද්ධාගමට වඩා හින්දු, ජෛන, බ්‍රාහ්මණ යන අන්‍ය ආගමික කණ්ඩායම්වල බලවත් වීම දැකගත හැකි ය.

## වළගම්බා රජතුමා මලය ප්‍රදේශයේ ගත කළ අවධිය

වනගත ව සිටි රජතුමා ඇතුළු රජ පවුලේ අයට පිණ්ඩපාත ආහාරයෙන් සංග්‍රහ කරමින්, රජතුමා දිරිමත් කරමින් සේනා සංවිධානයට උපදෙස් ලබා දෙමින් උදව් උපකාර කළේ කුපික්කල තිස්ස හිමියන් ය. වළගම්බා රජතුමා වනගත ව සිටි අවධියේ දී සිදු වූ විවිධ සිද්ධීන් පිළිබඳ තොරතුරු සාහිත්‍ය මූලාශ්‍රයෙහි සඳහන් වෙයි. රජතුමාගේ නොමනා හැසිරීම්වලට කළකිරුණු සෙන්පතියෝ රජු හැරදමා ගියහ.

### හම්බුගල්ලක හිමි හමුවීම

රජු හැරදමා ගිය සෙන්පතිවරු හම්බුගල්ලක විහාරයට ගියහ. ඔවුහු දෙපිලකට බෙදී සිටීම රටට බරපතල පාඩුවක් වන බව පෙන්වා දුන් උත්වහන්සේ මහාතිස්ස හිමියන්ගේ ද සහාය ලබාගෙන දෙපක්ෂය අතර සමගිය ඇති කළහ. ක්‍රමයෙන් රටවැසියා ද රජු කෙරෙහි පැහැදී රජතුමාට සහාය දැක්වූහ. වළගම්බා රජතුමා කල්යල් බලා සේනා සංවිධානය කරගෙන අවසාන දමිළ පාලකයා වූ දාඨිය මරා, යළි අනුරාධපුර රාජධානියේ පාලකයා බවට පත්විය.

## ශාසනික ඉතිහාසයේ සිදු වූ පෙරළිය

රජතුමා වනගත ව සිටි අවධියේ දී උදව් උපකාර කළ කුපික්කලතිස්ස හිමිට කළගුණ සැලකීමක් ලෙසින් ගිරි නිගන්ඨයා විසූ තැන අභයගිරිය නමින් නව ආරාමයක් ඉදිකර පෞද්ගලික ව පූජා කළේ ය. මෙම පෞද්ගලික පූජාව ශාසනික අර්බුදයකට තුඩුදුන් කරුණක් බවට පත්විය. මෙතෙක් පැවති සාංඝික ව විහාර පූජා කිරීමේ ශාසනික සම්ප්‍රදායට විරුද්ධ ව කළ මෙම පූජාවට මහාවිහාර භික්ෂූන් වහන්සේලා විරුද්ධ වූහ. ආරාමය පිළිගත් කුපික්කලතිස්ස හිමිට 'කුල සංසට්ඨ' චෝදනාව ඉදිරිපත් කර 'පබ්බාජනීය' විනය කර්මය කොට මහා විහාරයෙන් නෙරපා දැමූහ. කුපික්කල තිස්ස හිමිගේ ශිෂ්‍ය බහලමස්සු තිස්ස හිමි ද මහා විහාරයෙන් නෙරපී ය. මේ අර්බුදය නිසා භික්ෂු සමාජයේ නිකාය භේදය ඇති විය. අභයගිරි විහාරය මහායාන ධර්මයේ මූලස්ථානය බවට පත්විය.

### ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වීම

මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේලා මාතලේ අලුවිහාරයට රැස්වී මෙතෙක් කල් කටපාඩමෙන් ගෙන ආ ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කළහ. ශාසනික ඉතිහාසයේ ඉතාම වැදගත් මෙම සිද්ධිය මහාවංසයේ එක් ගාථාවකින් සඳහන් කර ඇත. මේ පිළිබඳ ව පැහැදිලි විස්තරයක් නිකාය සංග්‍රහයේ දැක්වේ. මෙම ශාසනික කාර්යය මේ රටේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායේ ප්‍රවර්ධනයට තුඩුදුන් කරුණක් බවට පත්විය.

### වළගම්බා රජතුමා ඉදිකර වූ වෙහෙර විහාර

අභයගිරි විහාරයට අමතර ව මෙතුමා විසින් සිය බිසව වූ සෝමා දේවිය නමින් සෝමාවතී චෛත්‍යය ඉදිකරවන ලදි. එතුමාගේ අමාත්‍යවරුන් විසින් දක්ඛිණ විහාරය, මූලවෝකාස විහාරය, සාලිය විහාරය, පබ්බතාරාමය, තිස්සමහාරාමය ආදී විහාර අනුරාධපුරයේ ඉදි කළ බව මහාවංසයෙහි සඳහන් වේ. අමාත්‍යවරුන්ගේ මෙම ආගමික සේවා සඳහා වළගම්බා රජතුමාගේ අනුග්‍රහය ලැබුණි.

## කාර්ය සාඵල්‍යයේ අගය

වළගම්බා රජතුමාගේ කාර්ය සංසිද්ධීන්, දුටුගැමුණු, මහා විජයබාහු වැනි ශ්‍රේෂ්ඨ නරපතියන්ගේ සේවා සමඟ සැසඳිය හැකි ය. වළගම්බා රජතුමා ද ශ්‍රේෂ්ඨ නරපතියෙකි, ජාතික වීරයෙකි. දුටුගැමුණු, මහා විජයබාහු රජවරුන් විදේශීය ද්‍රවිඩයන්ගේ ආධිපත්‍යයෙන් රට මුදවා ගෙන තිබේ. වළගම්බා රජතුමා ද ද්‍රවිඩයන්ගේ ආධිපත්‍යයෙන් ලක්දිව මුදවා ගත් පාලකයෙකි. මේ පාලකයන් දෙදෙනා මුහුණ දුන් දුෂ්කරතාවලටත් වඩා ගැටලු රැසකට වළගම්බා රජතුමාට මුහුණ දීමට සිදුවිය. එතුමා සතුරු තර්ජන මැද රට, ජාතිය හා සම්බුදු සසුන රැකගත් ශ්‍රේෂ්ඨ නරපතියෙකි.

සාරාංශය

- වළගම්බා රජතුමාට රට පාලනයේ දී දුෂ්කරතා රාශියකට මුහුණ දීමට සිදුවිය.
- හෙතෙම ස්වෝත්සාහයෙන් ම අභියෝග ජයගත් පාලකයෙකි.
- එතුමාගේ කාලයේ ශාසනික ඉතිහාසයේ සුවිශේෂී වෙනස්කම් සිදු විය.
- වළගම්බා රජතුමා ජාතික වීරවරයෙකි.

පැවරුම

01. වළගම්බා රජතුමාගේ කාර්ය සංසිද්ධීන් අගය කරන්න.

## නව රාජවංසයක් හඳුන්වා දුන් වසභ රජතුමා (ක්‍රි.ව. 67-111)

ලම්භකර්ණ වංශික වසභ රජුගේ දේශපාලනික, ආගමික හා ආර්ථික ප්‍රතිපත්ති මෙම පාඩම් ඒකකයෙන් හඳුනා ගනිමු.

වසභ ලම්භකර්ණ වංශයේ ප්‍රථම රජු ය. ඔහුගෙන් ආරම්භ වූ මෙම නව රාජවංසය වසර තුන්සිය හැත්තෑවකට වැඩි කාලයක් පැවතිණි.

- විදේශීය සතුරු තර්ජනවලින් රට ආරක්ෂා කර ගැනීම
- රටේ සාමය පවත්වා ගැනීම
- මනා පාලන ක්‍රමයක් ඇති කිරීම
- වාරි කර්මාන්ත ව්‍යාපාරය සංවර්ධනය කිරීම

වැනි කටයුතු නිසා වැසියා අතර ලම්භකර්ණ වංසය ඉතා ජනප්‍රිය විය. ඉහත කරුණු වසභ රජතුමාගේ රාජ්‍ය පාලනය සාර්ථක වීමට ද හේතු විය.

වසභ රජතුමා සම්බන්ධ ව ජනප්‍රවාද කථා ගෙතී තිබුණි. සුභ රජතුමාට වසභ නම් කෙනකුගෙන් තර්ජන එල්ල වේ යැයි දෛවඥයන් විසින් ප්‍රකාශ

කර තිබුණි. එය ඇසූ සුභ රජතුමා වසභ නමින් සිටින අය මරා දමන ලෙස නියෝග කර තිබුණි. සේනාපතිවරයකුගේ නිවසේ දී වසභ මරා දැමීමට කර තිබුණු සැලසුම එම සේනාපති ගේ බිරියට සැල වූ විගස ම ඇය මේ තරුණයා බේරා ගැනීමට උපක්‍රමයක් යෙදුවා ය. ඇය හුනු නැතිව බුලත් මල්ලක් සූදානම් කර වසභට දුනි. රජ මාළිගයේ දොරටුව අසල දී බුලත් සැපීමට හුනු නැති බව දැනගත් සේනාපති හුනු ගෙන එන ලෙස වසභට කීවේ ය. ගෙදරට පැමිණි වසභට ඔහු මරා දැමීමට සැලසුම් කර තිබෙන බව සේනාපති බිරිය පවසා මසුරන් දහසක් ඔහු අතට දී සැඟවී පළා යන ලෙස කීවා ය. වසභ මහා විහාරයට ගොස් සියලු තොරතුරු භික්ෂූන් වහන්සේලාට පැවසී ය. භික්ෂූන් වහන්සේලාගේ සංග්‍රහ ලැබ ආපසු යන අතරමග දී කුෂ්ඨ රෝගියෙක් වසභ ස්ථිර වශයෙන් ම රජ වන බවට අනාවැකියක් පළ කළේ ය. එය ඇසූ වසභ එයින් දිරිමත් ව, රුහුණු ප්‍රදේශයට ගොස් භික්ෂූන් වහන්සේලාගේ හා රට වැසියාගේ සහාය ලබා, වසර දෙකකට පසුව අනුරාධපුරයට පැමිණ සුබ හා සටන් කර රාජ්‍ය බලය පැහැර ගත්තේ ය. මේ කාලය වන විට මෞර්ය රාජ වංසයේ අවසාන පාලකයන් දුර්වල වීමත්, ඔවුන් පිළිබඳ වැසියා කළකිරී සිටි නිසාත් පොදු මහ ජනතාවගේ සහාය වසභට ලබා ගැනීමට හැකි විය.

## වසභගේ රාජ්‍ය පාලනය

වසභ අගරජු වීමට පෙර අගනුවරින් දුර බැහැර ප්‍රදේශවල බලය ලබා ගෙන සිය බලය තහවුරු කර ගැනීමට උත්සාහ ගත් බව පෙනේ. ඔහු රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා චන්ද්‍රගුප්ත මෞර්ය රජතුමාගේ ක්‍රියාකලාපයෙන් පූර්වාදර්ශ ගෙන තිබේ යැයි ඉතිහාසඥයෝ පවසති.

වසභ මධ්‍යගත පාලනය ශක්තිමත් ව පවත්වා ගැනීමට සමත් වූ පාලකයෙකි. රාජ්‍යයේ බලතල උසස් නිලධාරීන්ට, අමාත්‍යවරුන්ට හා සිය දරුවන්ට බෙදා දීම නිසා රාජ්‍ය පාලනය සාමකාමී ව පවත්වා ගැනීමට හැකි විය.

වසභගේ ආධිපත්‍යය අගනුවරින් බැහැර ප්‍රදේශවල ව්‍යාප්තව තිබුණු බව දිවයිනේ විවිධ ප්‍රදේශවලින් ලැබී තිබෙන පුරාවිද්‍යාත්මක සාක්ෂිවලින් තහවුරු වේ. වල්ලිපුරම් රන් සන්නස මේ අතරින් ඉතා වැදගත් සාක්ෂියකි. මෙම රන් සන්නස යාපන ප්‍රදේශයෙන් හමු වූවකි. 'ඉසගිරි' නම් අමාත්‍යවරයා


මේ ප්‍රදේශය පාලනය කළ බව ඉන් කියැවෙයි. මෙහි වසභ රජතුමා 'මහරජ' විරුදාවලිය භාවිත කළ බව සඳහන් වේ. මේ රන් සන්නසට අනුව ප්‍රථම වරට ලක්දිව ප්‍රාදේශීය පාලකයන් පත්කර තිබෙන්නේ වසභ රජතුමා විසිනි.

හබැස්ස ශිලා ලිපිය බුත්තල කෝරළයේ හබැස්ස විහාරය අසලින් සොයාගත් ශිලා ලිපියකි. එහි වසභ රජතුමාට 'දූටග' නමින් හැඳින් වූ පුතකු සිටි බව සඳහන් වෙයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ 'තම්මැන්නාව' අසලින් සොයා ගෙන ඇති ශිලා ලිපියේ 'උතර' නම් වසභගේ තවත් පුතකු ගැන සඳහන් වේ. මේ පුතුන් දෙපල ගැන මහා වංසයේ සඳහන් වී නැත. රුහුණු රට හා මායා රට මේ පුතුන් දෙදෙනා විසින් පාලනය කළ බව එම ශිලා ලිපි දෙකෙන් හෙළි වේ.

මඩකලපුව ප්‍රදේශයේ 'කුමවෝලෙයි' ශිලා ලිපියට අනුව නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය 'පජිනතර' නමින් හැඳින් වූ ඇමතිවරයකු විසින් පාලනය කර තිබේ. මෙම සෙල්ලිපි හමුවූයේ අගනුවරින් බොහෝ දුර බැහැර ප්‍රදේශවලිනි. වසභ රජතුමා මධ්‍යම ආණ්ඩුවේ බලතල ප්‍රාදේශීය පාලකයන්ට බෙදී යන ආකාරයට, ක්‍රමානුකූල පාලන තන්ත්‍රයක් පවත්වා ගෙන යාමට සමත් වූ පාලකයකු බව ඉහත ශිලා ලිපි මගින් අනාවරණය වේ.

මේ කාලය වන විට අසල්වැසි පාණ්ඩ්‍ය හා සොළී රාජ්‍ය දෙක බලවත් වෙමින් පැවතුණි. මතු කලක දී කිසියම් විදේශීය සතුරු තර්ජනයක් එල්ල විය හැකි යැයි සිතා රජතුමා අනුරපුර නගරය වටා විශාල ප්‍රාකාරයක් ඉදිකර ආරක්ෂාව තහවුරු කරගත් බව මහා වංසයේ සඳහන් වේ. මේ සතුරු තර්ජනය ඔහුගේ පුත් වංකනාසික තිස්ස රජුගේ කාලයේ දී ඇති විය.

වසභ රජතුමාගේ රාජ්‍ය පාලනය ක්‍රමවත් ය. ප්‍රාදේශීය පාලකයන්ට බලතල පවරා තිබුණත් මධ්‍යගත පාලනය දුර්වල නොවී ය. රට සාමකාමී ව පවත්වා ගැනීමට ඔහුට හැකිවිය.



**වල්ලිපුරම් රන් සන්නස**

## වසභ රජුගේ ආර්ථික ප්‍රතිපත්තිය

මෙරට ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තයයි. කෘෂිකාර්මික කටයුතු දියුණු කර ගැනීමට වසභ රජුගෙන් විශාල සේවයක් සිදු විය. මෙකල වාරිකර්මාන්තයේ නව පිබිදීමක් ඇති වූ කාල වකවානුවකි. රජරට වාරි කර්මාන්තයේ මහවැව් ඉදි කිරීමේ පළමු පියවර තැබුවේ වසභ රජතුමා විසිනි. වසභ රජතුමා මහ වැව් 11 ක් සහ ඇළවල් 12 ක් ඉදි කළ බව මහාවංසයේ සඳහන් වේ. ඇළහැර ඇළ, අඹන් ගඟ හරස් කර සාදන ලද්දේ ය. ඇළවල් 12 අතරින් නම සඳහන් වන්නේ ඇළහැර ගැන පමණි. මහවිලච්චිය, මානාකැටිය, හිරිවඩුන්න වැනි වැව් වසභ රජුගේ නිර්මාණ ලෙසින් සැලකේ.

ගංගා හරස් කර ඇළවේලි බැඳ කුඹුරුවලට ජලය සැපයීමට තරම් ඉහළ මට්ටමක මේ යුගයේ වාරි තාක්ෂණික දැනුම පැවති බව පෙනේ. වසභ රජුගේ වාරි ඉංජිනේරු ශිල්පීහු පොළොව යටින් උමං මගින් ජලය ගෙන යාමට සමත් වූහ. මෙසේ නළ මගින් අනුරාධපුරයේ තිසා වැවේ ජලය රන්මසු උයනේ පොකුණුවලට ගෙනගිය බව මහා වංසයේ සඳහන් වේ.

## ආගමික සේවය

වසභ රජතුමාට මහා විහාර භික්ෂූන් වහන්සේලාගේ සහයෝගය ලැබුණි. රජතුමා උන්වහන්සේලාට සිව්පසයෙන් නිතිපතා සංග්‍රහ කර ඇත. ලක්දිව බොහෝ ප්‍රදේශවල වෙහෙර විහාර ඉදිකර ඇත; එමෙන් ම බොහෝ ප්‍රදේශවල වෙහෙර ප්‍රතිසංස්කරණය කර තිබේ. ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා හිටි ප්‍රතිමා සතරක් සහිත විහාර කරවූ බව ද සඳහන් වෙයි. චිත්තල පබ්බතයේ (වර්තමාන සිතුල්පව්ව) දර්ශනීය ස්තූප දොළොසක් කර වූ බව මහා වංසයේ සඳහන් වේ. එතුමාගේ රාජ්‍ය කාලය වසර හතළිස් හතරකි.

වසභ රජතුමා යටතේ රටේ සාමකාමී දේශපාලන වාතාවරණයක් පැවතුණි. ශක්තිමත් ආර්ථිකයක් ගොඩනඟා ගැනීමට ඔහු සමත් විය. බුදු සසුනේ දියුණුවට ද එතුමාගෙන් මහත් සේවයක් සිදුවිය.

සාරාංශය

- වසභ රජුගෙන් ආරම්භ වූ ලම්භකර්ණ වංසය වසර තුන්සිය හැත්තෑවක් පමණ පැවතුණි.
- ප්‍රථම වරට ලක්දිව ප්‍රාදේශීය පාලකයන් පත් කළේ වසභ රජතුමා ය.
- එකල ලංකාවේ ක්‍රමවත් මධ්‍යගත පාලනයක් පැවතුණි.
- කෘෂිකාර්මික දියුණුවට මහත් සේවයක් වසභ රජතුමා සිදු කර ඇත.

## ධාතුසේන රජ්ජුරුවෝ (ක්‍රි.ව. 459-477)

ධාතුසේන රජතුමා පරසතුරන්ගෙන් රට මුදවා ගෙන, රජරට වාරිකර්මාන්තයේ දියුණුවට හා සම්බුදු සසුනේ දියුණුවට සිදු කළ සේවය මේ පාඩමෙන් විස්තර වේ.

ධාතුසේන රජතුමා මහත් දුෂ්කරතා මධ්‍යයේ රජ වූ කෙනෙකි. අනුරාධපුර යුගයේ දෙවන මෞර්ය රාජ්‍ය වංසය ආරම්භ වූයේ ධාතුසේන රජතුමාගෙනි. මොහු කුඩා කළ පැවිදි ව සිටි කෙනෙකි.

ක්‍රි.ව. 435 දී මිත්සෙන් රජ සමය ඉතා අවාසනාවන්ත කාල පරිච්ඡේදයකි. මොහුට රාජ්‍යයට නියම උරුමයක් නොතිබුණි. මේ කාලයේ ලක්දිව දේශපාලන වශයෙන් ව්‍යාකූල සහගත තත්ත්වයක් පැවතිණි. ඔහු රජ වී වසරක් යන්නට මත්තෙන් දකුණු ඉන්දියාවෙන් පැමිණි ආක්‍රමණිකයෝ හයදෙනෙක් මිත්සෙන් රජු මරා රාජ්‍යය පැහැර ගත්හ.

- පණ්ඩු
- පාරින්ද
- ඛුද්ද පාරින්ද
- තිරීතර
- දාඨිය
- පීඨිය

යනු මේ ආක්‍රමණිකයන් හයදෙනා ය. මොවුන් වසර විසිහතක් මේ රට පාලනය කර තිබේ.

ධාතුසේන කුමාරයා මේ වන විට අප්‍රකට ව වෙසෙමින් සේනා සංවිධානය කළේ ය. රජරට පැවති ද්‍රවිඩ පාලනයට කළකිරී සිටි වැසියා ද ධාතුසේන කුමාරයාට උදව් කළහ. රුහුණට පලාගිය කුලීනයන් ද ආපසු අනුරාධපුරයට පැමිණ ධාතුසේන කුමාරයාට සහාය දී තිබේ. එතුමාට මහා සංඝයා වහන්සේගේත් සහාය ලැබුණි.

ධාතුසේන කුමාරයා ද්‍රවිඩ පාලකයන් සියලුදෙනා සමඟ සටන් කොට අන්තිම ද්‍රවිඩ පාලකයා වූ පීඨිය මරා රාජ්‍යය ද්‍රවිඩ ආධිපත්‍යයෙන් නිදහස් කරගෙන ක්‍රි.ව. 459 දී අනුරපුර සිහසුනට පත් විය. රාජ්‍යත්වය ස්ථිර වූ පසුව ද්‍රවිඩයන්ට පක්ෂපාතී ව සිටි සිංහල කුලීනයන්ගේ ඉඩකඩම් රාජසන්තක කළේ ය. ඔහුට උදව් උපකාර කළ අයට අනුග්‍රහය දක්වා ඔවුන්ගේ පක්ෂපාතීත්වය තහවුරු කරගෙන තිබේ. රටේ පැවති වියවුල් තත්ත්වය සමථයකට පත්කොට රටේ සාමය ඇති කළේ ය. එසේම ජනතා ශුභ සිද්ධිය සඳහා ද කටයුතු කර තිබේ.

## ධාතුසේන රජුගේ ආගමික සේවය

ධාතුසේන රජතුමා සියලු නිකායික භික්ෂූන් වහන්සේලාට නොවෙනස් ව සැලකී ය. ශාසනයේ ශුභ සිද්ධිය සඳහා විහාර දහඅටක් ඉදි කරවන ලදි. උතුර, නැගෙනහිර, රුහුණ වැනි අගනුවරින් බැහැර ප්‍රදේශවල මෙම විහාර ඉදි කරවී ය.

- උතුරු ප්‍රදේශයේ ඉදි කළ විහාර : මංගණ විහාරය<br>ථූපවට්ටි විහාරය
- නැගෙනහිර ප්‍රදේශයේ : පණ්ණාවල්ලක විහාරය
- රුහුණු ප්‍රදේශයේ : දායගාම විහාරය<br>සාලවාණ විහාරය<br>හිල්ලවාණ විහාරය

ජරාවාස වූ වෙහෙර විහාර රැසක් ප්‍රතිසංස්කරණය කරවූ බව ද මහාවංශයේ සඳහන් වෙයි. එතුමාගේ නව විහාර කර්මාන්ත අතර කාලවාපි විහාරය (අවුකන විහාරය) කලාවැව සමීපයෙහි ඉදි කළ විහාරස්ථානයකි.

අවුකන හිටි පිළිම වහන්සේ ද ධාතුසේන රජසමයට අයත් ලෙසින් සැලකේ. මිහිඳු පෙරහැර ආරම්භ කිරීම මෙකල සිදු විය. රුවන්මැලි මහාසෑයට වජ්‍රචුම්බකයක් (අකුණු වළකන දියමන්තියක්) සවි කළ බව ද වංසකථාවෙහි සඳහන් වේ.



අවුකන පිළිමය

## ආර්ථික වශයෙන් සිදු කළ සේවය



කලා වැව

ධාතුසේන රජතුමාගෙන් රජරට වාරිකර්මාන්තයේ සංවර්ධනය උදෙසා විශාල සේවයක් සිදු විය. එතුමා විසින් මහවැව් 18ක් සහ ඇළක් කරවන ලදී. එම වැව් අතරින් කලා වැව සුප්‍රකට ය. කලා ඔය සහ බළලු වැව එක්කොට සාදන ලද කලා වැවට යටවී ඇති බිම් ප්‍රමාණය අක්කර 6000ට වඩා වැඩි ය. මල්වතු ඔය, කලා ඔය අතර විශාල ප්‍රදේශයකට මේ වැවෙන් ගොවිතැන්

කටයුතු සඳහා ජලය සපයා ඇත. එතුමා ඉදි කළ වැව් 18 න් නම් සඳහන් වන්නේ වැව් හතරක පමණි. මාදතුගම, මැද්දේකැටිය, යෝධවැව සහ කලා වැව යනු ඒ වැව් සතර ය.

මෙකල වාරි කර්මාන්තයේ විශිෂ්ටත්වය විදහාපාන අපූර්ව නිර්මාණය ජය ගඟ ය. මෙහි දිග සැතපුම් 55ක් පමණ වේ. කලා වැවේ සිට අනුරාධපුරයේ තිසා වැවට මෙයින් ජලය ගෙන ගියේ ය. තැනිතලා බිමක් ඔස්සේ වැවකින් තවත් වැවකට ජලය ගෙන යෑමට යොදාගත් මෙම ඇළේ දිය බැස්ම සැතපුමකට අඟලකි. මහවැලි ගඟ හරහා අමුණු බැඳ කුඹුරුවලට ජලය සැපයීමේ ව්‍යාපෘතිය මහසෙන් රජුගේ පබ්බතන්ත ඇළ තව දුරටත් පුළුල් කිරීමකි.

ධාතුසේන රජතුමා රටේ පැවති අයහපත් දේශපාලන වාතාවරණය වෙනස් කොට පරසතුරන්ගෙන් රට මුදවා ගෙන සම්බුදු සසුනේ දියුණුවටත්, රජරට ජනතාවගේ ආර්ථික ශුභසිද්ධියටත් කළ සේවය ඉතා විශිෂ්ට ය. එතුමාගේ රාජ්‍ය කාලය වසර 18කි.

## අවසාන කාලය

ධාතුසේන රජතුමාගේ අවසාන කාලය ඉතා ශෝකජනක විය. මොහුගේ වැඩිමහල් පුත්‍ර කස්සප කුමරු ය. ඔහු භින්නමාතෘක හෙවත් වෙනත් බිසවකගේ කුසින් උපන් කෙනෙකි. ධාතුසේන රජුගෙන් පසුව සිහසුනට නීත්‍යානුකූල උරුමය තිබුණේ මුගලන් කුමරුට ය. ධාතුසේන රජුගේ දූ කුමරිය ඔහුගේ සොහොයුරියගේ පුත් මිගාර සෙන්පතිවරයාට සරණ පාවා දුන්නේ ය. ලේලිය සහ නැන්දා අතර හබයක් ඇති විය. සෙන්පතිවරයා තම බිරිඳට දඬුවම් කළේ ය. ධාතුසේන රජතුමා සෙන්පතිවරයාගේ මව, එනම් තම සොහොයුරිය ගින්නෙන් දවා මැරවී ය. මින් පළිගැනීමට සෙන්පතිවරයා කස්සප කුමරුට එක්වී ය. සිහසුනට නියම උරුමය නොතිබුණු කස්සප කුමරු සිහසුන පැහැර ගැනීමට පෙළඹවී ය. කස්සප කුමරු මහලු ධාතුසේන රජතුමා සිරකර තබා පසුව මරා දැමී ය. සිහසුනට නියම උරුමය තිබුණු මුගලන් ඉන්දියාවට පැන ගියේ ය. සෙන්පතිවරයාගේ සහාය ඇතිව කස්සප කුමරු අනුරපුර රජ විය.

සාරාංශය

- ධාතුසේන කුමරු දුෂ්කරතා මැද රජ විය.
- පරසතුරන්ගෙන් රට මුදවාගෙන සාමය ස්ථාපිත කළේ ය.
- ආර්ථික හා ආගමික වශයෙන් විශාල සේවයක් කළේ ය.
- ඔහුගේ අවසාන කාලය ශෝකජනක විය.

පැවරුම

01. මුල් යුගයේ සිට ධාතුසේන රජසමය දක්වා ලක්දිවට එල්ල වූ දක්ෂිණ භාරතීය ආක්‍රමණ පිළිබඳ විස්තරයක් සපයන්න.

# 02 ශ්‍රී ලංකාවේ පිරිවෙන් ඉතිහාසය

## 1.1. පිරිවෙන් ආරම්භය හා විකාශය

### පිරිවෙන් අධ්‍යාපනයේ මුල් ම තත්ත්වය

බුදු දහම විසින් මානව වර්ගයාගේ ප්‍රත්‍යක්ෂ ඥානය මුල්කරගත් අධ්‍යාපන ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදි.

**බුදුන් වහන්සේ පස්වග මහණුන්ට ධර්මය දේශනා කිරීම බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රථම අවස්ථාව වීම**

පසු ව භික්ෂූන් වහන්සේ විසින් ධර්මය පිළිබඳ ව පණිවිඩය ලොව පුරා ප්‍රචාරය කරන ලදි. ඒ සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග,

- ගමින් ගමට ගොස් ධර්මය කියා දීම
- ජනපදවලට හා රටවලට ධර්මය ප්‍රචාරය කිරීම
- නේවාසික ව ධර්මය කියා දීම
- භික්ෂූන් වෙත පැමිණ ධර්මය කියා දීම

ක්‍රමයෙන් ඇරඹි බෞද්ධ අධ්‍යාපනය විධිමත් විෂය පද්ධතියක් දක්වා ක්‍රමික ව විකාශනය කිරීමට භාරතීය භික්ෂූන් වහන්සේ කටයුතු කළහ. ඒ අනුව ලෝකයේ බිහිවූ මුල් ම විශ්වවිද්‍යාල ලෙස,

- නාලන්දා විශ්වවිද්‍යාලය
- වික්‍රමශීලා විශ්වවිද්‍යාලය
- ජගද්දලා විශ්වවිද්‍යාලය
- ඕදන්තපුරි විශ්වවිද්‍යාලය සඳහන් කළ හැකි ය.



බුදුන් වහන්සේ ශ්‍රාවකයන්ට ධර්මය දේශනා කිරීම

## පිරිවෙන් අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ ආරම්භ වීම

මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට වැඩම කිරීමෙන් පසුව බුදු දහම ගම් දනවු නගර පුරා පැතිර යාමේ ප්‍රතිඵලයක් ලෙස බෞද්ධ අධ්‍යාපනය විධිමත් ව ලබා දීම සඳහා අනුරාධපුර නගරය මූලික කරගෙන පිරිවෙන් ආරම්භ විය.

## අනුරාධපුර යුගයේ මුල්කාලීන අධ්‍යාපනික තත්ත්වය

### මිහිඳු මහරහතන් වහන්සේ විසින් හඳුන්වා දෙන ලද අධ්‍යාපන සංකල්ප හා විෂය පද්ධතිය

- ත්‍රිපිටකය හා අට්ඨ කථා වාචනා මාර්ගයෙන් පවත්වාගෙන ඒම
- ත්‍රිපිටකය කටපාඩමින් රැගෙන ආ මහතෙරවර ''භාණක'' නමින් හැඳින්වීම
- ත්‍රිපිටකය හා අට්ඨ කථා නවක භික්ෂූන්ට ප්‍රගුණ කරවීම
- ආචාර්යවරයකුගේ මාර්ගෝපදේශයෙන් ධර්මය ඉගෙනීම
- මූලික භික්ෂු ජීවිතයට අදාළ ප්‍රතිපදා ප්‍රගුණ කිරීම



නාලන්දා විශ්වවිද්‍යාලයෙහි නටබුන්

අනුරාධපුර යුගයේ දී පිරිවෙන නමින් හඳුන්වන ලද භික්ෂු වාසස්ථාන විශාල ප්‍රමාණයක් පැවති අතර, මහා විහාරයට අනුබද්ධිත ආයතන ගණන සියයටත් වඩා වැඩි ය. තව ද එම යුගයේ ම රෝහණයේ තිස්ස මහා විහාරයට අනුබද්ධිත ව රුහුණු ප්‍රදේශය පුරා එවැනි භික්ෂු ආරාම සංකීර්ණ විශාල ප්‍රමාණයක් පිළිබඳ ව මහාවංසයෙහි තොරතුරු සඳහන් වේ.

## අනුරාධපුරයේ දී පිරිවෙන් සංකල්පය විධිමත් ව ආරම්භ වීම

### පිරිවෙන යනු

- භික්ෂූන් වහන්සේගේ වාසය සඳහා ඉදි වූ කුටිය
- භික්ෂූන් වහන්සේලා බුද්ධ ධර්මය හදාරන ස්ථානය
- භික්ෂූන් වහන්සේලා ධර්මය ප්‍රගුණ කරන ස්ථානය
- භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපන මධ්‍යස්ථානය

අනුරාධපුර යුගය වන විට බුදු දහම විධිමත් ව ඉගැන්වීමේ අවශ්‍යතාව ඇති වූ බැවින් වෙනත් විධිමත් මධ්‍යස්ථානයක් තුළ නව අධ්‍යාපන පද්ධතියක් ඔස්සේ භික්ෂූන්ට ධර්ම විනය හැදෑරීමට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස අනුරාධපුර යුගයේ දී විධිමත් පිරිවෙන් පද්ධතියක් ආරම්භ වීම සිදු විය. ඒ අනුව අධ්‍යාපන ආයතන ලෙස පිරිවෙන් ගොඩ නැගීම සිදු විය.

## වළගම්බා දවස ඇති වූ නව පිබිදීම

පාලි ත්‍රිපිටකය වාචනා මාර්ගයෙන් හෙවත් කටපාඩමින් පරම්පරාගත ව පවත්වා ගෙන එන ලද නමුදු වළගම්බා රාජ්‍ය සමයේ ඇති වූ බැමිණිතියා සාගතය හේතුවෙන් ත්‍රිපිටකය පොත්පත්වල ලිවීම ආරම්භ කරන ලදි.

මෙම සංගායනාව බෞද්ධ අධ්‍යාපනය නව මගකට යොමු කිරීමට සමත් විය. මාතලේ අලු ලෙනට රැස් වූ ථූපාරාමවාසී කුන්තගත්ත තිස්ස මහතෙරුන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් භික්ෂූන් පන්සියයකගේ සහභාගීත්වයෙන් මෙම සංගායනාව සිදු කරන ලදි.

**එම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස**

→ පොත් ලිවීම

→ කොළ හා ලිවීමේ උපකරණ සැකසීම

→ අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම

→ නිවැරැදි ව ලිවීමේ රටාව

වැනි භික්ෂු අධ්‍යාපනයේ නව අංග එක් විය. විධිමත් ලේඛන කලාවක් හා විෂය පද්ධතියක් සමඟ අනුරාධපුර යුගයේ දී ක්‍රමික පිරිවෙන් ආයතන කිහිපයක් මෙහි බිහි විය.

- අනුරාධපුර මහා විහාර පිරිවෙණ
- අභයගිරි උත්තරෝල්හ පිරිවෙණ
- කාල පාසාද පිරිවෙණ
- දීඝසන්ධ පිරිවෙණ
- ථූපාරාම විහාර පිරිවෙණ
- මිරිසවැටි විහාර පිරිවෙණ
- සුනහාත පිරිවෙණ
- පියංගු පිරිවෙණ
- රෝහණයේ තිස්ස මහා පිරිවෙණ
- අනුරාධපුර මයුර පිරිවෙණ
- දූරසංකර ග්‍රන්ථාකර පිරිවෙණ
- දීඝචංකමන පිරිවෙණ
- කප්පූර පිරිවෙණ
- මයුර පිරිවෙණ
- කාලවාපී පිරිවෙණ

යනාදි ය ඒවාට උදාහරණ වේ.

## මහායාන අධ්‍යාපන සංකල්ප

බුදු දහම දේශාන්තර වශයෙන් ප්‍රචාරය වීමත් සමඟ විවිධ නිකාය සිද්ධාන්ත මුල්කරගත් දර්ශනවාද මෙරටට පැමිණෙන්නට විය.

මහාවිහාරය - ථේරවාදී බෞද්ධ අධ්‍යාපනය
අභයගිරිය - මහායාන බෞද්ධ අධ්‍යාපනය


අභයගිරි විහාරවාසී භික්ෂූන් වහන්සේලා මහායාන බුදු දහමට ආවේණික වූ අධ්‍යාපන සංකල්ප අනුරාධපුර යුගයේ දී ක්‍රියාත්මක කළහ.

## මහායාන අධ්‍යාපනයේ පරමාර්ථ

- බෝධිසත්ව ජීවිතයකට අවශ්‍ය ශික්ෂාවන්හි පුහුණුව ලබමින් ධර්මය ධාරණය කර ගැනීම
- ත්‍රිපිටකයට පමණක් සීමා නොවීම
- වෙනත් දර්ශනවාද අධ්‍යනය කිරීම

## මහායාන අධ්‍යාපනය මෙරටට හඳුන්වා දීමේ පුරෝගාමීන්

- නාලන්දා වැනි විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලද භික්ෂූන්
- අමෝඝවජ්‍ර නම් මහායාන භික්ෂූන් වහන්සේ
- පාහියන් වැනි චීන භික්ෂූන්
- සංඝමිත්‍ර වැනි ද්‍රවිඩ භික්ෂූන්



අනුරාධපුරයේ අභයගිරිය

## ජේතවන විහාරය අනුබද්ධ අධ්‍යාපන ආයතන

මහා විහාරය, අභයගිරිය මෙන් ම නවත් ගුරුකුලයක් ලෙස ජේතවනාරාමය මුල්කරගත් අධ්‍යාපන ආයතන පද්ධතියක් ද පැවති අතර ජේතවන විහාරයට අනුබද්ධිත පිරිවෙන් ආයතන ලෙස,

- දාඨග්ගබෝධි පිරිවෙණ
- සෙනවිරත් පිරිවෙණ
- කුරුන්දමුල්ල පිරිවෙණ

පැවතුණි. ජේතවන සම්ප්‍රදාය ද රාජ්‍ය අනුග්‍රහය ඇති සිය අධ්‍යාපන කටයුතු පවත්වා ගෙන ගියේ ය.

## අනුරාධපුර යුගයේ සිදු වූ අධ්‍යාපන දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස රචනා කරන ලද ග්‍රන්ථ

- දම්පියා අටුවා ගැටපදය
- හෙරණ සික
- සිඛ වළඳ හා සික වළඳ විනිස
- සියබස්ලකර
- මහාවංසය
- දීපවංසය
- සමන්තපාසාදිකාව
- වංසත්තප්පකාසිනී
- ජාතකට්ඨකතාව

මීට අමතර ව සීගිරි කැටපත් පවුරෙහි කුරුටු ගී ලියැවී ඇත්තේ ද අනුරාධපුර යුගයේ දී ය.

## දුටුගැමුණු රාජ්‍ය සමයෙහි පිරිවෙන් අධ්‍යාපනය

දුටුගැමුණු රාජ්‍ය සමයේ දී ගිහි පැවිදි දෙපාර්ශ්වයට ම දහම් අධ්‍යාපනය ලැබීමට වැඩපිළිවෙළක් සකසා තිබිණි.

| | |
|---|---|
| ධර්ම කථික තෙරවරු | උන්වහන්සේලා විසින් ගිහි ජනතාවට ධර්මය උගන්වනු ලැබීම |
| ධර්ම කථික තෙරවරු | මෙම තෙරවරුන් විසින් ගිහි ජනයාට ධර්ම පාඨ වචනයක් වචනයක් පාසා විස්තර කර දෙනු ලැබීම |
| දිවා කථික තෙරවරු | දිවා කාලයේ ධර්මය ඉගෙනීමට ආ පිරිසට ධර්මය කියා දෙනු ලැබීම |

## පොළොන්නරු රාජධානි සමයෙහි පිරිවෙන් අධ්‍යාපනය



පොළොන්නරුව ආලාහන පිරිවෙන

අනුරාධපුර යුගයේ පැවති ථේරවාදී අධ්‍යාපනය ඒ අයුරින් ම පවත්වාගෙන යාමට පාලකයන් හා භික්ෂූන් වහන්සේ උත්සාහ දරා ඇත. පොළොන්නරු යුගයේ දක්නට ලැබෙන එක් විශේෂත්වයක් වන්නේ ථේරවාදී ආරාමික අධ්‍යාපනයට ලෞකික විෂය සම්මිශ්‍ර වීමයි. ඒ බව ගල්විහාර කථිකාවත තුළින් ගම්‍ය වේ.

පොළොන්නරුවෙහි රජ පැමිණි I විජයබාහු හා I පරාක්‍රමබාහු යන පාලකයන් ධර්ම ශාස්ත්‍රීය ප්‍රබෝධයක් ඇති කිරීමට කටයුතු කළ අතර, ශාසන සංශෝධන හා කතිකා තුළින් ඒ බැව් මනාව පැහැදිලි වේ. එවකට ආරාමික අධ්‍යාපනය නගා සිටුවීමට මූලික වූ මහ තෙරවරුන් ලෙස උදුම්බරගිරිවාසී මහාකාශ්‍යප මහ තෙරුන් වහන්සේ සඳහන් කළ හැකි ය. ගල්විහාර කතිකාවත පවා ආරාම අධ්‍යාපනයෙහි ප්‍රතිඵලයක් ලෙස බිහි විය.

පොළොන්නරු යුගයේ දී පිරිවෙන් අධ්‍යාපන ආයතනවල සිදු වූ විශේෂ වෙනසක් නම් අනුරාධපුර යුගයේ දී ''මූල''යන නමින් හැඳින්වූ ගුරු කුල අට පොළොන්නරු යුගයේ දී ''මූලායතන'' නමින් හැඳින්වීමයි.

නිකාය සංග්‍රහය හා සද්ධර්මරත්නාකරය ඇතුළු තත්කාලීන සාහිත්‍ය මූලාශ්‍රයවලට අනුව,

- දක්ෂිණ මූල
- සරෝග්‍රාම මූල
- කප්පර මූල
- මහනෙත් පාසාද මූල
- සේලාන්තර මූල
- උතුරු මූල
- වහදීපක මූල
- සේනාපති මූල

වැනි මූලායතන අටක් හා පිරිවෙණ නමින් අධ්‍යාපන ආයතන රාශියක් පොළොන්නරු යුගයේ දී පැවති බවට දක්නට ලැබේ. භික්ෂු ජීවිතය කොටස් තුනකට බෙදා අධ්‍යාපනය ලබා දීම පොළොන්නරු යුගයේ දී දක්නට ලැබේ.

| | |
|---|---|
| නවක භික්ෂූන් | උපසම්පදාව ලැබූ උපාධ්‍යයන් වහන්සේගේ නිශ්‍රයේ වසර පහක් උපදෙස් ලබමින් අධ්‍යාපනය ලැබීම. |
| මධ්‍යම භික්ෂූන් | උපසම්පදා වී වසර පහකට පසු ගුරු නිශ්‍රයෙන් මිදී ගත කරන ඊළඟ වසර පහක කාලය නිශ්‍රය මුක්ත කාලය වේ. |
| ස්ථවිර භික්ෂූන් | උපසම්පදාවෙන් වසර දහයකට පසු කාලය |

පොළොන්නරු රාජ සමයෙහි කැපී පෙනෙන ආරාමික අධ්‍යාපන ආයතන කිහිපයක් පහත දක්වේ.

- ජේතවනාරාම පිරිවෙණ
- ආළාහන පිරිවෙණ
- මහින්ද සේල පිරිවෙණ
- චෝලකුලාන්ත පිරිවෙණ

පොළොන්නරු යුගයේ දී රචනා කරන ලද ග්‍රන්ථ

- මුවදෙව්දාවත
- නිමි ජාතකය
- මහා බෝධිවංශ ගැටපදය
- සසදාවත
- අමාවතුර
- බුත්සරණ
- සිංහල ථූපවංශය
- ධර්ම ප්‍රදීපිකාව
- රසවාහිනිය

## දඹදෙණි රාජධානි සමයෙහි පිරිවෙන් අධ්‍යාපනය

දේශපාලන හේතු පදනම් කරගෙන රාජධානිය දඹදෙණියට සංක්‍රමණය වීමෙන් පසු ව ආරාමික අධ්‍යාපනයේ ක්‍රමික විකාශනයක් දක්නට ලැබේ. දඹදෙණියෙහි රජ පැමිණි III විජයබාහු රජු හා II පරාක්‍රමබාහු රජු යන පාලකයන් යටතේ ආරාමික අධ්‍යාපනය සංවර්ධනය විය. මෙම කාලය සිංහල සාහිත්‍ය පුනරුද සමයක් ඇති කාලවකවානුවකි. එහි ප්‍රතිඵලයක් ලෙස බිහි වූ දඹදෙණි කතිකාවත සඳහන් කළ හැකි ය. භික්ෂූන් වහන්සේ ලෞකිකත්වයට නැඹුරු වීම දඹදෙණි කතිකාවත තුළ අවධාරණය විය.

දඹදෙණි රාජධානි සමයෙහි ප්‍රසිද්ධියට පත් ව තිබූ පිරිවෙන් කිහිපයකි.

- දෙවුන්දර නන්දන පිරිවෙණ
- කුරුණෑගල මහේන්ද්‍ර පිරිවෙණ
- පරාක්‍රමබාහු පිරිවෙණ
- මහින්දසේන පිරිවෙණ
- අනුරාධපුර භුවනෙකබාහු පිරිවෙණ

ඒකල රචනා වූ සාහිත්‍ය කෘති

- සුසද්ධ සිද්ධි
- යෝග නිර්ණය
- පූජාවලිය
- සුබෝධාලංකාරය
- සද්ධර්මරත්නාවලිය
- එළුඅත්තනගලු වංසය

## කුරුණෑගල රාජධානි සමයෙහි පිරිවෙන් අධ්‍යාපනය

කුරුණෑගල රාජධානි සමයේ වැදගත් ම පාලකයා වශයෙන් සඳහන් කළ හැකි වන්නේ සිව්වන පරාක්‍රමබාහු රජු ය. මේ රජුගේ රාජ්‍ය කාලය තුළ ආගමික හා සාහිත්‍ය උන්නතියක් ඇති විය. ඒ අනුව,

- සිංහල ජාතක පොත
- දළදා සිරිත
- සරජෝතිමාලෙයි (ජ්‍යොතිෂ)
- අනාගත වංසය
- සිංහල බෝධිවංසය

යන කෘති රචනා වී ඇත.

කුරුණෑගල රාජධානි සමයෙහි ප්‍රසිද්ධ ව තිබූ පිරිවෙන්

- වීදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙණ
- කුරුණෑගල පරාක්‍රමබාහු පිරිවෙණ
- ගල්තුරුමූල, උතුරු මූල, විල්ගම්මූල

## කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනය

කෝට්ටේ රාජධානි සමය සිංහල සාහිත්‍යයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ස්වර්ණමය යුගයක් ලෙස සඳහන් කළ හැකි ය. එවක

- සාමකාමී දේශපාලන තත්ත්වය
- පරාක්‍රමබාහු රජු අධ්‍යාපනයට මුල් තැනක් දීම
- ප්‍රකට පිරිවෙන් මධ්‍යස්ථාන බිහි වීම
- ගිහි පැවිදි පඬිවරුන් සිටීම

යන කරුණුවලින් කෝට්ටේ යුගයේ

විධිමත් පිරිවෙන් අධ්‍යාපනයක් පැවති බව පැහැදිලි වේ. එවක රචනා කරන ලද සංදේශ සාහිත්‍ය කෘති වන ගිරා සංදේශය හා හංස සංදේශය, කෝකිල සංදේශය වැනි සංදේශ කාව්‍ය තුළ එවකට පැවති පිරිවෙන් අධ්‍යාපනයේ ස්වභාවය පිළිබඳ ව විස්තර කර ඇත.


## කෝට්ටේ යුගයේ ප්‍රකට පිරිවෙන් හා විසූ පඬිවරුන්

- තොටගමුවේ විජයබා පිරිවෙණ
- කෑරගල පද්මාවතී පිරිවෙණ
- දෙවිනුවර ඉරුගල්කුලතිලක පිරිවෙණ
- පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙණ
- වීදාගම ඝනානන්ද පිරිවෙණ
- උස්සාපිටියේ මහාපාය පිරිවෙණ
- එරබත්තොට ධර්මරාජ පිරිවෙණ
- කැලණියේ ලංකා සෙනෙවිරත් පිරිවෙණ

කෝට්ටේ යුගයේ වැඩ සිටි සුප්‍රකට පඬිවරුන් ලෙස

- විදාගම මෛත්‍රී හිමි
- තොටගමුවේ රාහුල මහතෙරුන් වහන්සේ
- තිලක පිරිවෙන්පති තෙරුන් වහන්සේ
- ධම්මදින්න විමලකිත්ති තෙරුන් වහන්සේ
- vi පරාක්‍රමබාහු රජතුමා
- වෑත්තෑවේ මහ තෙරුන් වහන්සේ
- නන්නුර්තුනෙයියාර්
- ශ්‍රී රාම චන්ද්‍රභාරතී

යනා පඬිවරුන් සඳහන් කළ හැකි ය.



වනපොත් කරන සාමණේරයන් වහන්සේලා

කෝට්ටේ යුගයේ පැවති පිරිවෙන් අධ්‍යාපන තත්ත්වය පිළිබඳ තතු එවකට රචනා කරන ලද ගිරා සන්දේශයෙහි එන මෙම පද්‍යයෙන් පැහැදිලි වේ. මෙහි සඳහන් ව ඇත්තේ තොටගමුවේ විජයබා පිරිවෙණ පිළිබඳ ව ය.

මනරම් වෙහෙර තුළ තැන තැන සපැමිණිය<br>
සිතියම් බණ වසුන් විදහා අපමණිය<br>
සිත සොම්නසින් සිහි කර කර බුදුගුණිය<br>
අබිදම් පෙළ අරුත් විමසන සඟගණිය

කෑරගල පද්මාවතී පිරිවෙණ සහ එහි අධ්‍යාපනය තත්ත්වය පිළිබඳ ව හංස සංදේශයෙහි එන මෙම පද්‍යයෙන් ද පැහැදිලි වේ.

සරණ වැඳ ගුරුන් කියවා දිනෙන් දින<br>
පරණ අලුත් පොත් පෙරළා පනින් පන<br>
දරණ කරන ලෙස ඉඳගෙන වෙනින් වෙන<br>
හෙරණ සික කියති හෙරණෝ තැනින් තැන

සමකාලීන මූලාශ්‍රයවලට අනුව එවකට කෝට්ටේ යුගයේ විධිමත් අධ්‍යාපන තත්ත්වය පිළිබඳ ව අවධාරණය වේ. එම පිරිවෙන් ආයතනවල

ගිහිපැවිදි, සිසුන් අධ්‍යාපනය ලබා ඇත. ''ෂඩ්භාෂා පරමේශ්වර'' යන නාමයෙන් ද හඳුන්වන ලද තොටගමුවේ රාහුල වැනි මහතෙරුන් වහන්සේලා කෝට්ටේ පිරිවෙන් අධ්‍යාපනයේ නියමුවන් වශයෙන් කටයුතු කර ඇත. එවකට කෝට්ටේ යුගයේ පිරිවෙන්වල පහත සඳහන් විෂය පද්ධතියකින් සමන්විත විධිමත් අධ්‍යාපනයක් තිබූ බව පෙනේ.

| ධර්ම කොටස් | භාෂා | ලෞකික විෂය |
|---|---|---|
| නිසබණ | සිංහල භාෂාව | ඡන්දස්, අලංකාරය |
| ප්‍රාතිමෝක්ෂය | පාලි භාෂාව | තර්ක ශාස්ත්‍රය |
| පිරිත්පොත | සංස්කෘත භාෂාව | වෛද්‍ය ශාස්ත්‍රය |
| විනය පිටකය | දෙමළ භාෂාව | පුරාණ |
| ත්‍රිපිටකය | මාගධී | වේදය |
| අභිධර්මය | අපභ්‍රංශ | රාමායනය |
| විවිධ දර්ශනවාද | ශෞරසේනි භාෂාව | මහා භාරතය |
| | මහාරාෂ්ට්‍ර භාෂාව | |



කෙළිදෙලෙන් ගත කරන සාමණේරයන් වහන්සේ

දේශීය සිසුන්ට අමතර ව විදේශීය සිසුන් ද මෙහි අධ්‍යාපනය ලබා ඇත. විදේශීය සිසුන්ගේ භාෂා මාධ්‍ය ලෙස සංස්කෘත, දෙමළ, මාගධි, පාලි වැනි මාධ්‍ය භාවිත විය. මෙසේ කෝට්ටේ පිරිවෙන්වල අධ්‍යාපනය ලැබීම සඳහා සිසුන් පැමිණි විදේශීය රටවල් ලෙස,

- තායිලන්තය
- කාම්බෝජය
- බුරුමය (මියන්මාරය)
- ලාඕසය
- ඉන්දියාව

යන රටවල් පෙන්වා දිය හැකි ය.

එවකට පැවති අධ්‍යාපන දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස රචනා කරන ලද සාහිත්‍ය ග්‍රන්ථ රාශියකි.

| කාව්‍ය | කෘතිය | කර්තෘ |
|---|---|---|
| මහා කාව්‍ය | කාව්‍යශේඛර මහා කාව්‍යය | තොටගමුවේ රාහුල හිමි |
| චණ්ඩ කාව්‍ය | ගුත්තිල කාව්‍යය<br>බුදුගුණාලංකාරය | වෑත්තෑවේ හිමි<br>වීදාගම මෛත්‍රෙය හිමි |
| සංදේශ කාව්‍ය | පරෙවි සන්දේශය | තොටගමුවේ රාහුල හිමි |
| | සැළලිහිණි සන්දේශය | තොටගමුවේ රාහුල හිමි |
| | ගිරා සන්දේශය | කර්තෘ සඳහන් නොවේ |
| | හංස සන්දේශය | කර්තෘ සඳහන් නොවේ |
| | කෝකිල සන්දේශය | ඉරුගල්තිලක පිරිවෙන්පති හිමි |
| උපදේශ කාව්‍ය | ලෝවැඩ සඟරාව | වීදාගම මෛත්‍රෙය හිමි |
| ප්‍රශස්ති කාව්‍ය | පැරකුම්බා සිරිත | කර්තෘ සඳහන් නොවේ |
| සිලෝ කාව්‍ය | එළුසිලෝ ශතකය | කර්තෘ සඳහන් නොවේ |
| කෝෂ ග්‍රන්ථ | රුවන්මල්දම | කර්තෘ සඳහන් නොවේ |
| ගද්‍ය ග්‍රන්ථ | සද්ධර්මරත්නාකාරය | ධම්මදින්න විමලකිත්ති හිමි |
| | එළුඅත්තනගලු වංශය | වීදාගම මෛත්‍රෙය හිමි |
| සංස්කෘත ග්‍රන්ථ | භක්ති ශතකය<br>වෘත්තමාලාව්‍යාඛ්‍යාව<br>වෘත්තරත්නාකරපංක්ෂ්චිකා | ශ්‍රී රාමචන්ද්‍ර කවිභාරතී |
| වෛද්‍ය ග්‍රන්ථ | වෛද්‍ය චින්තාමණි<br>භේසජ්ජ සංග්‍රහය<br>යෝග රත්නාකරය | |

**ක්‍රියාකාරකම් 01**

01. පිරිවෙන් අධ්‍යාපනයේ මූලික අවස්ථාව පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න.
02. අනුරාධපුර යුගයේ පිරිවෙන් අධ්‍යාපනයේ විශේෂ ලක්ෂණ මොනවාද?
03. පිරිවෙන් අධ්‍යාපනයේ ස්වර්ණමය යුගය ලෙස කෝට්ටේ යුගය හැඳින්වීම පිළිබඳ ව ඇගයීමක් කරන්න.

# 03 ශ්‍රී ලංකාවේ පිරිවෙන්වල නව ප්‍රවනතා

## ශ්‍රී ලංකාවේ පිරිවෙන්වල නව ප්‍රවනතා විමර්ශනය කිරීම

### ආරම්භය හා වර්තමාන තත්ත්වය

මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයත් සමඟ ඇරඹි පිරිවෙන් අධ්‍යාපනය මෙරට බෞද්ධ සමාජය තුළ වැඩී පෝෂණය වී සමාජය ධර්මයෙන් පෝෂණය කළ ආකාරය පෙර පරිච්ඡේදයේ දී සාකච්ඡා කරනු ලැබී ය. අනුරාධපුර රාජධානියේ සිට කෝට්ටේ රාජධානිය දක්වා බලයට පැමිණි සිංහල බෞද්ධ රජදරුවන් එවක සිටි ශාසන භාරධාරී මහතෙරුන් වහන්සේලා සමඟ එක් ව පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම සඳහා මහත් පරිශ්‍රමයක් දරනු ලැබූ බව ඉතිහාසය පිරික්සන්නකුට මනාව ප්‍රත්‍යක්ෂ වනු ඇත.

බෞද්ධ අධ්‍යාපනයේ දියුණු ම සහ ස්වර්ණ ම ය යුගයක් ලෙස කෝට්ටේ හෙවත් ශ්‍රී ජයවර්ධනපුර රාජධානි සමයෙහි පැවති පිරිවෙන් අධ්‍යාපන තත්ත්වය පෙන්වා දිය හැකි ය. ඒ යුගයෙන් පසු ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය විශාල පසුබෑමකට ලක්විමක් පිළිබඳ ව සඳහන් වේ. ඒ සඳහා පහත සඳහන් හේතු බලපාන්නට ඇතැයි සැලකේ

- යුරෝපා ජාතීන් මෙරට ආක්‍රමණය කිරීම
- මෙරට පාලකයන් විදේශීය ජාතීන් සමඟ යුද්ධ වලට පැටලී සිටීම
- දේශීය වශයෙන් අභ්‍යන්තර කැරලි කෝලාහල ඇති වීම
- දේශීය ආර්ථික තත්ත්වය පිරිහීම
- විවිධ වසංගත රෝග පැතිරීම
- කතෝලික හා ක්‍රිස්තියානි ආගම් මෙරට පැතිර වීම
- යුරෝපා ජාතීන් පාසල් හෙවත් ස්කෝල පිහිටුවා එමගින් අධ්‍යාපනය ලබා දීම
- සංඝ සමාජයට රාජ්‍ය අනුග්‍රහය නොලැබීම හේතුවෙන් පරිහානියට පත්වීම

යුරෝපීය ජාතීන්ගේ පැමිණීමත් සමඟ බුද්ධ ශාසනයට එල්ල වූ අභියෝග හමුවේ බෞද්ධ අධ්‍යාපනය එලෙස ම පවත්වාගෙන යාමට භික්ෂූන් වහන්සේලා උත්සාහ දැරුව ද රාජ්‍ය අනුග්‍රහය නොලැබීම, ක්‍රිස්තියානි හා කතෝලිකකරණය, ස්ථාවර පාලනයක් නොතිබීම වැනි කරුණු හේතුවෙන් එකී උත්සාහය ව්‍යර්ථ විය.



ශ්‍රී ලාංකේය සමාජය එසේ පරිහානි තත්ත්වයට පත්වෙමින් පවතින අතර සෙංකඩගල රාජධානි සමය පමණ වන විට භික්ෂු ශාසනයේ විශාල පසුබෑමක් දක්නට ලැබේ. බුද්ධ ශාසනය අතිශයින් ම පිරිහී ගොස් තිබුණි. ඒ අනුව,

- ඇතැම් භික්ෂූන් අඹුදරුවන් පෝෂණය කරමින් පන්සල්වල දේපල භුක්ති විඳීම
- ගණින්නාන්සේලා නමින් භික්ෂූන් පිරිසක් කටයුතු කිරීම
- භික්ෂූන් වහන්සේලා යකැදුරුකම්, වෙදකම්, නැකැත්කම් ආදියෙහි යෙදී සිටීම
- ගිහියන් මෙන් කර්මාන්ත ආදියෙහි නිරත වීම
- සියලු ශාසනික පිළිවෙත් හා සම්ප්‍රදාය අභාවයට යෑම එකල දක්නට ලැබුණි

## වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජයන් වහන්සේ

විනාශකාරී ආගමික පරිසරයක් පැවතුණු සෙංකඩගල රාජධානි සමයෙහි ශාසනික උන්නතිය උදෙසා කටයුතු කළ වැලිවිට සරණංකර සංඝරාජයාණන් වහන්සේගේ පහළ වීම සිදු වේ. 1689 ජුනි 19 දින මුදලිවරයකුගේ පුතකු ලෙස උපන් උන්වහන්සේ සූරියගොඩ විහාරස්ථානයේ දී සූරියගොඩ සාමණේරයන් වෙතින් පැවිද්ද ලබා ගත්තේ ය. පැවති දහසකුත් කරදර හා අභියෝග මධ්‍යයේ ලංකාවේ සංඝ සමාජයත් බෞද්ධ අධ්‍යාපනයත් නගා සිටුවීම සඳහා උන්වහන්සේ විසින් ගනු ලැබූ ප්‍රධාන ක්‍රියා මාර්ග කිහිපයකි.

- පාලි, සංස්කෘත, ත්‍රිපිටකය ඉගෙනීම.
- ලෙව්කේ රාළහාමිගෙන් බාලාවතාරයේ නාම කාණ්ඩයත්, සතිපට්ඨාන සූත්‍රයත් ප්‍රගුණ කිරීම.
- විපස්සනා භාවනාව ප්‍රගුණ කිරීම.
- පල්කුඹුරේ අත්ථදස්සී හෙරණපාණන්ගෙන් බාලාවතාරයේ ඉතිරි කොටස ඉගෙනීම.
- සාමණේරයන් වහන්සේලාට ධර්ම ශාස්ත්‍ර බෙදා දීමට ''සිල්වත් සමාගම'' ඇරඹීම.
- සිටිනාමළුවේ සිල්වත් නම, ඉලිපන්ගමුවේ නම, කදිරාගොඩ නම ආදී සාමණේර පිරිසකට ධර්ම විනය ඉගැන්වීම.
- සාමණේරයන්ට අවශ්‍ය ලේඛනය, හෝඩිය, සකස්කඩ ආදිය ප්‍රගුණ කිරීම මගින් ගිහියන් සඳහා ද එකී අවස්ථාව ලබා දීම.



භාවනාවේ යෙදෙන පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා

මෙකල කන්ද උඩරට රාජ්‍ය විචාරණ ලද්දේ නරේන්ද්‍රසිංහ රජු ය. මොහු විසින් සංඝරාජ ස්වාමීන් වහන්සේට අනුග්‍රහය දක්වන ලද අතර, ඒ අනුව උන්වහන්සේ කෘති රැසක් ම රචනා කරන ලදී.

- සාරාර්ථ සංග්‍රහය
- මුණිගුණාලංකාරය
- සතරබණවර සන්නය
- භේසජ්ජමඤ්ජූසා සන්නය
- අභිසම්බෝධි අලංකාරය
- මහා බෝධි වංශ සන්නය

උන්වහන්සේ ගෙන් සිදු වූ වැදගත් ම සේවාව ලෙස,

ක්‍රි.ව. 1747 රජ පැමිණි කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස තායිලන්තයට දූතයන් යවා උපාලි මහස්ථවිර ප්‍රමුඛ තායි භික්ෂූන් වෙතින් ලංකාවේ භික්ෂූන් උපසම්පදා කරවා සියවස් එකහමාරක් පමණ මෙරට නොතිබූ උපසම්පදාව යළි ඇති කිරීම පෙන්වා දිය හැකි ය.

මෙම ශාසනික උද්දීපනයත් සමඟ උන්වහන්සේට සංඝරාජ තනතුර ලැබුණු අතර මල්වතු අස්ගිරි විහාරද්වය ඇතුළු බොහෝ වෙහෙර විහාර සුරක්ෂිත කිරීම මෙමගින් සිදු විය.

## සංඝරාජ හිමිපාණන්ගෙන් පිරිවෙන් අධ්‍යාපනයට සිදු වූ සේවාව

- තමන් වහන්සේ වැඩ සිටි මහනුවර නියමකන්ද විහාරස්ථානයෙහි මුල් ම පිරිවෙන ආරම්භ කිරීම.
- ගඩලාදෙණියේ සද්ධර්මතිලක විහාරයෙහි උසස් විද්‍යාස්ථානයක් ඇති කිරීම.
- මල්වතු අස්ගිරි විහාරවල මහානායක ස්වාමීන් වහන්සේලා පිරිවෙන් අධ්‍යාපනයට විශාල දායකත්වයක් ලබා දීම.
- සිටිනාමළුවේ ධම්මජෝති හිමියන්, ශ්‍රී පාදස්ථානාධිපති ව කටයුතු කරමින් රුහුණු ප්‍රදේශයේ ධර්ම ශාස්ත්‍රාලෝකය පැතිර වීම.
- ගාල්ලේ මේධංකර හිමියන් රත්නපුර පැල්මඩුල්ල විහාරයෙහි විද්‍යාස්ථානය ආරම්භ කිරීම.



බුදු පුදට වඩින සාමණේරයන් වහන්සේලා

වැලිවිට සංඝරාජයන් වහන්සේගේ මග පෙන්වීම යටතේ ඇති වූ ධර්ම ශාස්ත්‍රීය ප්‍රබෝධයේ ප්‍රතිඵලයක් ලෙස ආරම්භ කරන ලද පැල්මඩුල්ල විහාරයේ ඇරඹි පිරිවෙන් විද්‍යාස්ථානය තුළින් බිහි වූ උගතුන් ලෙස,

- වලානේ සිද්ධාර්ථ හිමි
- ඉඳුරුවේ සුමංගල හිමි
- වස්කඩුවේ සුභූති හිමි

වැනි පඬිවරු සඳහන් කළ හැකි ය.

එම විද්‍යාස්ථානයෙන් අධ්‍යාපනය ලද වලානේ සිද්ධාර්ථ ස්වාමීන් වහන්සේ රත්මලානේ පරම ධම්මචේතිය ශාස්ත්‍ර ශාලාව ආරම්භ කරන ලදි. එහි උගත්,

| |
|---|
| • හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා ස්ථවිරයන් වහන්සේ 1873 විද්‍යෝදය පිරිවෙණ ආරම්භ කළහ. |
| • රත්මලානේ ශ්‍රී ධම්මාලෝක ස්ථවිරයන් වහන්සේ 1875 විද්‍යාලංකාර පිරිවෙණ ආරම්භ කළහ. |

එකල පිරිවෙන් අධ්‍යාපනය ආරම්භය හා දියුණුව වෙනුවෙන් පහත සඳහන් සමාගම් දෙක විශාල මෙහෙයක් ඉටු කරන ලදි.

- හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගේ ප්‍රධානත්වයෙන් 1880 දී ඇරඹි පරම විඥානාර්ථ සමාගම

- ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමාගේ ප්‍රධානත්වයෙන් ඇරඹි මහාබෝධි සමාගම

මෙම සමාගම් දෙක හා විද්‍යෝදය, විද්‍යාලංකාර පිරිවෙන් දෙක මුල්කර ගෙන මෙරට බෞද්ධ ජාතික පුනරුද ව්‍යාපාරය පිරිවෙන් අධ්‍යාපනය විධිමත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක විය.

ක්‍රි. ව. 1867 අධ්‍යාපන කොමිෂන් සභාව ද
ක්‍රි.ව. 1902 ප්‍රාචීන භාෂෝපකාර සමාගම ද

ආරම්භ කෙරිණ. 19 වන සියවසේ ඇති වූ පංච මහා වාද හා ශාස්ත්‍රීය වාද ද පිරිවෙන් අධ්‍යාපනයේ දියුණුවට හේතු විය.

1. 1864 බද්දේගම වාදය
2. 1866 උදම්මිට වාදය
3. 1865 වරාගොඩ වාදය
4. 1871 ගම්පොල වාදය
5. 1873 පානදුරා වාදය
6. සව්සත්දම් වාදය
7. නාණලළ වාදය
8. පාරුපන වාදය

## පිරිවෙන් පාලනය, සාමාජිකයින් හා එහි සංයුතිය

වැලිවිට සරණංකර සංඝරාජ ස්ථවිරයන් වහන්සේ වෙතින් ඇරඹි මෙරට බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා වරින් වර ඇති කරනු ලැබූ පරිපාලන ව්‍යුහයන් ලෙස පහත සඳහන් කරුණු සඳහන් කළ හැකි ය.

- ක්‍රි.ව. 1867 අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිරිවෙන් අධ්‍යාපනය සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දීම.
- ක්‍රි.ව. 1902 පිහිටවනු ලැබූ ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් සිංහල, පාලි, සංස්කෘත භාෂා දැනුම පරීක්ෂා කරමින් ප්‍රාචීන පණ්ඩිත විභාගය පැවැත්වීම.
- 1943 අධ්‍යාපන අමාත්‍ය සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා විසින් පිරිවෙන් උපදේශන සභාවක් පත්කොට එහි නිර්දේශ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දී සම්මත කොට ප්‍රාචීන භාෂෝපකාර සමාගම විභාග දෙපාර්තමේන්තුව යටතට පත් කොට විභාග සාමාර්ථයන්ට රාජකීය පණ්ඩිත උපාධිය පිරිනමන ලදි.
- 1959 අධ්‍යාපන අමාත්‍ය ඩබ්. දහනායක මහතා පිරිවෙන් වර්ග කොට ව්‍යවස්ථා මාලාවක් සම්මත කරන ලදි.
- 1959 වන විට විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් දෙක විශ්වවිද්‍යාල තත්ත්වයට පත් කිරීම.
- 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනත හා 1980 අංක 1 දරණ පිරිවෙන් පනත ක්‍රියාත්මක කරන ලදි. එම පනතේ අරමුණු තුනකි.

1. පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසනයෙහි ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේ අතර උනන්දුව ඇති කිරීම.

2. සැරියුත් මුගලන් තෙර පරපුරින් පැවත එන සඟ පරපුර අවිච්ඡින්නව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්මගරුක බව, භික්ෂූන් වහන්සේ තුළ ඇති කිරීම.

3. දේශීය හා විදේශීය ධර්මදූත කටයුතු මෙහෙයවීම මෙන් ම භික්ෂූන් වහන්සේට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරත වීමට අවශ්‍ය ප්‍රායෝගික දැනුම සඳහා අවශ්‍ය ශික්ෂණය ලබා දීම.

ඉහත දැක්වූ පිරිවෙන් පනතට අනුව වර්තමාන ශ්‍රී ලංකාවේ පිරිවෙන් වර්ග 3 ක් දක්නට ලැබේ. එමගින් අදාළ ගිහි පැවිදි ශිෂ්‍යයන්හට නියමිත පාඨමාලාවන් තෝරාගෙන අධ්‍යාපනය හැදෑරිය හැකි ය.

| පිරිවෙන් වර්ගය | ඉගැන්වෙන පාඨමාලා |
| --- | --- |
| මූලික පිරිවෙන් | මූලික පිරිවෙන් පාඨමාලාව<br>ධර්ම, විනය, (දහම අනුව භික්ෂූන් ප්‍රගුණ කිරීම) |
| මහ පිරිවෙන් | මූලික පිරිවෙන් පාඨමාලාව<br>ප්‍රාචීන විභාග පාඨමාලාව<br>(ප්‍රාරම්භ, මධ්‍යම, අවසාන)<br>අ.පො.ස (උ.පෙළ)<br>විශ්වවිද්‍යාලවල විභාගවලට සිසුන් ප්‍රගුණ කිරීම |
| පිරිවෙන් විද්‍යායතන | ප්‍රාචීන විභාග පාඨමාලාව<br>අ.පො.ස (සා.පෙළ)<br>අ.පො.ස (උ.පෙළ)<br>විශ්වවිද්‍යාල විභාගවලට සිසුන් ප්‍රගුණ කිරීම |

එයට අමතරව පිරිවෙන් මෙසේ ද වර්ග කළ හැකිය.

- ග්‍රාමවාසී පිරිවෙන්
- වනවාසී පිරිවෙන්
- දසසිල් මාතාවන්ගේ අධ්‍යාපන ආයතන

## ග්‍රාමවාසී පිරිවෙන්


ඉහත සඳහන් කරන ලද පිරිවෙන් සංයුතියෙහි දක්වන ලද වර්ග තුනට ම අයත් පාඨමාලා සියල්ල ග්‍රාමවාසී විහාරස්ථාන අනුබද්ධ ව පවත්වනු ලබන පිරිවෙන් ආයතන තුළ ඉගැන්වේ. එවැනි පිරිවෙන් 750කට ආසන්න ප්‍රමාණයක් දැනට ක්‍රියාත්මක වේ.

## වනවාසී පිරිවෙන්

වර්තමාන ලංකාවේ සංඝ සමාජය ග්‍රාමවාසී, වනවාසී ලෙසින් පිළිවෙත් දෙකක් දක්නට ලැබේ. වනවාසී ව ආරණ්‍ය සේනාසන, වන සෙනසුන් හා තදානුබද්ධ ආයතනවල ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම සඳහා වනවාසී සංඝ සභාව විසින් එහි මූලස්ථානය වූ වතුරුවිල ආරණ්‍ය සේනාසනය තුළ වනවාසී පිරිවෙණ පවත්වාගෙන යනු ලබයි. එය ආරම්භ කරනු ලැබුවේ වනවාසී මහ නිකායේ මහානායක වතුරුවිල ඥාණානන්ද ස්වාමීන් වහන්සේ විසිනි. මෙම පිරිවෙණ මගින් මූලික පිරිවෙන් පාඨමාලාව, ධර්ම, විනය, භාවනාව හා වනවාසී භික්ෂු පිළිවෙත හා වනවාසී සේනාසන පරිපාලනය පිළිබඳවත්, භික්ෂු ජීවිතය සතු ශාසනික පිළිවෙත් හා ආධ්‍යාත්මික හික්මවීම කෙරෙහිත් වැඩි අවධානයක් යොමු කරනු ලබයි.

## දසසිල් මාතාවන්ගේ අධ්‍යාපන ආයතන

මේ වන විට ලංකාවේ දසසිල් මාතාවන් විශාල ප්‍රමාණයක් වැඩ සිටින අතර විවිධ ප්‍රදේශවල පවතින ආරාම මුල් කරගෙන අධ්‍යාපන මධ්‍යස්ථාන පිහිටුවා කුඩා දස සිල් මාතාවන්ගේ අධ්‍යාපන තත්ත්වය වර්ධනය කිරීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව මාතර මූලටියන, මීනුවන්ගොඩ, මානෙල් වත්ත, මහනුවර, කලුතර ආදී ප්‍රදේශවල අධ්‍යාපන ආයතන මගින් සිල් මාතාවන් සඳහා අධ්‍යාපනය ලබා දීම සිදුවේ.



දස සිල් මාතාවක්

**සාරාංශය**

- වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජයාණන් වහන්සේ ශ්‍රී ලංකාවේ භික්ෂු අධ්‍යාපනය නැවත නගා සිටුවීමේ පුරෝගාමියා විය.
- එයින් ඇති වූ ධර්ම ශාස්ත්‍රීය ප්‍රබෝධය මත විද්‍යෝදය, විද්‍යාලංකාර පිරිවෙන් ආරම්භ වීම හා පසුකාලීනව ඒවා විශ්වවිද්‍යාල මට්ටමට උසස් කිරීම සිදු විය.
- ලංකාවේ පිරිවෙන් සංයුතිය හා පිරිවෙන් වර්ග හා පිරිවෙන් අධ්‍යාපන පාඨමාලා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.

පැවරුම

01. කෝට්ටේ යුගයෙන් පසු පිරිවෙන් අධ්‍යාපනය බිඳ වැටීමට හේතු වූ කරුණු පිළිබඳ ව ප්‍රාමාණික විස්තරයක් කරන්න.

02. ලංකාවේ බිඳ වැටුණු පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම සඳහා වැලිවිට සරණංකර සංඝරාජ ස්වාමීන් වහන්සේ වෙතින් සිදු වූ සේවාව අගයන්න.

03. වර්තමාන ශ්‍රී ලංකාවේ පිරිවෙන් වර්ගීකරණය කොට එහි පාඨමාලා වෙන් වෙන් ව දක්වන්න.

# 04 ශ්‍රී ලංකාවේ අනන්‍යතාව අගයමු

## 4.0 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව පෙන්වා දීමත් එම අනන්‍යතාව පෙන්නුම් කරන සංකේත හඳුන්වා දීමත් මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

## 4.1 ජාතික අනන්‍යතාව

ලෝකයේ සෑම රටක ම ඒ ඒ රටට ආවේණික වූ සම්ප්‍රදායයන්, ජාතික සිරිත් විරිත් හා ජාතිකත්වය නිරූපණය කෙරෙන සාධක තිබේ. ශ්‍රී ලාංකිකයන් වන අපට ද එවැනි ජාතිකත්වයක් හා අනන්‍යතා ලක්ෂණ තිබේ. අපට ආවේණික වූ සුවිශේෂ ලක්ෂණ තුළින් ශ්‍රී ලාංකිකත්වය පිළිබිඹු වේ. ඒවා මොනවා දැයි දැන් සොයා බලමු.

අතීතයේ පැවති ශ්‍රී ලාංකික බෞද්ධ සමාජය අද බහු සංස්කෘතික ලක්ෂණ පිළිබිඹු කෙරෙන බහුභාෂික, බහු වාර්ගික, බහු ආගමික රටක් ලෙසින් හැඳින්වීමට සිදු වී තිබේ. විවිධ භාෂා කතා කරන, විවිධ ආගම් අදහන, විවිධ ජන වර්ග වෙසෙන රටක් බවට පත්ව තිබෙන ශ්‍රී ලංකාව තුළ ඒවා අප වෙන් වෙන් ව හඳුනා ගත යුතු ය.

**අප රටේ ජීවත් වන ජන වර්ග**

- සිංහල
- දෙමළ
- මුස්ලිම්
- බර්ගර්
- මැලේ
- වෙනත්

අප රටේ පවතින ප්‍රධාන ආගම්

- බෞද්ධ
- හින්දු
- ඉස්ලාම්
- ක්‍රිස්තියානි

අපේ ජනතාව භාවිත කරන ප්‍රධාන භාෂා

- සිංහල
- දෙමළ
- ඉංග්‍රීසි

මෙම බෙදීම් හමුවේ රට තුළ වෙසෙන සියලු පුරවැසියන් ජාතික වශයෙන් එක්සත් ව එක්සිත් ව 'ශ්‍රී ලාංකික' යන හැඟීමෙන් යුතුව කටයුතු කිරීම අද යුගයේ අවශ්‍යතාවකි.

ක්‍රියාකාරකම 4.1

01. ශ්‍රී ලංකාව තුළ වෙසෙන ජාතීන් නම් කරන්න.
02. අපේ රටේ ජනතාවගේ ආගම් මොනවා ද?

## 4.2 ජාතික අනන්‍යතාව පෙන්නුම් කෙරෙන සංකේත

- ජාතික කොඩිය
- ජාතික ගීය
- රාජ්‍ය ලාංඡනය
- ජාතික වෘක්ෂය
- ජාතික පුෂ්පය
- ජාතික පක්ෂියා
- ජාතික ක්‍රීඩාව

ශ්‍රී ලංකාවේ පිරිවෙන් පද්ධතියේ අනන්‍යතාව පෙන්නුම් කිරීම සඳහා පිරිවෙන් ලාංඡනය ද දූනට භාවිත වේ.

**ක්‍රියාකාරකම 4.2**

01. ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව පෙන්නුම් කරන ප්‍රධාන සාධක 5 ක් ලියන්න.

## 4.2.1. ශ්‍රී ලංකා ජාතික කොඩිය

ලොව ශිෂ්ටාචාරවත් හැම රටක ම ජාතික අනන්‍යතාව ප්‍රකාශ කරන සංකේත අතර සුවිශේෂ ස්ථානයක් ජාතික කොඩියට හිමි වේ. ශ්‍රී ලංකාවේ ජාතික සමගිය හා ප්‍රගතියට ජාතික කොඩිය සුවිශේෂී සංකේතයකි.

ඉන්දියාවේ සාංචි ස්තූපයේ ඇති සිංහ රූපය සහිත ව ඇති කොඩියෙන් විජය කුමරු ලංකාවට පැමිණීම නිරූපණය වන බව විශ්වාස කෙරේ.

ලංකාවේ අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කොඩිය ඇසුරින් නිර්මාණය වූ අපේ ජාතික කොඩිය සිංහ කොඩිය ලෙස ද හඳුන්වයි.

ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා වූ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා විසින් 1948 මාර්තු 06 වන දින පත් කරන ලද කමිටුවේ නිර්දේශය මත ලංකා ජාතික කොඩිය නිර්මාණය කර ඇත.

ලංකා ජාතික කොඩියේ නිර්මාතෘ කමිටුව

- එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරණායක මහතා (කමිටු සභාපති)
- මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා (ලේකම්)
- සර් ජෝන් කොතලාවල මහතා
- ජේ. ආර්. ජයවර්ධන මහතා

- ටී.බී. ජයා මහතා
- ජී.ජී. පොන්නම්බලම් මහතා
- ආචාර්ය එල්.ඒ. රාජපක්ෂ මහතා
- කමිටුවේ නිර්දේශ අනුව සකස් වූ ලංකා ජාතික කොඩිය 1951 මාර්තු 02 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලදි.

ක්‍රි.ව. 1972 දී ශ්‍රී ලංකා ජාතික කොඩියේ මුලු හතරේ තිබූ පැරණි සංකේත හතර වෙනුවට වර්තමානයේ පවතින බෝ පත් හතර එකතු කර ඇත. ඊට මූලිකත්වය ගෙන ක්‍රියා කරන ලද්දේ එවකට සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ආචාර්ය නිශ්ශංක විජේරත්න මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතු කණ්ඩායමකි.

## ජාතික කොඩියේ සංකේත



ජාතික කොඩිය

වර්ණ

| | |
|---|---|
| රතු පාට පසුබිම | : අභිමානය, ශ්‍රී ලංකාව තුළ වෙසෙන සියලු ජනයාගේ ජීව රුධිරය, පැරණි සිංහල රාජකීය ධජය නියෝජනය |
| තැඹිලි පාට තීරුව | : දෙමළ ජනතා නියෝජනය |
| කොළ පාට තීරුව | : මුස්ලිම් ජනතා නියෝජනය |
| කඩුව අතින් ගත් සිංහයා | : සිංහල ජාතිය, සිංහල ජාතියේ විනය ගරුක බව, නිර්භීතකම, අභිමානය, නායකත්වය හා සාධාරණත්වය |
| බෝපත් සතර | : මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ තුළින් සියලු ආගම්වලට ගරු කිරීමේ උතුම් ගුණාංගය |

| | |
|---|---|
| කොඩිය වටා එක සමාන පළලකින් යුත් කහ පැහැති තීරුව | : සියලු ජාතීන් අතර එකමුතුකම, සාමය, ප්‍රඥාව, එකිනෙකා අතර අවබෝධය |
| සිංහයාගේ හිසේ කේශර හා වලිගයේ නැමුණු ඉහළ කොටස | : පාලකයා හා රටවැසියා අතර සමානාත්මතාව පැවතීම |

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන ව්‍යවස්ථාව තුළ ජාතික කොඩිය පිළිබඳ තොරතුරු සඳහන් වේ.

## ජාතික කොඩිය ඔසවනු ලබන අවස්ථා

- ජාතික උත්සව
- රාජ්‍ය උත්සව
- රාජ්‍ය නායක සමුළු
- විශේෂ ජාතික උත්සව
- පිරිවෙණක, පාසලක හෝ රාජ්‍ය ආයතනයක විශේෂ උත්සව

## ජාතික කොඩිය ඔසවන ලද අවස්ථාවක විනය

- එසවීමට පළමු ව යොතට සවිකර ගොනු කර උස් ස්ථානයක තැබීම.
- කොඩිය ඔසවන තැනැත්තා සිරුවෙන් සිට එසවීම.
- අනෙක් සියලුදෙනා ම නැගිට කොඩිය දෙසට මුහුණලා සීරුවෙන් සිටීම.
- කොඩිය එසවීමේ දී හා පහත් කිරීමේ දී ක්‍රමවත් පරිදි ගෞරවාන්විත ව සිදු කිරීම.
- කොඩිය ඔසවන අවස්ථාවල දී මගුල් බෙර හා ශංඛ නාද පැවැත්වීම.
- ඔසවා අවසන් වූ පසු සියලු දෙනා සීරුවෙන් සිට ගැනීමෙන් අනතුරුව ජාතික ගීය ගායනය කිරීම.

## ජාතික කොඩිය ප්‍රදර්ශනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

- පැහැදිලිව ම ප්‍රදර්ශනය වන ස්ථානයක ඔසවා තැබීම.
- සිරස, වර්ණ තීරු දෙක කොඩි ගස දෙසින් සිටින පරිදි ඔසවා තිබීම.
- ඔසවන ලද වෙනත් කොඩි අතර ජාතික කොඩියට ප්‍රමුඛත්වය ලබා දීම.
- වෙනත් රටවල ජාතික කොඩි සමග ඔසවන විට සමාන උසකින් තැබීම හා අපේ ජාතික කොඩිය දකුණු පසින් තැබීම.
- රාත්‍රී කාලයේ දී ඔසවා තබා ඇති විට ජාතික කොඩියට ආලෝකය ලබා දීමට සැලැස්වීම.
- පෙරහැරක ගෙනයන විට දකුණු පසින් ගෙන යා යුතු අතර වෙනත් කොඩි සමග ගෙනයන විට කොඩිපෙළ මැද ඉදිරියෙන් ගෙන යාම.
- ජාතික කොඩිය සැරසිල්ලක් ලෙස යොදාගැනීම හා වැරදි ලෙස එල්ලා තැබීම නොකල යුතුය.

## 3.2.3. ශ්‍රී ලංකා ජාතික ගීය

- 'ජාතික ගීය' රටක ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේතයකි
- 'ශ්‍රී ලංකා මාතා' ගීතය අපේ රටේ ජාතික ගී යයි.
- ජාතික ගීයේ නිර්මාතෘවරයා ආනන්ද සමරකෝන් මහතා
- මාතෘ භූමිය පිළිබඳ භක්තිය, ගෞරවය, අභිමානය මෙන් ම ආදරය ද ජාතික සමගිය ද මීත් ජනිත වේ.

## ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

### ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථා

- ජාතික උත්සව
- රාජ්‍ය උත්සව
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායක උත්සව
- පාසල් හා පිරිවෙන්වල පොදු වැදගත් උත්සව
- ශ්‍රී ලංකාව නියෝජනය කරන අන්තර්ජාතික තරග
- වෙනත් විශේෂිත උත්සව



ජාතික ගීය ගායනා කරනු ලැබූ අවස්ථාවක ඡායා රූපයක්

- නියමිත තනුවට අනුව නිවැරදි උච්චාරණයෙන් ශබ්ද නගා ගායනා කළ යුතු ය.
- ජාතික ගීය ගායනා කරන විට සීරුවෙන් සිට එයට ගෞරව දැක්වීම ද කළ යුතු ය.

## ජාතික ගීයක අවශ්‍යතාව

අප රට ඉංග්‍රීසි ආධිපත්‍යයෙන් නිදහස ලබා ගැනීමට කටයුතු කළ අවධියේ දී ලංකා ගාන්ධර්ව සභාව යටතේ ජාතික ගී තරගයක් පවත්වන ලදි. එසේ ලැබුණු ගීතවල වැදගත්කම විමසා බැලීමට සිංහල හා ද්‍රවිඩ විනිශ්චය මණ්ඩලයක් පත් කෙරිණි. මණ්ඩලයේ සාමාජිකයන් ලෙස,

- ආචාර්ය ඩී.එච්.ඩී.ඒ. විජේසේකර මහතා
- එස්.එල්.බී. කපුකොටුව මහතා
- ලයනල් එදිරිසිංහ මහතා
- එල්.එල්.කේ. ගුණතුංග මහතා
- පී.බී. ඉලංගසිංහ මහතා
- මුදලිඳු ඊ.ඒ. අබේසේකර මහතා

පත් කරනු ලැබූහ.

- ජාතික ගී තරගය 1948 ජනවාරි 31 පවත්වනු ලැබී ය.
- මේ තරගයෙන් ජය ලැබුවේ පී. බී. ඉලංගසිංහ මහතා රචනා කරන ලද 'ශ්‍රී ලංකා මාතා පාලා යස මහිමා ජය ජය' යන ගීයයි.
- මෙම ගීතය සංගීතවත් කළේ ලයනල් එදිරිසිංහ මහතා විසිනි.
- 1948 පෙබරවාරි 04 දින පවත්වනු ලැබූ පළමු නිදහස් සමරු දිනයේ දී ගායනය කරනු ලැබුවේ මේ ජාතික ගීයයි.
- මේ ගීයට විනිශ්චය මණ්ඩලයේ ම දෙදෙනකු සම්බන්ධ වී තිබූ නිසාම එයට ජනතා විරෝධය ඇති වූ හෙයින් එය භාවිතයෙන් ඉවත් කරනු ලැබී ය.
- දෙවන නිදහස් දින උත්සවයේ දී ආනන්ද සමරකෝන් ශූරීන් විසින් රචිත (ජාතික ගී තරගයට ඉදිරිපත් කරන ලද) 'නමෝ නමෝ මාතා' යන ගීතය ජාතික ගීතය ලෙස ගායනය කරනු ලැබී ය.
- 1951 නොවැම්බර් 22 දින කැබිනට් මණ්ඩලය විසින් නිල වශයෙන් අනුමත කරන ලද මෙම ගීතය අප රටේ ජාතික ගීය ලෙස පිළිගන්නා ලදී.
- මෙම ගීතයේ නමෝ නමෝ මාතා යන මුල් පද පේළිය ශ්‍රී ලංකා මාතා ලෙස වෙනස් කර ගායනා කරන ලද්දේ 1961 පෙබරවාරි මාසයේ දී ය.
- 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළ ද අප රටේ ජාතික ගීය ' ශ්‍රී ලංකා මාතා' ජාතික ගීය බව ද, ජාතික ගීයේ පද මාලාව හා සංගීතය පිළිබඳව තුන්වන උපලේඛනයෙහි ද සඳහන් කර ඇත.
- ජාතික ගීයේ යම් සංශෝධනයක් කිරීමට අවශ්‍ය වන්නේ නම් ඊට ජනමත විචාරණයක් පැවැත්විය යුතු ය.

**ක්‍රියාකාරකම 4.2.3**

01. ජාතික ගීයේ නිර්මාතෘවරයා නම් කරන්න.
02. ජාතික ගීය ගායනය කරනු ලබන අවස්ථා තුනක් සඳහන් කරන්න.
03. 1948 පෙබරවාරි 04 දින පවත්වනු ලැබූ පළමු නිදහස් සමරු දිනයේ දී ගායනා කරනු ලැබූ ජාතික ගීයේ නිර්මාතෘවරයා කවුද?
04. ජාතික ගීය කැබිනට් මණ්ඩලය විසින් නිල වශයෙන් අනුමත කරන ලද්දේ කවදා ද?

## 4.2.3. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය

- මෙය නම් කර ඇත්තේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ රාජ්‍ය ලාංඡනය යනුවෙනි.
- ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වූ 1972 මැයි 22 දින සිට මෙම රාජ්‍ය ලාංඡනය පැවති රාජ්‍ය ලාංඡනයට ආදේශ විය.
- මුදල් නෝට්ටු, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ලිපි ශීර්ෂ, විදේශ ගමන් බලපත්‍රය, ජාතික හැඳුනුම්පත ආදී ලේඛනවලට මෙම ලාංඡනය භාවිත කෙරේ.
- රාජ්‍ය අයිතිය, රාජ්‍ය අනන්‍යතාව තහවුරු කරනු ලබන සංකේතය රාජ්‍ය ලාංඡනයයි.



ධර්ම චක්‍රය - ධාර්මිකභාවය හා සාධාරණත්වය
වී කරල් - සශ්‍රීකත්වය/සෞභාග්‍යය
නෙළුම් පෙති (පළා පෙති) - පිවිතුරු බව
කඩුවක් අතින් ගත් සිංහයා - නිර්භීත බව /පෞරුෂත්වය
පුන්කලස - සමෘද්ධිමත් බව / පරිපූර්ණ බව
ඉර සහ සඳ - සදාකාලික පැවැත්ම

- රාජ්‍ය ලාංඡනය නිර්මාණය කර ඇත්තේ පුරාවිද්‍යා චක්‍රවර්තී එස්.එම්. සෙනෙවිරත්න නම් චිත්‍ර ශිල්පියා විසිනි.

## 4.2.4. ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය



**ජාතික වෘක්ෂය - නා ගස**

උද්භිද විද්‍යාත්මක නාමය - *Mesua nagassarium*
තෝරා ගන්නා ලද්දේ 1986 පෙබරවාරි 26

**ජාතික වෘක්ෂය ලෙස නා ගස තෝරා ගැනීමට හේතු**

- ශ්‍රී ලංකාවට උරුම ශාකයක් වීම. (ඒක දේශීය)
- ඉතා ශක්තිමත් වීම සහ දීර්ඝ කාලයක් පැවතීම.
- ඉතා සෞම්‍ය පියකරු සුවඳක් වහනය වන මල් සහිත වීම.
- ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත ව පැවතීම.
- සර්ප විෂට සහ ප්‍රධාන රෝගාබාධ රැසකට ප්‍රතිකාර සඳහා ගනු ලබන ඖෂධ පංචාංගයක් සහිත වීම.

- මංගල, සුමන, රේවත හා සෝභිත යන සිව් බුදුවරුන් බුද්ධත්වයට පත්වූයේ නා සෙවණෙහි බව සැලකේ.
- මෛත්‍රී බුදුන් බුදුබව ලැබීමට නියමිත ව ඇත්තේ ද නාගස් සෙවණක දී ය.

**ක්‍රියාකාරකම 4.2.3**

01. ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයේ ඇති පහත සඳහන් සංකේත මගින් පිළිබිඹු වන්නේ මොනවාද?

* වී කරල්
* නෙළුම් පෙති
* ඉර සහ සඳ

## 4.2.5. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය



- ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය - නිල් මානෙල් මල (Blue Lotus)
- තෝරා ගත් දිනය - 1986.02.26
- සිංහල භාෂාවෙන් - නිල් මානෙල්/නිලුපුල්/නීලුප්පල/ඉන්දීවර
- හින්දි - නීලෝත්පල
- දෙමළ - නීලෝත්පල
- 2016 දී ,ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය ලෙස මානෙල් මල නම් කර ඇත.

උද්භිද නාමය - *Nymphaea stellata*

**ජාතික පුෂ්පය ලෙස නිල් මානෙල් මල තෝරා ගැනීමට බලපෑ හේතු**

- බුදුරජාණන් වහන්සේගේ සිරි පතුලෙහි ඇති මඟුල් ලකුණුවලින් එකක් වීම.
- උපුල්වන් දෙවියන් හා සම්බන්ධ කෙරෙන පුෂ්පයක් වීම.

- වර්ෂය පුරා මල් පිපෙන ශාකයක් වීම
- ඒක දේශීය ශාකයක් වීම.
- දේශීය වෛද්‍ය විද්‍යාව තුළ නිල් මානෙල් ශාකයේ සෑම අංගයක් ම (අල, දඬු, මල්, රේණු, ඇට) ඖෂධීය කොටස් ලෙස භාවිත වීම.

සීගිරි චිත්‍රවල එන කාන්තාවන් අත නිල්මානෙල් මල් ද ඇතිබව පහත පද්‍යයෙන් පෙනේ. මෙවන් වැදගත්කමක් ඇති නිල් මානෙල් මල අපි ජාතික පුෂ්පය ලෙස අගයමු.

නිල් කට්රොල් මලෙක - ඇමුණු වැටි කොළ මල් සෙය්
සැන්දගැ සිහිවෙන්නයි - මානෙල් වනක් හය් රන්වන් හුන්

## 4.2.6. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා

ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා - වළි කුකුළා (Ceylon Jungle Fowl)



මේ පක්ෂියා තෝරා ගැනීමට හේතු

1. ඉතා අලංකාරවත් වර්ණ කිහිපයකින් යුත් පිහාටු ඇති දකුම්කලු සතකු වීම.
2. ශ්‍රී ලංකාවට පමණක් ආවේණික දේශීය පක්ෂියකු වීම.
3. දිවයින පුරා ම වනාන්තර ආශ්‍රිත ව දකගත හැකිවීම.

4. එඩිතර සටන්කාමී කඩිසර සතකු වීම.
5. ලාංකික ගැමි ජීවිතය හා බැඳුණු සමීප සම්බන්ධතාව
6. අරුණෝදය ළඟා වෙන බව දැක්වීම.
7. රංචු වශයෙන් ජීවත් වීම.
8. වර්තමානයේ සීග්‍රයෙන් වඳවී යන සත්ත්ව විශේෂ අතරට අයත් පක්ෂියෙක් වීම.
9. ආරක්ෂාව පතා උස් ස්ථානවලට පියාඹා යාම.
10. පැරණි ජන සාහිත්‍යයෙහි මෙන් ම සන්දේශ සාහිත්‍යයෙහි ද වළිකුකුළා පිළිබඳ තොරතුරු ඇතුළත් වී ඇත.
11. අන්‍යෝන්‍ය සහයෝගය වළිකුකුළා සතු සුවිශේෂී ලක්ෂණයකි.

රිවිතැවුලේ පිපි කමලේ විල් ගැවසී
මත කොවුලේ තුරු වදුලේ හඬන නිසී
වන සැවුලේ මග අසලේ පොර සැලසී
ගුරු බැවුලේ යව අවුලේ නොවී කිසී
(සැළලිහිණි සංදේශය)

- අපටම ආවේණික වන මෙන් ම සීඝ්‍රයෙන් වඳවී යන සත්ත්ව ගණයට අයත් පක්ෂියකු වන වළිකුකුළා අප ආරක්ෂා කර ගත යුතු පක්ෂියෙකි. වළිකුකුළා ඇල්ලීම, රඳවා තබා ගැනීම, ඝාතනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස නීති ගත කොට ඇත.

## 4.2.7. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව



1. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව  අත් පන්දු ක්‍රීඩාවයි. (Volley Ball)
2. 1885 දී මේ ක්‍රීඩාව ලොවට හඳුන්වා දී ඇත්තේ විලියම් ජී. මෝගන් මහතා ය. එහි ආරම්භය සිදුවන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ හෝලියොක් නගරයෙනි.
3. මෙම ක්‍රීඩාව ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන්නේ ක්‍රි.ව. 1916 දී ඇමරිකානු ජාතික රොබට් වෝල්ටර් නම් ක්‍රීඩා අධ්‍යක්‍ෂවරයා ය.
4. Volley Ball සාමූහික ක්‍රීඩාවක් වන අතර ලංකාව පුරා ම ව්‍යාප්ත ව ඇත.

## 4.2.8. පිරිවෙන් ධජය

සමස්ත ලංකා පිරිවෙන් කෘත්‍යාධිකාරී පරිවේණාධිපති සංගමය විසින් පිරිවෙන් ඒකකයේ අනුමැතිය ඇති ව මුලු මහත් පිරිවෙන් ක්ෂේත්‍රයට ම බලපාන පරිදි පිරිවෙන් ධජය ඉදිරිපත් කරනු ලැබ ඇත.

ක්‍රි.ව. 2003.03.03 දින පැවති නියෝජිත මහ සභාවේ දී එය අනුමත කර ගන්නා ලදි.



1. **කහපාට පසුබිම** - සඟ සසුනේ අනන්‍යතාව
2. **දුඹුරුපාට කොටස** - විනය ශාසනයේ ආයුෂ යන්න ඉදිරිපත් කර තිබීම. ඒ තුළින් සඟ සසුනේ ආර්ය සංවර ශීලයෙහි ශික්ෂිත බව සංකේතවත් කරයි.
3. **පහන** - ධර්ම චක්‍රය ඉදිරියේ ඇති පහන ඥානාලෝකයෙන් ධර්මාලෝකයට පිවිසීම සංකේතවත් කරයි.
4. **ධර්ම චක්‍රය** - ක්‍රි.පූ. 3 වන සියවසේ පමණ මහාධිරාජ අශෝක විසින් නිර්මාණය කරන ලද ධර්ම චක්‍ර සලකුණ මෙයයි. ඉන්දියාවේ ජාතික කොඩියට ද මේ ධර්ම චක්‍ර සලකුණ භාවිත කෙරේ. ධර්ම චක්‍රය වටා ඇති සුදු පාට තීරුවෙන් භික්ෂූන් වහන්සේගේ පිරිසිදු බව අර්ථවත් කරනු ලැබේ. ධර්ම චක්‍රයේ ඇති අර 24න් හා අර්ධ බෝපත් හැඩ ඇති සලකුණුවලින් බුද්ධ, ධම්ම, සංඝ යන තුනුරුවන්ගේ සූවිසි මහා ගුණ හා සූවිසි ප්‍රත්‍ය සංකේතවත් කෙරේ.
5. **ධර්ම චක්‍රය මධ්‍යයේ ඇති නෙළුම් මල** - බෞද්ධ විමුක්ති මාර්ගයේ පරම නිෂ්ඨාව වන නිවන් ධ්‍රැවය ප්‍රකාශිත වේ.
6. **හතරැස් කොටුවේ මුළු හතරේ ඇති නෙළුම් මල් හතර** - බුදු සසුනේ සිවුවනක් පිරිස ලෙස හඳුන්වනු ලබන භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා යන පිරිස නියෝජනය වේ.

# 05 ලෝක ශිෂ්ටාචාරවල ආරම්භය හා වර්ධනය

ලෝකයේ මානව ඉතිහාසය යුග කිහිපයකින් යුක්ත ය. නමුත් අප මෙහි දී අවධානය යොමු කරන්නේ පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර බිහිවුණු යුගය හා ඒ ශිෂ්ටාචාරවල මානව ක්‍රියාකාරිත්වය පිළිබඳ ව තොරතුරු සොයා බැලීමටයි.

ලෝකයේ විවිධ ගංගා නිම්න ආශ්‍රිත ව බිහිවුණු පැරණි ශිෂ්ටාචාර කිහිපයකි.

1. මැදපෙරදිග යුප්‍රටීස් - ටයිග්‍රීස් ගංගා නිම්න කේන්ද්‍ර කරගත් - මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

2. උතුරු අප්‍රිකාවේ නයිල් නිම්නය කේන්ද්‍ර කරගත් මිසර (ඊජිප්තු) ශිෂ්ටාචාරය

3. වයඹ දිග ඉන්දියාවේ ඉන්දු ගංගාව කේන්ද්‍ර කර ගත් - මොහෙන්ජොදාරෝ හරප්පා ශිෂ්ටාචාරය

4. චීනයේ හොවැංහෝ නදිය කේන්ද්‍ර කරගත් - හොවැංහෝ ශිෂ්ටාචාරය


මේ පැරණි ශිෂ්ටාචාරවල දේශපාලන, ආර්ථික, ආගමික, සාමාජීය, සංස්කෘතික තොරතුරු මෙන් ම එයින් අනාගත ලෝකයට ලැබුණු දායාද හා වර්තමානයේ අපට ලබාගත හැකි අත්දැකීම් පිළිබඳ අවබෝධයක් ලැබීම මෙහි අපේක්ෂාව වේ.

## 5.1 ශිෂ්ටාචාරයේ හැඳින්වීම

'ශිෂ්ටාචාරය' යන්න රෝම යුගයේ දී භාවිතයට පැමිණි යෙදුමකි. රෝම වැසියන් තුළ පැවතිය යුතු වූ ගුණාංග පිළිබඳ එයින් කියැවේ. තවද ශිෂ්ටාචාර පහළ වීම මානව සමාජයේත්, මානව සංස්කෘතියේත් දියුණුවේ උසස් හා සංකීර්ණ අවස්ථාවකි. ''මිනිසුන් කොට්ඨාසයක් සංවිධානාත්මක සමාජයක් කරා ගමන් කිරීමේ දී සංස්කෘතියේ හා ජීවන රටාව අතින් අත්පත් කර ගන්නා වූ උසස් අවස්ථාව '' ශිෂ්ටාචාරය ලෙස හැඳින්විය හැකි ය.

### ශිෂ්ටාචාර ගතවීමට පෙර මානව ඉතිහාසය

මිනිසුන් ශිෂ්ටාචාර ගත වීමට පෙර ගෙවුණු අතීතය කවදා කොතැනක දී ආරම්භ වූයේ ද යන්න නිශ්චිතවම කිව නොහැකි ය. එයට හේතුව අදින් වසර මිලියන ගණනාවක කාලයක සිට මනුෂ්‍යයන්ට සමාන සත්ත්වයන් පෘථිවිය මත වාසය කළ බව පිළිගන්නා බැවිනි.




මානව ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් ද ශිෂ්ටාචාර බිහිවීම පිළිබඳ ව අවබෝධයක් ලබාගත හැකි ය. ලෝක මානව ඉතිහාසය ප්‍රධාන යුග 2කට වෙන් කළ හැකි ය.

I. ප්‍රාග් ඓතිහාසික යුගය (පැහැදිලි ඓතිහාසික මූලාශ්‍රය නොමැති යුගය)
II. ඓතිහාසික යුගය (ඓතිහාසික මූලාශ්‍රය සහිත යුගය)

## මිනිසාගේ ආදි නෑදෑ පරපුර - මානවයකු ලෙස හැඩගැසීම


ගෝරිල්ලා


බැබුන්


ජාවා මිනිසා


නියන්ඩර්තාල් මිනිසා

මානව ඉතිහාසයේ වැඩි කාලයක් අයත් වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයට ය. මේ යුගය පිළිබඳ ව යම්තාක් දුරට හෝ අධ්‍යයනය කිරීමට දැනට ලැබී ඇති මූලාශ්‍රය වන්නේ මිනිසුන්ගේ යැයි සැලකෙන අස්ථි කොටස් හා ඔවුන් භාවිත කළා යැයි සැලකෙන උපකරණ, ආභරණ හා වෙනත් මෙවලම් ය.

ප්‍රාග් ඓතිහාසික යුගයේ අවධි කිහිපයකි.

1. දඩයම් යුගය 2. එඬේර යුගය 3. ගොවි යුගය

### දඩයම් යුගය

ශිලා යුගය සඳහා නිශ්චිත කාල නිර්ණයක් ලබාදිය නොහැක. නමුත් දැනට අවුරුදු දෙළොස් දහසකට පමණ පෙර ලෝකයේ ශිලා යුගයේ මිනිසුන් ජීවත් වන්නට ඇතැයි අනුමානය කෙරෙයි. ශිලා යුගයේ පැවති යම් යම් ලක්ෂණ අනුව එය යුග කිහිපයකට වෙන් කර ඇත.

1. පූර්ව ශිලා යුගය (දඩයම් යුගය)
2. මධ්‍යම ශිලා යුගය (එඬේර යුගය)
3. නව ශිලා යුගය (ගොවි යුගය)

මීට වසර පන්ලක්ෂයකට පමණ පෙර සිට වනචාරී ව ජීවත් වූ මිනිසුන් ආහාරපාන පවා සපයා ගත්තේ අනෙකුත් සතුන් මෙන් ස්වභාවික පරිසරයෙනි. වන සතුන් දඩයම් කිරීම, ආහාරයට සුදුසු අල, පළතුරු, ගෙඩි, කොළ ආදිය සොයා ගැනීම මෙන් ම මොවුහු සතුන් දඩයම් කිරීමට හා අල වර්ග හාරා ගැනීමට පාෂාණවලින් නොයෙක් මෙවලම් තනා ගත්හ. මොවුන් ආහාර සොයමින් තැනින් තැනට ගමන් කිරීම නිසා ස්ථිර වාසස්ථාන ඉදි නොවී ය. ඒ නිසා ගල්ගුහා වැනි ආරක්ෂිත ස්ථානවල තාවකාලික ව ජීවත් වන්නට ඇත. මිනිසුන් මෙසේ ජීවත් වූ යුගය 'පූර්ව ශිලා' හෙවත් දඩයම් යුගය ලෙස හඳුන්වනු ලැබේ.

## පූර්ව ශිලා යුගයේ මිනිසා භාවිත කළ මෙවලම් හා ඔවුන්ගේ නිර්මාණයන්



ආදි මිනිසා භාවිත කළ මෙවලම්




ප්‍රාග් ඓතිහාසික ලෙන් සිතුවම්



ආදි මනුෂ්‍යයන්ගේ විසිතුරු නිර්මාණ

## ආහාර පිළියෙල කර ගැනීම

### එඬේර යුගය



ආහාර රැස්කරන්නෙක්

දඩයමින් සතුන් මරා ආහාර ලබා ගැනීම වෙනුවට ආහාරයට සුදුසු සතුන් ඇති කොට එමගින් ආහාර ලබා ගැනීම පහසු බව ආදිතමයෝ තේරුම් ගත්හ. එනිසා ගවයන්, එළුවන්, බැටළුවන් වැනි සතුන් හීලෑකොට තම පාලනය යටතේ තබාගෙන ඔවුහු වාසස්ථාන ගතවූහ. තවද ආහාරයට සුදුසු ධාන්‍ය වර්ග (කිරිඟු, බාර්ලි) මෙන් ම පළතුරු, අල වර්ග එකතු කිරීමත් පසු කාලයේ ඒවා තමන් ජීවත් වූ වාසස්ථාන අසල ම වගා කිරීමට පෙළඹීමත් නිසා ඔවුහු ගෘහාශ්‍රිත ජීවන රටාවකට ක්‍රමික ව පුරුදු වූහ.

එම නිසා එඬේර යුගයේ දී ස්ථිර වාසස්ථාන ඉදි නොවී ය. ඔවුහු සංචාරක දිවි පෙවෙතක් ගෙවූහ. වැස්සෙන්, අව්වෙන් ආරක්ෂා වීම හා

වාසස්ථාන පිළියෙල කර ගැනීමට ගස්වල කොළ, අතු, පට්ටා, සතුන්ගේ හම් වැනි දේ යොදා ගත්හ. මේ යුගයේ භාවිත කළ මෙවලම් වඩාත් ඔපමට්ටම් කොට සකසා ඇත. ඒ අනුව ක්‍රි.පූ. 10,000 ට පමණ පෙර මිනිසුන් ජීවත් වූ යුගය 'එඬේර යුගය' ලෙස හඳුන්වනු ලැබේ.




පුරාතන ගමක්

## ගොවි යුගය

සංචාරක එඬේර ජීවිතයක් ගත කරනවාට වඩා ස්ථිර වාසස්ථාන ගොඩනගා ගෙන ආහාරයට සුදුසු ධාන්‍ය, පළතුරු හා අල වර්ග වගා කිරීමත්, සතුන් ඇති කිරීමත්, ගොවි යුගයේ ප්‍රාරම්භක අවධිය ලෙස හැඳින්විය හැකි ය.

ආදිතමයෝ ගොවිතැන් කිරීම සඳහා සුදුසු භූමි ලෙස ගංගා නිම්න ප්‍රදේශ තෝරා ගත්හ. එහිදී සැලකිළිමත් වූ කරුණු කිහිපයකි.



යුගයේ ගොවිබිම් සැකසීම හා අස්වනු නෙළීම


1. ජලය පහසුවෙන් ලබා ගැනීමට හැකි වීම නිසා වියළි කාලවල දී වුව ද වගා කිරීමට හැකි වීම.
2. ගංගා නිතර පිටාර ගැලීම නිසා ගංගා නිම්න දෙපස සරුසාරවත් භූමියක් පැවතීම.
3. ගංගා නිම්න ආශ්‍රිත ව සත්ත්ව පාලනය පහසු වීම, දෛනික ජල අවශ්‍යතා හා මසුන් ඇල්ලීමට හැකි වීම.
4. හිතකර දේශගුණික තත්ත්වයක් පැවතීම.

පසුව ගංගා නිම්නවල පදිංචි වූ ඔවුහු තමන් මුල දී හඳුනාගත් ධාන්‍ය ආදිය වගා කළහ. එයින් සරුසාර අස්වැන්නක් ලැබුණි. ධාන්‍ය වර්ගවලින් ප්‍රධාන ආහාරය සකස් කරගත් ඔවුහු ගෘහාශ්‍රිත ව සෑදුණු පළතුරු, එළවළු වැනි දෑ ආහාරයට ගත් හ. ආහාර කල්තබා ගැනීමට ද විවිධ ක්‍රමෝපායයන් යොදා ගත්හ. වියළි දේශගුණයක් පවතින කාලවල දී පරිභෝජනයට අවශ්‍ය ආහාරපාන කෙරෙහි ද සැලකිලිමත් වූහ. එනිසා අතිරික්ත නිෂ්පාදන ගබඩා කොට තබා ගැනීමට පුරුදු පුහුණු වූහ.

මේ සුරක්ෂිතභාවය නිසා මිනිසුන්ට පෙරට වඩා විවේකය ලැබුණි. එම විවේකී කාලයේ තම කාර්යයන් පහසු කරගත හැකි දෑ සොයා ගැනීමට හා නිපදවා ගැනීමට ඔවුහු උත්සුක වූහ. ඒ අනුව සී සෑමට නඟුල, ධාන්‍ය කැපීමට දෑකැත්ත, ධාන්‍ය ගෙන යාමට රෝදය සහිත කරත්තය, ධාන්‍ය ඇඹරීමට ඇඹරුම් ගල, ධාන්‍ය ගබඩා කිරීමට ධාන්‍ය බිස්ස, වාසය කිරීම සඳහා ඉඩකඩ ඇති කටුමැටි බිත්ති හා වහලක් සහිත නිවාස, ආහාර පිස ගැනීමට මැටි භාණ්ඩ හා සරල උපකරණ ආදිය ගොවි යුගයේ මිනිසුන් නිර්මාණය කර ගත්තා ලදී.

මෙම ගංගා නිම්න ශිෂ්ටාචාර මිනිස් වර්ගයාගේ නූතන ශිෂ්ටාචාරයේ මුල්ම අඩිතාලම වශයෙන් සැළකිය හැකි ය. මේ ශිෂ්ටාචාර අදට වසර පන්දහසකට පමණ පෙර ආරම්භ වන්නට ඇති බව පුරාවිද්‍යාත්මක ගවේෂණවලින් තහවුරු කරගෙන ඇත. එම ශිෂ්ටාචාරවල මානව කටයුතු පසු කාලයේ දී විවිධ වෙනස්කම්වලට භාජනය වී ශිෂ්ටාචාර අතර හුවමාරු වෙමින් නවීකරණය වී වර්තමානය කරා එළඹුණු බව පිළිගනු ලැබේ. 19 වන සියවසේ දෙවන දශකයේ සිට පුරාවිද්‍යාඥයන්ගේ දැඩි උත්සාහය මත සිදු කළ ගවේෂණාත්මක අධ්‍යයන නිසා මේ ශිෂ්ටාචාරවල ආරම්භය, දේශපාලන, ආගමික, ආර්ථික හා සංස්කෘතික තොරතුරු හඳුනාගෙන ඇත.එම තොරතුරු අධ්‍යයනය කිරීමෙන් ලෝකයේ මානව ශිෂ්ටාචාරය ගොඩනැගීමේ දී පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරවලින් සිදු වූ සේවාව හඳුනාගත හැකි ය.

## ලෝකයේ ගංගා නිම්න ශිෂ්ටාචාර ලකුණු කිරීම




### මානව ශිෂ්ටාචාරවල පොදු ලක්ෂණ

- සාමූහිකව ජීවත්වීම හා ජනගහණය වර්ධනය
- ගොවිතැන් ආහාර ලබා ගැනීම හා ඒ සඳහා උපකරණ සකස ගැනීම.
- පාලන සංවිධානයක් තිබීම හා එහි නිලබල ක්‍රමයක් හා සමා සංවිධානයක් තිබීම.
- සම්මත නීතිරීති පද්ධතියක් තිබීම.
- අදහස් ප්‍රකාශ කිරීම භාෂාවක් හා ලේඛන ක්‍රමයක් භාවිත කිරීම.
- ආගමික විශ්වාස පිළිගැනීම හා ඒ අනුව කටයුතු කිරීම.
- බාහිර කණ්ඩායම් සමග සම්බන්ධතා ගොඩනැගීම.
- ඉදිකිරීම්, ගෘහ නිර්මාණ, නගර නිර්මාණ සැලසුම් සහගතව සිදු කිරීම. (වී.ගෝර්ඩන් චයිල්ඩ් 1892 - 1957)

## 5.1.1 මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

ගංගා නිම්න ආශ්‍රිත ව ශිෂ්ටාචාර බිහිවුණු කාලයේ දී මුලින් ම ස්ථිර ජනාවාස පිහිටුවාගෙන ස්ථාවර ජන ජීවිතයක් ගොඩනඟාගත් ප්‍රදේශයකි, යුප්‍රටීස්ටයිග්‍රීස් ගංගා නිම්නය. පුරාවිද්‍යා හා ඉතිහාසය පිළිබඳ ව විද්වතුන්ගේ මත අනුව ලෝකයේ පළමු මානව ශිෂ්ටාචාරය මේ ආශ්‍රිත ව ගොඩනැගුණු මෙසපොතේමියානු ශිෂ්ටාචාරය විය.

ග්‍රීක භාෂාවට අනුව 'මෙසපොතේමියානු' යනු ගංගා දෙක මැද පිහිටි රට හෙවත් රාජ්‍යයයි. එනිසා එය 'දෙගම්මැදි රාජ්‍ය' ලෙස ද 'ශිෂ්ටාචාරයේ තොටිල්ල' සහ 'සශ්‍රීක භාවයේ චන්ද්‍රවංකය' ලෙස ද එය හඳුන්වනු ලැබේ.

සාග්‍රෝස් කඳුවැටිවල නිරිත දිගින් වූ ඇනටෝලියානු සානුවෙන් පටන් ගන්නා යුප්‍රටීස් ටයිග්‍රීස් නදිය කිලෝමීටර් 1600 ක් දුර ගලාගෙන විත් පර්සියන් බොක්කෙන් මුහුදට එකතු වේ. මෙය වැඩිදුරක් ගලාගෙන යන්නේ වර්තමාන ඉරාකයේ කාන්තාර ඔස්සේ ය. එය වරින්වර පිටාර ගැලීම නිසා ගංගාව දෙපස සරු සාරවත් වේ. එනිසා ක්‍රි.පූ. 5000 දී පමණ යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගා නිම්නයේ පහළ හා මධ්‍ය ප්‍රදේශවල සුමර් හා බැබිලන් ප්‍රදේශවල මිනිසුන් පදිංචි වන්නට ඇත.

පසු කාලයේ මේ ප්‍රදේශ කේන්ද්‍ර කරගෙන ගොඩ නැගුණු නාගරික ජීවන රටාවත් සමග ශිෂ්ට සම්පන්න යුගයකට මිනිසුන් හැඩගැසුණි.

- දකුණු මෙසපොතේමියානු ප්‍රදේශයේ වූ 'සුමර්' මුල් කරගෙන ක්‍රි.පූ. 4000 දී පමණ මුලින් ම ශිෂ්ටාචාරයක් ගොඩ නැගුණි. එය 'සුමේරියානු ශිෂ්ටාචාරය' ලෙස හැඳින්වුණි.
- තරමක් උතුරින් වූ 'බැබිලන්' ප්‍රදේශය මුල් කරගෙන ක්‍රි.පූ. 2000 දී පමණ ගොඩ නැගුණු නාගරික යුගය 'බැබිලෝනියානු ශිෂ්ටාචාරය' ලෙස හැඳින් වේ.

නමුත් මෙම ගංගා නිම්න ශිෂ්ටාචාරයට ඒ ආශ්‍රිත ප්‍රදේශවල මෙන් ම ඊසානදිග සිරියාව, ගිණිකොණදිග තුර්කිය හා වර්තමාන ඉරාකයට අයත් සියලු ප්‍රදේශ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයට අයත් වේ. මේ අනුව පැහැදිලි වන්නේ භූගෝලීය සාධක අනුව, උතුරු මෙසපොතේමියාව දකුණු මෙසපොතේමියාව වශයෙන් මෙහි අවධි දෙකක් පැවති බවය.